# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

# වාර්ෂික වාර්තාව

# 2015

පටුන


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | හැඳින්වීම | | 02 |
| 2. | දැක්ම සහ මෙහෙවර | | 04 |
| 3. | මණ්ඩලයේ බලතල | | 04 |
| 4. | මණ්ඩලයේ තොරතුරු සැකැස්ම | | 05 |
| 5. | සංවිධානාත්මක ව්‍යුහය | | 09 |
| 6. | මත්ද්‍රව්‍ය දූර්භාවිතයේ වර්තමාන ස්වභාවය | | 10 |
| 7. | සංස්ථා පාලනය | | 14 |
| 8. | ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය | | 15 |
| 9. | ආදායම් ප්‍රකාශය | | 75 |
| 10. | ශේෂ පත්‍රය | | 76 |
| 11. | ගිණුම්කරණ ප්‍රතිපත්ති | | 77 |
| 12. | විගණකාධිපති වාර්තාව | | 78 |
| 13. | විගණකාධිපති වාර්තාව පිළිබඳ නිරීක්ෂණ | | 88 |
| ඇමුණුම | i. | මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 93 |
| | ii. | නීතිය ක්‍රියාත්මක කිරීමේ අනු කමිටු සාමාජිකයෝ | 97 |
| | iii. | නීති සම්පාදක අනු කමිටු සාමාජිකයෝ | 100 |
| | iv. | ගිණුම්කරණ සටහන් | 103 |

## 1.හැඳින්වීම



අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරණ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර 1984 අප්‍රේල් මස නව වැනි දින සිට ක්‍රියාත්මක විය. මෙම මණ්ඩලය නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතී.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම, අනිසි මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම හා පාලනය කිරීමට විවිධ ආයතන හා දෙපාර්තමේන්තුවලට සහාය දක්වමින් මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාමාර්ගවල නිරත වීම, ප්‍රතිකාර ක්‍රම හා පුනරුත්ථාපන කටයුතු ප්‍රවර්ධනය කිරීම, ක්ෂේත්‍ර පර්යේෂණ, අධ්‍යයනයන් පැවැත්වීම හා දත්ත සංචිතයන් පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ. තවද, රජය විසින් අනුමත කරන ලද එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සාක් සංවිධානය යටතේ පවතින ගිවිසුම් වල වගකීම ඉටු කිරීමට අදාල ආයතන අධීක්ෂණය හා ඒවාට සහාය දැක්වීමද මෙම මණ්ඩලය මගින් සිදු වේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් එකී කර්තව්‍යයන් ඉටු කර ගැනීම සඳහා තාක්ෂණික සහ වෙනත් ආධාර සැපයීම, රජය හා අන්තර්ජාතික මාදක ඖෂධ පාලක මණ්ඩලය සමඟ සහයෝගීව කටයුතු කිරීම සහ මාදක ඖෂධ පිළිබඳ කොමිෂන් සභාවේ නියෝජිතත්වය දැරීම සිදු කරනු ලැබේ.

රජයේ නියමයන්ට අනුව මණ්ඩලය මගින් එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්ෂික වාර්තාවක් පිළියෙල කළ යුතු වේ.

## 2. දැක්ම හා මෙහෙවර

### දැක්ම

මත්ද්‍රව්‍ය ආශ්‍රිත අනිසි බලපෑම් කළමණාකරණය කිරීමෙහි දකුණු ආසියාවේ පුරෝගාමීයා බවට ශ්‍රී ලංකාව රැගෙන යාම.

වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර රටක් බවට පත් කිරීම.

### මෙහෙවර

මත්ද්‍රව්‍ය උවදුර සහ ආශ්‍රිත සියළු ගැටළු ඉවත් කිරීම සඳහා සියළුම සමාජ තලයන් සහ පොදු ජනතාව, අදාල ආයතන සමඟ ක්‍රියාශීලීව වැඩකරන පරිසරයක් ගොඩනැගීම.

මත්ද්‍රව්‍ය භාවිතය හා වෙළදාම අධෛර්යමත් කරන සමාජ වාතාවරණයක් බිහිකිරීම.

මතින් තොර සමාජයක් බිහිකිරීම සඳහා ජාතික දේශපාලන සහ අන්තර්ජාතික සහයෝගය ගොඩ නැගීම.

ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා නායකත්වය දීම අවශ්‍ය අවස්ථාවට ජාතික ප්‍රතිපත්තිය විමර්ශනය කිරීමටත් ඇගයීමටත් එය කාර්යක්ෂමව ක්‍රියා කරවීමටත් අවශ්‍ය තොරතුරු සහ දත්ත සංචිතයක් ගොඩනැගීම.

ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලක මණ්ඩලය සමඟ සහයෝගීව කටයුතු කිරීම

## 3. මණ්ඩලයේ බලතල

1984 අංක 11 දරණ පනතේ 7 වන වගන්ති ප්‍රකාරව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ

අ. අන්තරායකර ඖෂධ දූර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වු ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැංවීම හා සමාලෝචනය කිරීම සහ එකී ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

ආ. මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම පිණිස සාධාරණව අවශය විය හැකි තොරතුරු සහ විස්තර පුද්ගලයන්ගෙන් සංවිධාන වලින් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලින් සහ රාජ්‍ය සංස්ථාවලින් ඉල්ලා සිටීම

ඇ. මණ්ඩලයේ බලතල ක්‍රියාවට නැංවීම සඳහා දේශිය හා විදේශිය මූලාශ්‍ර වලින් ආධාර හා ප්‍රතිපාදන ලබා ගැනීම.

ඈ. අන්තරායකර ඖෂධ දූර්භාවිතය වැලැක්වීමේ හා පාලනය කිරීමෙහි නිරත වී සිටින ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඉ. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වු පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා දරුවන් හා වැඩිහිටියන් සඳහා අන්තරායකර ඖෂධ අයුතු ලෙස භාවිතය වැළැක්වීමේ ජාතික අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.

ඊ. අන්තරායකර ඖෂධ දූර්භාවිතයේ ව්‍යාප්තිය, හේතු සාධක හා ඒ හා බැඳුණු නෛතික, වෛද්‍ය , විද්‍යාත්මක, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික කරුණු පිළිබඳ වු පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හා අධීක්ෂණය කිරීම.

උ. මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත වී සිටින ජාතික, ප්‍රාදේශිය හා අන්තර් ජාතික ආයතන සමග සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම.

ඌ. චංචල හෝ නිශ්චල දේපල කිසිවක් අත්කර ගැනීම, බද්දට හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, කිරීම සහ විකිණිම හෝ අභ්‍යන්තරයකින් බැහැර කිරීම

## 4. මණ්ඩලයේ තොරතුරු සැකැස්ම

සංවිධානයේ නම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

නෛතික ව්‍යුහය

1986 අංක 41 හා 1990 අංක 21 දරණ පනත්වලින් සංශෝධිත 1984 අංක 11 දරණ පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

**මණ්ඩලයේ සංයුතිය**

වර්තමානයේ මෙම මණ්ඩලය,

(අ.) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකුගෙන්ද වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද

(ආ.) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද

(ඇ.) පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද

(ඈ.) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද

(ඉ.) රේගු අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද

(ඊ.) රජයේ රස පරීක්ෂක හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද

(උ.) ආයුර්වේද කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන නාමිකයකුගෙන් ද

(ඌ.) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිතයෙකුගෙන්ද සමන්විත වේ.

## මාණ්ඩලීය සාමාජිකයින් 2015

1. වෛද්‍ය නිලංග සමරසිංහ මහතා
   සභාපති
   අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

2. පූජ්‍ය කුප්පියාවත්තේ බෝධානන්ද හිමි
   අධ්‍යක්ෂ
   මිතුරු මිතුරෝ සෙවණ
   පැල්මඩුල්ල

3. ඇලෙක්ෂියස් බෙනඩික් මහතා
   87/1, ගලහිටියාව පාර
   සියඹලාපේ

4. නීතීඥ ශාක්‍ය නානායක්කාර මහතා
   ප්‍රධාන ලේකම්
   හෙල්දි ලංකා ආයතනය
   58/19, පාසල් වීදිය
   නාවල

5. ආර්. එම්. එල්. ඩබ්. රත්නායක මහතා
   නීතිය, ආපදා කළමණාකරන හා ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍යංශය
   13 වන මහල, 2 වන පියවර
   සෙත්සිරිපාය
   බත්තරමුල්ල

6. සකුන්තලා තෙන්නකෝන් මහත්මිය
   රජයේ රස පරීක්ෂක
   රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
   නො.31, ඉසුරු මාවත
   පැලවත්ත
   බත්තරමුල්ල

7. නන්දන මුණසිංහ මහතා
   ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (අපරාධ)
   පොලිස් මූලස්ථානය
   කොළඹ 10

8. ලක්ෂ්මි සෝමතුංග මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (රසායනාගාර සේවා)
සෞඛ්‍ය අමාත්‍යංශය
කොළඹ 01

9. පී. එස්. කේ. ආර්. වීරකෝන් මහතා
ආයුර්වේද කොමසාරිස්තුමා
ආයුර්වේද දෙපාර්තමේන්තුව
පරණ කොට්ටාව පාර
නාවින්න
මහරගම

10. එච්. යූ. ප්‍රේමතිලක මහතා
අතිරේක ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය
"ඉසුරුපාය"
බත්තරමුල්ල

11. එම්. පාස්කරන් මහතා
අධ්‍යක්ෂ සමාජ ආරක්ෂණ
ශ්‍රී ලංකා රේගුව
නො. 40
කොළඹ 01

12. ඒ. කේ. ඒ. වයි. තරංග මහතා
සහකාර අධ්‍යක්ෂ
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

## කාර්ය මණ්ඩලය

මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව කාර්ය මණ්ඩල සාමාජිකයන් 238 කින් සමන්විත වේ.

## ලිපිනය / තොරතුරු ලබා ගැනීම සඳහා

383, කෝට්ටේ පාර, රාජගිරිය.
දුරකථන අංකය  28687946 ෆැක්ස්  28687912, 2869805
විද්‍යුත් තැපැල  mail@nddcb.gov.lk
වෙබ් අඩවිය  www.nddcb.gov.lk
මුහුණු පොත  facebooknddcb.gov.lk

## විගණනය

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,

## නිල බැංකුව

ලංකා බැංකුව

# 5. සංවිධානාත්මක ව්‍යුහය



## 6. ශ්‍රී ලංකාව තුළ වර්තමාන මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ ස්වභාවය

2015 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 82,482කි. එය 2014 වර්ෂය හා සසඳන කල 23%ක වැඩිවීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාව හෙරොයින් වැරදි සඳහා 32%ක් ද, ගංජා ආශ්‍රිත වැරදි සඳහා 63%ක් ද වේ. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරයක් බස්නාහිර පළාතින් ද (60%) දකුණු පළාතින් 10%ක් ද මධ්‍යම පළාතින් 8%ක් ද වාර්තා විය. අත්අඩංගුවට පත් මුළු සංඛ්‍යාවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ 43%ක් ද ගම්පහ දිස්ත්‍රික්කයේ 14%ක් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ 4%ක් ද වේ. 2015 වර්ෂයේ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙහි ප්‍රවණතාවය ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට පුද්ගලයන් 397 දෙනෙකි.

### ගංජා

ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල නොවන ආකාරයට ගංජා වගාකරනු ලබයි. ගංජා වැඩි වශයෙන් වගා කරනු ලබන්නේ වියළි කලාපයේ වන අතර නැගෙනහිර, ඌව පළාත් හා දකුණු පළාත් සීමාවේද වගා කෙරේ. ගංජා වගාකර ඇතැයි සැළකෙන ඇස්තමේන්තු ගත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 500ක් පමණ වේ. අනෙකුත් වගාවන් හා සසඳා බලන කල අඩු ශ්‍රමයකින් හා අඩු වියදමකින් වගා කළ හැකි ගංජා ස්වභාවික ව්‍යවසනයන්ට ගොදුරුවන්නේ අවම වශයෙනි. ගංජා වගා කිරීම සඳහා නවතම තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරනු ලබයි. වර්තමානයේ මත්ද්‍රව්‍ය භාවිත කරන තරුණයන් අතර ගංජා මල් ජනප්‍රිය වී ඇත. ගංජා නීත්‍යානුකූල නොවන අන්තරායකර ඖෂධයකි.

2015 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් වලින් වැඩි ප්‍රමාණයක් (52,076) ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට ගෙන තිබුණි මුළු අත්අඩංගුවට ගත් ප්‍රමාණයෙන් ගංජා වැටලීම් වැඩි වශයෙන් වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි (36%). ගම්පහ දිස්ත්‍රික්කයේ 11%ක් සහ මාතර දිස්ත්‍රික්කයෙන් 6%ක් ගංජා වැටලීම් වාර්තා වේ. ගංජා සම්බන්ධ වැටලීම් බහුතරයක් ශ්‍රී ලංකා පොලිසිය විසින් සිදුකර ඇති අතර සුරාබදු දෙපාර්තමේන්තුව සහ විශේෂ කාර්ය බලකාය මඟින් ද වැටලීම් වැඩි වශයෙන් සිදුකර ඇත. ගංජා ග්‍රාමීය පළාත්වල සිට කොළඹ හා අනෙකුත් ප්‍රාදේශීය නගර සඳහා බෙදා හැරීම තුළින් ජාවාරම්කරුවන් වඩා වැඩි ලාභයක් උපයා ගනු ලබයි. වැටලීම්වලින් මඟහැරීම සඳහා ගංජා ප්‍රවාහනයට පොදු ප්‍රවාහන සේවා මෙන්ම ත්‍රිවීලර් රථ, පුද්ගලික වාහන භාවිත කරනු ලබයි. මෑත කාලයේදී මත්ද්‍රව්‍ය භාවිත කර අත්අඩංගුවට පත්වූවන් අතුරින් ගංජා සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වැඩිවී ඇති බව පැහැදිළිව පෙනේ. 2015 වර්ෂයේ දිවයින පුරා ගංජා වැටලූ ප්‍රමාණය කිලෝග්‍රෑම් 6570ක් වේ. බස්නාහිර පළාතින් ගංජා වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම් 50%ක් වන අතර දකුණු පළාතින් 12%ක් ද, මධ්‍යම පළාතින් 8%ක් ද, වයඹ පළාතින් 7%ක් ද වේ. 2015 වර්ෂයේ ගංජා වැරදි සඳහා අත්අඩංගුවට පත්වීමේ ප්‍රවණතාවය ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 251 දෙනෙකි. වර්තමානයේ ගංජා භාවිතය ශ්‍රී ලංකා සමාජය තුළ ව්‍යසනකාරී ගැටළුවක් බවට පත්ව තිබේ. මෙම ප්‍රවණතාවයත් සමඟ රටතුළ ගංජා භාවිත කරන්නන්ගේ වර්ධනයක් දැකිය හැකිය.

ගංජාවල අඩංගු විෂ ඉවත් කොට ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා යොදා ගැනේ. ආයුර්වේද වෛද්‍යවරුන් හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සමාගම් මෙහි ප්‍රධාන නීත්‍යානුකූල පරිභෝජකයෝ වෙති. 2015 වර්ෂයේ ආයුර්වේද ඖෂධ සඳහා ගංජා කිලෝ ග්‍රෑම් 220,425ක් භාවිත කොට තිබේ. 2015 වර්ෂයේ ආයුර්වේද ඖෂධ සංස්ථාව පමණක් මදන මෝදකය හා කාමේෂ්වරී මෝදකය නිෂ්පාදනය කිරීමට ගංජා කිලෝග්‍රෑම් 129,350ක් පරිභෝජනය කර ඇත.

### හෙරොයින්

1980ට පෙර හෙරොයින් භාවිතය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත නොවූ අතර විදේශ ගතවන ලාංකිකයන් හා සමහර විදේශීය සංචාරකයින් සුළු සංඛ්‍යාවක් භාවිත කරන්නට යෙදුනි. 80 දශකයෙන් පසුව හෙරොයින් ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශයන්හි ව්‍යාප්ත වන්නට විය. ඉන්පසුව ව්‍යසනකාරී තත්ත්වයක් උද්ගත වූ අතර හෙරොයින් භාවිත කරන්නන් අත්අඩංගුවට ගන්නා ලදී. මූලිකවම එය භාවිත කරනු ලැබුවේ කොළඹ නගරයේ සහ පළාත් කිහිපයක නගරබදව වුවත් එය වඩාත්ම බරපතල වූයේ අනෙකුත් නාගරික හා ගම්බද ප්‍රදේශවල ව්‍යාප්ත වීමත් සමඟය. එය ප්‍රධාන වශයෙන්ම රටෙහි සෞඛ්‍ය හා සමාජ ගැටළුවක් බවට ද පත්ව ඇත.

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගෙන් අත්අඩංගුවට පත් බහුතරයක් තම භාවිතයට ඉතා සුළු වශයෙන් මත්ද්‍රව්‍ය ළඟ තබාගත් පුද්ගලයන්ය. ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තු ගත හෙරොයින් භාවිතා කරන්නන් 45000ක් උදෙසා වාර්ෂිකව වීථි මට්ටමේ හෙරොයින් කිලෝග්‍රෑම් 985 ක් අවශ්‍යය බව ඇස්තමේන්තුගත කර ඇත. එය දිනකට කිලෝග්‍රෑම් 2.7 ක්

වේ. දිවයිනට හෙරොයින් ප්‍රධාන වශයෙන් ප්‍රවාහනය කරනු ලබන්නේ මාළු බෝට්ටු මඟින් හෝ විදේශිකයන් රැගෙන ඒමෙනි. වැඩි වශයෙන් හෙරොයින් ලංකාවට ගෙන එනු ලබන්නේ ඉන්දියාවෙන් හෝ පකිස්ථානයෙනි. ප්‍රධාන වශයෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා දකුණු ඉන්දියාව හරහා බටහිර වෙරළ තීරයට මාළු බෝට්ටු ආධාරයෙන් සහ වෙනත් ක්‍රම මඟින් හෙරොයින් ප්‍රවාහනය කෙරේ. 2015 වර්ෂයේ කිලෝග්රෑම් 47ක් නීතියේ රැහැනට හසුවූ අතර පුද්ගලයන් 26,539ක් අත්අඩංගුවට පත්විය. හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 2014 වර්ෂය හා සසඳන කල 2015 වර්ෂයේදී 14%කින් වැඩිවී ඇත. 2015 වර්ෂයේ හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්වල ප්‍රවණතාවය ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 128 දෙනෙකි.

## අබිං

ශ්‍රී ලංකාවේ අබිං දුර්භාවිතයක් මේ වන විට දක්නට නොමැති අතර ප්‍රධාන වශයෙන් අබිං භාවිත වන්නේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ආයුර්වේද වෛද්‍යවරුන්ට රජයේ රෝහල් හරහා අවශ්‍ය අබිං ප්‍රමාණයන් ලබා දෙනු ලබයි. 2015 වර්ෂයේ අබිං සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් හතරදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

## මිල සහ ශුද්ධතාවය (ඩයි ඇසිටයිල් මෝර්ෆීන් ප්‍රතිශතය)

2015 වර්ෂයේ හෙරොයින්වල වීථි මිලෙහි සාමාන්‍ය අගය රුපියල් මිලියන 6.5 (ඇමරිකානු ඩොලර් 41,379) කි. 2014 වර්ෂය හා සසඳන කල වීථි මිල 32%කින් පහළ ගොස් ඇත. එනම් 2014 වර්ෂය හා සසඳ බලන කල හෙරොයින් වල වීථි මිල මිලියන රුපියල් 9.5 සිට මිලියන 6.5 දක්වා අඩු වී ඇත. ගංජා කිලෝග්රෑම් 1ක වීථි මිලෙහි සාමාන්‍ය අගය රුපියල් 20,000ක් (ඇමරිකානු ඩොලර් 138) ක් වේ. 2014 වර්ෂය හා සංසන්දනය කර බලන විට 2015 වර්ෂයේදී ගංජා මිල දේශීය ගැණුම්කරුවන් සඳහා වෙනසක් සිදු වී නොමැත. 2015 වර්ෂයේදී අබිං කිලෝග්රෑම් එකක මිල රුපියල් මිලියන 1.5ක් වේ. (ඇමරිකානු ඩොලර් 10,345).

## හෙරොයින්වල ශුද්ධතා අගයෙහි සාමාන්‍ය අගය ප්‍රතිශතයක් ලෙස

2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වීථි හෙරොයින්වල ඩයි ඇසිටයිල් මෝර්ෆීන් ප්‍රමාණයෙහි සාමාන්‍ය අගය 15.55%ක් විය. 2014 වර්ෂය හා සසඳන කල එය 39%කින් පහළ ගොස් ඇත. හෙරොයින් වලට මිශ්‍රකාරක වශයෙන් සාමාන්‍යයෙන් ඩයිසිෆෑම්, ඇසිටමිනෝෆීන් සහ කැෆේන් භාවිත කරනු ලබයි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ජාතික මාදක රසායනාගාරය වීථි මට්ටමේ විකිණීමට ඇති මත්ද්‍රව්‍ය සාම්පල පරීක්ෂා කරන අතර එම සාම්පලවල විශ්ලේෂණය සිදුකරනු ලබයි. පසුගිය අවුරුදු 5 තුළ හෙරොයින් සාම්පලයන්හි ශුද්ධතා අගයෙහි සාමාන්‍ය අගය ක්‍රම ක්‍රමයෙන් අඩුවී ඇත. 2014 වර්ෂයේදී හෙරොයින්වල ශුද්ධතා අගයෙහි සාමාන්‍යය 30% ක් වූ අතර 2015 වර්ෂයේ එය 15.5%කි.

## මත්ද්‍රව්‍ය භාවිත කරන ක්‍රම

ශ්‍රී ලංකාවේ හෙරොයින් භාවිත කරන්නන් අතර දුම ඉරීම හෙවත් චයිනීස් ක්‍රමය (Chases the dragon) මත්ද්‍රව්‍ය ශරීරගත කරගන්නා ප්‍රධානම ක්‍රමය වේ. ගංජා සහ හෂීස් බොහෝ සෙයින් දුම් ඉරීමෙන් ශරීරගත කර ගනිති. අබිං භාවිත කරන්නේ කෑමක් ලෙසය. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර දුම්කොළ භාවිතය ද සුළු වශයෙන් මද්‍යසාර භාවිතය ද දක්නට ඇත.

## මනෝවර්ථක ද්‍රව්‍ය

මනෝවර්ථක ගණයේ ඖෂධ දුර්භාවිත කිරීම ශ්‍රී ලංකාව තුළ සැළකිය යුතු ගැටළුවක් බවට පත්ව තිබේ. වෛද්‍යමය හේතූන් මත හෝ හෙරොයින් වෙළඳපොළේ නොමැති විට විරමණ ලක්ෂණ මඟහරවා ගැනීම සඳහා මෙම මනෝවර්ථක ද්‍රව්‍ය භාවිත කරයි. කෙසේ වෙතත් මෙම මනෝවර්ථක ද්‍රව්‍ය වෛද්‍ය නිර්දේශයක් නොමැතිව නිකුත් කිරීම තහනම් වුවත් නීත්‍යානුකුල නොවන ආකාරයෙන් මේවා වෙළඳ පොළෙහි ලබා ගැනීමේ පහසුව ඇත. 2015 වසර තුළ මනෝ වර්ථක ද්‍රව්‍ය දුර්භාවිත කිරීමේ යම් යම් සිද්ධි වාර්තා වූ අතර මේ හේතුව නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය හා අදාළ ආයතන එක්ව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ඒවා පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා විවිධ පියවරයන් ගනිමින් සිටී.

## පූර්ව රසායන

රසායනික ක්‍රියාවලියක් මගින් කෘත්‍රිම ලෙස මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇති රසායනික ද්‍රව්‍ය පූර්ව රසායන නම් වේ. පූර්ව රසායන සාමාන්‍යයෙන් භාවිත වන්නේ කර්මාන්තශාලා වල භාණ්ඩ නිෂ්පාදනය සඳහා සහ රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා වැනි නීත්‍යානුකූල අරමුණු සඳහාය. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මෙම පූර්ව රසායන වෙනස් කොට නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මත්ද්‍රව්‍ය වෙළඳපොළට නිකුත් කරනු ලබයි.

ශ්‍රී ලංකාව පූර්ව රසායන නිෂ්පාදනය නොකරයි. ඖෂධ සහ කර්මාන්තශාලා නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මේවා ආනයනය කෙරේ. බොහෝ පූර්ව රසායන වර්ග ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේ ඖෂධ සහ කර්මාන්තශාලා වල නිෂ්පාදන සඳහාය. පසුගිය අවුරුදු කිහිපය තුළ ලංකාවට ආනයනය කරන ලද ප්‍රධාන පූර්ව රසායන කිහිපයකි. ඒවා නම් ඇසිටික් ඇන්හයිඩ්‍රයිඩ්, ඇසිටෝන්, ඇන්ත්‍රනලික් ඇසිඩ්, මෙතිල් එතිල් කීටොන්, ප්සුඩොඑෆඩ්‍රින්, සල්ෆියුරික් ඇසිඩ් සහ ටොලුයින් වේ. මෙම පූර්ව රසායන මගින් කෘත්‍රිම ලෙස හෙරොයින් සහ කොකේන් නිපදවීමේ හැකියාව ඇත. ඉතා ප්‍රබල ලෙස ඇබ්බැහිකාරී ගුණයෙන් යුත් කෘත්‍රිමව නිෂ්පාදනය කළ හැකි මත්ද්‍රව්‍ය නම් මෙතකලෝන්, එල් එස් ඩී, එම් ඩී ඒ /එම් ඩී එම් ඒ, ඇම්ෆිටමයින්, මෙතම්ෆිටමයින් හා පෙනිසයික්ලිඩීන් පෙති වේ.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුළ කිසිඳු පූර්ව රසායන ද්‍රව්‍යයක් නිෂ්පාදනය නොකරන අතර මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට නියමිත යැයි සැකකරන රහසිගත රසායනාගාරයක් අවිස්සාවේල්ල කොස්ගම ප්‍රදේශයේදී 2008 වර්ෂයේ අත්අඩංගුවට ගනු ලැබිණි.

මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය නීති විරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත, 2008 අංක 1 දරන පනතින් බලාත්මක වූ අතර එමගින් පූර්ව රසායන 23ක් සඳහා නීති විරෝධී භාවිතය හා ප්‍රවාහනය තහනම් කරන ලදී. එක්සත් ජාතීන්ගේ මාදක හා මනෝවර්ථක ද්‍රව්‍ය නීති විරෝධීව ජාවාරම් කිරීමට එරෙහි 1988 සම්මුති පනත මගින් මෙම පනත ක්‍රියාත්මක කරන ලදී. මෙම පනතට අනුකූලව කටයුතු කිරීමක් ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධිතව පූර්ව රසායන පාලන අධිකාරියක් 2010 වර්ෂයේ ඔක්තොම්බර් මස 25 වන දින ස්ථාපිත කරන ලදී.

## මත්ද්‍රව්‍ය ප්‍රවාහනය

නීතිය බලාත්මක කිරීමේ ආයතන මගින් අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය ප්‍රමාණයන් නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ මට්ටම නිර්ණය කරනු ලබන එක් දර්ශකයකි. ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය ප්‍රවාහනයේ සංක්‍රමණික ස්ථානයක් වන අතර පකිස්ථානය හා ඉන්දියාවෙන් රැගෙන එන මත්ද්‍රව්‍ය යුරෝපීය හා බටහිර රටවල්වලට කොළඹ හෝ මාලේ හරහා බෙදා හැරේ.

පසුගිය අවුරුදු පහ සළකා බලන කල, හෙරොයින් අත්අඩංගුවට ගැනීම් හා අල්ලා ගැනීම් තොරතුරු වලට අනුව අනාවරණය වන කරුණ නම් නිරිත දිග ආසියානු හෙරොයින් (දුඹුරු හෙරොයින්) ප්‍රධාන වශයෙන් ජාවාරම් කෙරෙනුයේ ඉන්දියාවෙන් හා පකිස්ථානයෙන් වන අතර පසුගිය අවුරුදු පහේදී විදේශීය ජාතිකයින් 130ක් ශ්‍රී ලංකාවේ දී අත්අඩංගුවට ගන්නා ලදී. මේ අතර ඉන්දියානු ජාතිකයන් 44ක් විය. පසුගිය අවුරුදු පහේදී ශ්‍රී ලාංකිකයන් 6 දෙනෙකු විදේශීය රටවලදී අත්අඩංගුවට පත්විය. ඔවුන් අත්අඩංගුවට ගන්නා ලද්දේ ඉන්දියාව හා මලයාසියාව වැනි රටවලදී ය. ඔවුන් සතුව තිබී හෙරොයින් ග්‍රෑම් 501.5 ක් අත්අඩංගුවට පත්විය.

## ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවය

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන් සඳහා නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකාවේ 2007 අංක 54 දරන පනත යටතේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් සඳහා (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) අනිවාර්ය ප්‍රතිකාර පහසුකම් බලාත්මක කර ඇත. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා නේවාසික ප්‍රතිකාර මධ්‍යස්ථාන 4ක් ක්‍රියාත්මක කරන අතර බාහිර සේවා වැඩසටහන් ද ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථාන කොළඹ (තලංගම), නුවර, ගාල්ල, ඌරාපොල (නිට්ටඹුව) යන ස්ථානවල පිහිටා ඇත.

මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානයන්හි පවත්නා ප්‍රතිකාර වැඩසටහන් වල පුද්ගලික හා පවුල් උපදේශනයද ඇතුළත්ය. එහි

අන්තර්ගතය විෂ හරණ ප්‍රතිකාර, ශාරීරික ක්‍රියාකාරකම්, මානසික සුවතා, ගෘහස්ථ හා බාහිර ක්‍රියාකාරකම්, මනෝ චිකිත්සක ප්‍රතිකාර, අධ්‍යාපනික, වෘත්තිය පුහුණු, කුසලතා සංවර්ධන වැඩසටහන් වැනි එදිනෙදා ජීවන කුසලතා සංවර්ධනය කරගැනීමේ අංශද ඇතුළත්ව පැවැත්වේ.

2007 අංක 54 දරන ප්‍රතිකාර හා පුනරුත්ථාපන පනත යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව මත්ද්‍රව්‍ය වැරදි සඳහා බන්ධනාගාර ගතවන පුද්ගලයන් වෙනුවෙන් "බන්ධනාගාර ප්‍රතිකාරමය උපදේශන වැඩසටහන් " ක්‍රියාත්මක කරනු ලැබේ. විශේෂයෙන්ම මේ වන විට නම් කරන ලද බන්ධනාගාරවල එනම් වීරවිල, කළුතර, පල්ලෙකැලේ, අනුරාධපුර, පල්ලන්සේන, වටරැක, කන්දෙවත්ත, මීතිරිගල හා තල්දෙන ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක වේ. මීට අමතරව බන්ධනාගාර ගතවූ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සඳහා පුනරුත්ථාපන කටයුතු සිදුකිරීම පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් පොළොන්නරුව කන්දකාඩු ප්‍රදේශයේ පුනරුත්ථාපනය සඳහා වෙන්වූ විශේෂ බන්ධනාගාරයක් මේ වන විට ක්‍රියාත්මක වේ.

2015 වර්ෂයේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ සේවාලාභීන් 1482 දෙනෙකුට ප්‍රතිකාර සේවාව සපයන ලදී. එම සේවාලාභීන්ගෙන් 866 (58%) දෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන්ද, 317 (21%) බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනින්ද 212 (14%) රාජ්‍ය නොවන සංවිධානවලින්ද ප්‍රතිකාර ලබාගෙන ඇති අතර එම සේවාලාභීන්ගෙන් බහුතරයක් (57%)ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් ආයතනගත වූවන් ය. ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 69%ක් අවුරුදු 30 හෝ ඊට වැඩි අය වෙති. පසුගිය වසර පහ සලකා බැලීමේදී මුල් සිව්වසර තුළ ප්‍රතිකාර සඳහා පැමිණි සේවාලාභීන්ගේ අඩුවීමක් දක්නට ලැබුණු අතර 2015 වර්ෂයේ දී 2014 වර්ෂයට වඩා 10%කින් ප්‍රතිකාර ලබාගත් සංඛ්‍යාව පහළ ගොස් ඇත.

### බන්ධනාගාර ගතවීම්

2015 වර්ෂයේදී මත්ද්‍රව්‍ය හේතුවෙන් බන්ධනාගාර ගතවූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව 24,086කි. ඔවුන් අතුරින් ගංජා සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් 3648 (33%)ක් ද හෙරොයින් සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් 7519 (67%)ක් ද බන්ධනාගාර ගතවී ඇත. 2014 වර්ෂය හා සැසඳීමේදී 2015 වර්ෂයේදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාර ගතවීම් 7%කින් අඩු වී ඇත.

### එච්.අයි.වී. /ඒඩ්ස්

මත්ද්‍රව්‍ය එන්නත් කරගැනීම තුළින් එච්.අයි.වී ආසාදනය වීමේ අවදානමක් පවතී. එන්නත් කරගන්නා උපකරණ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර හුවමාරු කරගැනීම තුළින් ලේ හුවමාරුවීමෙන් යම් පුද්ගලයෙකුට එච්.අයි.වී. / ඒඩ්ස් වැළඳිය හැකිය. මත්ද්‍රව්‍ය එන්නත් කිරීම තුළින් එච්.අයි.වී. ආසාදනය වූ එක් ශ්‍රී ලාංකිකයෙක් පමණක් මෙතෙක් වාර්තා වී ඇත.

ලංකාවේ පළමු වරට එච්.අයි.වී. ආසාදිත පුද්ගලයෙකු වාර්තා වූයේ 1987දී ය. නිල වාර්තාවලට අනුව 2015 වසර වන විට එච්.අයි.වී. ආසාදිත පුද්ගලයන් 2389 ක් වාර්තා වී ඇති අතර මෙයට පිරිමි 1452ක් සහ ගැහැණු 857ක් ඇතුළත් ය. පසුගිය වසරේ වාර්තාවීම් අනුව බලන විට 2015 වසරේදී වාර්තා වූ ගැහැණු සංඛ්‍යාව 10%කින් ද, පිරිමි සංඛ්‍යාව 10%කින් ද වැඩිවී ඇත. 2015 වන විට ඒඩ්ස් වැළඳුන පුද්ගලයින්ගේ සංඛ්‍යාව 602කි. ඒ අතර පිරිමි 414ක් හා ගැහැණු 188 දෙනෙක් වූහ. 2015 වන විට ඒඩ්ස් වැළඳී මිය ගිය මුළු සංඛ්‍යාව 367ක් වන අතර 2015 වර්ෂය තුළදී පමණක් 31 දෙනෙකු මිය ගොස් තිබුණි.

### නීතිය ක්‍රියාත්මක වීම

ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාරය, ශ්‍රී ලංකා රේගුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ත්‍රිවිධ හමුදාව වැනි නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් 2015 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය වැරදි සඳහා නීතිය ක්‍රියාත්මක කරන ලදී. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමේ කමිටුව මගින් නීති සම්බන්ධීකරණ කටයුතු කරන අතර නව නීති සැකසීම, ප්‍රතිපත්ති සැලසුම් කිරීම දිවයින පුරා නීතිය බලගැන්වීමෙහි නිරතව සිටී. මීට අමතරව මණ්ඩලය බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමග නොකඩවා මත්ද්‍රව්‍ය ප්‍රතිකාර පුනරුත්ථාපන කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

## 07. සංස්ථා පාලනය (Corporate Governance)

මණ්ඩලයේ යහපාලනය සඳහා අයවැය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද උපදේශන මාලාව යටතේ කළමණාකරණය වේ. මෙයට අමතරව මණ්ඩලය විසින් සම්පාදනය කරන විශේෂිත උපදේශ මාලාවක් හා ආයතනික සංග්‍රහය අදාළ කර ගනී.

මණ්ඩලය

මණ්ඩලයේ සභාපති ඇතුළු පත් කරන ලද සාමාජිකයන් 04 දෙනෙකුගෙන් සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකුගෙන් සමන්විත වේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනතට අනුව මණ්ඩලය මාසිකව රැස්වේ.

අනු කමිටු

යහපාලනය සඳහා පොදු ව්‍යවසාය උපදෙස් මාලාවට අනුව මණ්ඩලය විසින් පත්කරන ලද විගණන හා කළමණාකරණ කමිටුවක් වේ.

මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත වන නීතිය බලාත්මක කිරීමේ අනුකමිටුව ශ්‍රී ලංකාවෙන් මත්ද්‍රව්‍ය උවදුර දුරු කිරීමට සහ හැකිතාක් දුරට මත්ද්‍රව්‍ය සැපයීම සහ දුර්භාවිතය අවම කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට සහ ශක්තිමත් කිරීමට අවශ්‍ය වැදගත් තීන්දු තීරණ ගනිමින් ඉතා කාර්යක්ෂම කමිටුවක් ලෙස කටයුතු කරනු ලැබේ.

මණ්ඩලයේ නීති සම්පාදක අනුකමිටුව කලින් කලට මත්ද්‍රව්‍ය සැපයුම් සහ දුර්භාවිතාව පිළිබඳව ලෝකයේ ඇති වන ප්‍රවණතාවයන්ට මුහුණ දීමට උචිත ලෙස ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය වඩාත් ශක්තිමත් කිරීම සඳහා පවතින නීති හා රෙගුලාසි සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම මෙන්ම නව නීති රෙගුලාසි ගෙන ඒම සඳහා ද කටයුතු කරනු ලැබේ.

# 08. ක්‍රියාකාරිත්වය පිළිබඳ සමාලෝචනය

## 8.1 නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය

### පාසැල් සිසුන් සඳහා වූ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

2015 වර්ෂය නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය තම ඉලක්ක කරා අති සාර්ථකව ලඟා වූ වර්ෂයක් ලෙස නම් කළ හැකිය. පාසැල් සිසුන් සඳහා වූ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් වල සාර්ථකත්වය මේ සඳහා හොඳම උදාහරණයයි.

නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය 2015 වසර සඳහා අපේක්ෂිත වැඩසටහන් ප්‍රමාණය 350ක් ලෙස ඉලක්ක ගත කර තිබූ අතර 2015 වසර අවසානයේදී නිම කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 564 කි. අපේක්ෂිත ඉලක්කය සහ ළඟා වූ ස්ථානය 2014 වසර හා සැසඳීමේ දී එය 161.14% ක වර්ධනයකි.

| වසර | ජනවාරි | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2013 | 13 | 22 | 18 | 9 | 15 | 9 | 7 | 1 | 15 | 18 | 7 | 3 |
| 2014 | 5 | 7 | 12 | 11 | 24 | 25 | 38 | 2 | 47 | 78 | 49 | 21 |
| 2015 | 28 | 64 | 90 | 17 | 53 | 50 | 87 | 3 | 40 | 85 | 33 | 14 |
| පසු ගිය වසරට සාපේක්ෂව වර්ධනය- ප්‍රතිශතයක් ලෙස | 560% | 914% | 750% | 154% | 220% | 200% | 228% | 66.66% | - 14.89% | 108.97% | -32.66% | - 33.33% |

2013-2014-2015 වසර වල පැවැත්වූ සියළුම පාසැල් වැඩසටහන් වල මාසික සැසඳීම




2015 වසර සඳහා නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් මගින් ආවරණය කිරීමට අපේක්ෂිත පාසැල් සිසුන් සංඛ්‍යාව 80 000 ක් වන විට වසර අවසානයේ දී නිම කරන ලද වැඩසටහන් තුළින් ආවරණය කරන ලද සිසුන් සංඛ්‍යාව 99,956 කි. අපේක්ෂිත සිසුන් ප්‍රමාණයට වඩා සිසුන් 19,956 දෙනෙකු ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු ඒකකය සමත්ව ඇත. එය ප්‍රතිශතයක් ලෙස 124.94% ක වැඩි වීමකි.

| වසර | ජනවාරි | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | අගෝ | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2013 | 1622 | 1645 | 2235 | 1068 | 3915 | 866 | 660 | 8 | 1612 | 6632 | 1180 | 162 |
| 2014 | 830 | 2318 | 3992 | 5589 | 6812 | 6043 | 6743 | 171 | 11 415 | 15 415 | 7752 | 3242 |
| 2015 | 5684 | 8979 | 15 906 | 3333 | 9553 | 9183 | 16 886 | 345 | 4950 | 16 723 | 5043 | 3371 |

2014 වසරේ නිම කරන ලද පාසැල් සිසුන් සඳහා වූ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 319 ක් වන විට , 2015 වසරේ නිම කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 564 කි . එය වසර දෙකෙහි වැඩසටහන් සංඛ්‍යාව හා සැසඳීමේ දී 176.8% ක වර්ධනක් පෙන්නුම් කරයි.

2013-2014-2015 වසර වල පැවැත්වූ සියළුම පාසල් වැඩසටහන් වල මාසික සැසඳීම

| | |
|---|---|
| අපේක්ෂිත සිසුන් ගණන 2015 | 80 000 |
| දෙසැම්බර් මස අවසානය වන විට සහභාගි වූ මුළු සිසුන් ගණන | 99 956 |
| Extension Numbers | 19 956 |
| ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | 124.94% |

2013-2014-2015 වසර වල පැවැත්වූ සියළුම පාසල් වැඩසටහන් වල මාසික සැසඳීම




2015 වසරේ නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 99,956 කි. එය 2014 හා 2015 වසර සැසඳීමේ 142.14% වර්ධනයකි.

2015 වසරේ වැඩිම වැඩසටහන් ප්‍රමාණයක් නිම කරන ලද මාසය මැයි වන අතර එම සංඛ්‍යාව 87 කි. 2015 වසරේ වැඩිම සිසුන් සංඛ්‍යාවක් ආවරණය කරන ලද මාසය ජූලි මාසයයි. ආවරණය කරන ලද සිසුන් සංඛ්‍යාව 16,886 කි.

දිස්ත්‍රික්ක 12ක් පාදක කරගනිමින් පාසල් සිසුන් සඳහා නිවාරණ අධ්‍යාපන වැඩසටහන් 564 ක් මෙහෙයවා ඇති අතර මත්ද්‍රව්‍ය කෙරෙහි නැඹුරුවේ වැඩිම අවදානමක් පවතින දිස්ත්‍රික්කය වන කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිම වැඩසටහන් ප්‍රමාණයක් (33%) පවත්වා ඇත. එක් එක් දිස්ත්‍රික්කයේ වැඩසටහන් ප්‍රමාණය සමස්ත වැඩසටහන් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස පහත පරිදි වේ.

කොළඹ 33%, ගම්පහ 17%, කෑගල්ල 11%, මහනුවර 9%, රත්නපුර 8%, කළුතර 8%, ගාල්ල 6%, කුරුණෑගල 4%, පුත්තලම 2%, මාතර 1%, බදුල්ල 1%, පොළොන්නරුව 1%.

2015 වසරේ දි පැවැත්වූ පැසල් වැඩසටහන් සංඛ්‍යාව-දිස්ත්‍රික්ක වශයෙන්



**මුල් ළමා විය සංවර්ධනය සහ මත් නිවාරණය උදෙසා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් මව්වරු හා ගැබිණි මව්වරු**

මුල් ළමා විය සංවර්ධනය උදෙසා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 50 ක් 2015 වසර සඳහා අපේක්ෂිත ඉලක්කය ලෙස වසර ආරම්භයේ සනිටුහන් කරන ලද අතර, වසර අවසානයේ නිම කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 108 කි. අපේක්ෂිත ඉලක්කකයට වඩා වැඩසටහන් 58 ක් සංවිධානය කිරීමට නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය සමත්වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 216% ක වර්ධනයකි.

වැඩසටහන් මගින් දෙමාපියන් 5000 ක් ආවරණය කිරීම 2015 වසරේ අපේක්ෂිත ඉලක්කය වූ අතර, එම සංඛ්‍යාව කිහිප ගුණයකින් අතික්‍රමණය කරමින් සිසුන් 10,634 ක් වැඩසටහන් තුළින් ප්‍රතිලාභ ලබා ඇත. එය ප්‍රතිශතයක් ලෙස 212.68% ක වර්ධනයකි.

මුල් ළමා විය සංවර්ධනය උදෙසා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2014 හා 2015 සංසන්දනය කිරීමේදී 2014 වසරේ වැඩසටහන් 16 ක් පවත්වා ඇති අතර දෙමාපියන් 1243 ක් වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. එය 2015 වසර හා සැසඳීමේ දී වැඩසටහන්හි 675% ක වැඩිවීමක්ද ප්‍රතිලාභ ලද සංඛ්‍යාවේ 855.5% ක වර්ධනයක් ද පෙන්නුම් කරයි.

**උසස් අධ්‍යාපන, තාක්ෂණික ආයතන සහ තෘතියික අධ්‍යාපන ආයතන උදෙසා දියත් කරන ලද නිවාරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්**

වර්ෂ 2015 ආරම්භයේ නිවාරක අධ්‍යාපන සහ පුහුණු අංශයේ උසස් අධ්‍යාපන, තාක්ෂණික ආයතන සහ තෘතික අධ්‍යාපන ආයතනය වෙනුවෙන් වැඩසටහන් ප්‍රමාණයේ අපේක්ෂිත ඉලක්කය වූයේ 50 කි. එනමුත් වසර අවසන් වන විට වැඩසටහන් 87 ක් සම්පූර්ණ කිරීමට නිවාරක අධ්‍යාපන සහ පුහුණු අංශය සමත් විය. අපේක්ෂිත ඉලක්කයට වඩා වැඩසටහන් 37 ක් නිම කර ඇති අතර, එය 174% ක වර්ධනයකි.

වැඩසටහන් මගින් එම අධ්‍යාපන ආයතනයන් හි සිසුන් 3000 ක් ආවරණය කිරීම 2015 වසරේ අපේක්ෂිත ඉලක්කය වූ අතර එම සංඛ්‍යාව කිහිප ගුණයකින් අතික්‍රමණය කරමින් සිසුන් 8170 ක් වැඩසටහන් තුළින් ප්‍රතිලාභ ලබා ඇත. එය ප්‍රතිශතයක් ලෙස 272.3% වර්ධනයකි.

වර්ෂ 2014 සහ 2015 සැසඳීමේ දී 2014 වසරට වඩා 2015 තුළ වැඩසටහන් 39 ක් සංවිධානය කිරීමට නිවාරණ අධ්‍යාපන සහ පුහුණු අංශය සමත් වී ඇත.

මෙම වැඩසටහන් අතරින් වැඩසටහන් 8 ක් විශ්ව විද්‍යාල තුළ දියත් කර ඇති අතර, ඉන් විශ්ව විද්‍යාල සිසුන් 2315 ක් සහ දේශකවරුන් 20 ක් ආවරණය කිරීමට සමත්ව ඇත.

**රාජ්‍ය නිළධාරීන් සඳහා නිවාරක පුහුණු වැඩසටහන් (ග්‍රාම, සමෘද්ධි, සංවර්ධන නිළධාරීන් හා නවක උපාධිධාරීන්)**

2015 වසර සඳහා රාජ්‍ය නිළධාරීන් වෙනුවෙන් නිවාරණ වැඩසටහන් 60 ක් පැවැත්වීමට අපේක්ෂිත වූ අතර 2015 වසර අවසන් වන විට වැඩසටහන් 149 ක් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් වී ඇත. අපේක්ෂිත ඉලක්කයට වඩා වැඩසටහන් 89 ක් පැවැත්වීමට සමත්වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 248.33% ක ප්‍රගතියකි.

ආවරණය කිරීමට අපේක්ෂිත රාජ්‍ය නිළධාරීන් සංඛ්‍යාව 3000 ක් වුවද වසර අවසන් වන විට රාජ්‍ය නිළධාරීන් 10739 ක් ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත් ව ඇත. එම සාර්ථකත්වය ප්‍රතිශතයක් ලෙස 357.96%කි. 2014 වසර හා සැසඳීමේ දී එම වසරට වඩා වැඩසටහන් 70 ක් 2015 වසරේ නිමකර ඇති අතර එය 188.6%ක වර්ධනයකි.

**ගුරුවරුන් , ගුරු උපදේශකයින් පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්**

වර්ෂ 2015 සඳහා ගුරුවරුන්, ගුරු උපදේශකයින්, පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම් වැඩසටහන් 15 ක් පැවැත්වීම අපේක්ෂිත ඉලක්කය වූ අතර, වසර අවසන් වනවිට වැඩසටහන් 25 ක් පැවැත්වීමට නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය සමත්වී ඇත. අපේක්ෂිත ඉලක්කයට සාපේක්ෂව පැවැත්වූ වැඩසටහන් 166.66% ක වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන් 2500 ක් 2015 වසර තුළ වැඩසටහන් මගින් ආවරණය කිරීමට ඉලක්ක ගතව තිබූ අතර සපුරාගත් සංඛ්‍යාව 2,487 කි. අපේක්ෂිත ඉලක්කය සහ සපුරාගත් ඉලක්කය සැසඳීමේ ප්‍රතිශතයක් ලෙස 99.48% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.

**නීතිය බලාත්මක කරන ආයතන වල නිළධාරීන් සඳහා පවත්වන ලද වැඩසටහන්**

නීතිය බලාත්මක කිරීමේ නිළධාරීන් සඳහා 2015 වසරෙහි පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් ගණන 30 ක් වූ අතර, වසර අවසානයේ වැඩසටහන් 57 ක් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත. එය 190% ක සාධනීය මට්ටමක් පෙන්නුම් කරයි.

වැඩසටහන් මගින් ආවරණය කිරීමට බලාපොරොත්තු වූ නිළධාරීන් සංඛ්‍යාව 8000 ක් වුවද, 2015 වසර අවසානයේ නිළධාරීන් 9068 ක් සඳහා වැඩසටහන් පවත්වා නිම කිරීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත. එය අපේක්ෂිත නිළධාරීන් ගණනට සාපේක්ෂව 113.35% ක ප්‍රගතියක් සනිටුහන් කරයි.

2014 වසර තුළ නිළධාරීන් 8277 ක් ආවරණය කර ඇති අතර 2015 වසරේදී එම සංඛ්‍යාව 8767 දක්වා වර්ධනය වී ඇත. එය 2014 වසරට සාපේක්ෂව 2015 වසර තුළ 105.9% ක ප්‍රගතියක් සටහන් කරයි.

**විශාල වැඩබිම් ආවරණය කරන ලද වැඩසටහන්**

2015 වසර තුළ විශාල වැඩබිම් ආවරණය කරමින් පැවැත්වීමට ඉලක්ක කර තිබූ වැඩසටහන් සංඛ්‍යාව 40 ක් වන විට ඉන් 35 ක් නිම කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත. එය 87.5% ක සාධනීය මට්ටමකි.

2015 වසරේ ආවරණය කිරීමට අපේක්ෂා කරන ලද විශාල වැඩබිම් සංඛ්‍යාව 2500 ක් වන විට වසර අවසානයේ සේවක සේවිකාවන් 5196 ක් ආවරණය කර ඇත. අපේක්ෂිත මට්ටමට සාපේක්ෂව ලඟා කරගත් ප්‍රතිඵලය 207.84% ප්‍රගතියක් පිළිඹිබු කරයි.

**සෞඛ්‍ය අංශය සඳහා දියත් කරන ලද වැඩසටහන්**

සෞඛ්‍ය අංශය සඳහා 2015 වසර තුළ දී නිවාරක අධ්‍යාපන පුහුණු වැඩසටහන් 20 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබූ අතර වසර අවසන් වනවිට වැඩසටහන් 19 ක් නිම කිරීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත. එය 95% ක සාධනීය මට්ටමක් ලඟා කර ගැනීමකි.

සෞඛ්‍ය අංශයේ නිළධාරීන් 2000 ක් 2015 වසර තුළ ආවරණය කිරීමට අපේක්ෂා කල ද වසර අවසන් වන විට ආවරණය කිරීමට සමත්ව ඇත්තේ නිළධාරීන් 732 කි. එහි සාධනීය මට්ටම 36.66% ක් ලෙස දැක්විය හැක.

**දහම් පාසල් සිසුන්, පිරිවෙන් හා භික්ෂු සංඝයා වහන්සේලා උදෙසා, දියත් කරන ලද නිවාරක අධ්‍යාපන පුහුණු වැඩසටහන්**

2015 වසර සඳහා නිම කිරීමට අපේක්ෂිත වැඩසටහන් ඉලක්කය 40 ක් වූ අතර වසර අවසන් වන විට වැඩසටහන් 46ක් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත. එය 115% ක සාධනීය මට්ටමක් ළඟා කර ගැනීමකි.

ආවරණය කිරීමට අපේක්ෂිත දහම් පාසැල් සිසුන් හා සංඝයා වහන්සේලා ප්‍රමාණය 3000 ක් වුව ද, වසර අවසන් වනවිට ප්‍රතිලාභීන් 5825 ක් ආවරණය කිරීමට සමත්ව ඇත. එය අපේක්ෂිත මට්ටමට සාපේක්ෂව 194.16% ක වර්ධනයක් සනිටුහන් කරයි.

**ප්‍රජා පාදක කොටගත් නිවාරක අධ්‍යාපන පුහුණු වැඩසටහන්**

ප්‍රජා පාදක කොට ගනිමින් නිවාරක අධ්‍යාපන පුහුණු වැඩසටහන් 100 ක් පැවත්වීමට 2015 වසර සඳහා වූ ඉලක්කයයි. එනමුත් 2015 වසර අවසන් වනවිට වැඩසටහන් 295 ක් පැවැත්වීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත. එය 295% ක සාධනීය මට්ටමක් ලඟා කර ගැනීමයි.

වසර සඳහා ආවරණය කිරීමට ඉලක්ක ගත් ප්‍රජා සාමාජික සංඛ්‍යාව 20000 ක් වු අතර වසර අවසන් වන විට 40 595 ක් ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත. එය අපේක්ෂිත මට්ටමට සාපේක්ෂව 202.97% ක වර්ධනීය මට්ටමකි.

ප්‍රජා පාදක කොටගත් වැඩසටහන් 155 ක් 2014 වසරේ පවත්වා ඇති අතර, 2015 වසරේ වැඩසටහන් 295 ක් නිම කර ඇත. එය 2014 වනවිට සාපේක්ෂව 190.32% ක සාධනීය මට්ටමක් ළඟා කර ගැනීමකි.

මාසිකව ප්‍රජා වැඩසටහන් වලට සහභාගි වූ සහභාගිවූවන් ගණන-2015




මාසිකව පැවැත්වූ ප්‍රජා වැඩසටහන් ගණන.




**රාජ්‍ය නොවන ආයතන වල නිළධාරීන් දැනුවත් කිරීම.**

රාජ්‍ය නොවන ආයතන වල නිළධාරීන් සඳහා 2015 වසර තුළ වැඩසටහන් 24 ක් පවත්වා ඇත. ඉන් නිළධාරීන් 2406 ක් ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත.

**කෙටි කාලීන මැදිහත්වීම් හා උපදේශන සේවාවන්**

2015 වසර තුළ දිවයින පුරා බන්ධනාගාර, ප්‍රජා විශෝධක කාර්යාල, කෙටි කාලීන මැදිහත්වීම් හා උපදේශන සේවාවන් සම්පත් ද වැඩසටහන් 115 ක් පවත්වා ඇති අතර, එමඟින් පුද්ගලයින් 2, 718 ආවරණය කර ඇත.

**වැලිලි ක්ෂේත්‍රය**

වැලිලි ක්ෂේත්‍රය තුළ මත්ද්‍රව්‍ය නිවාරක අධ්‍යාපන පුහුණු වැඩසටහන් 31 ක් නිම කර ඇති අතර, ඉන් 2368 ක ප්‍රජා සාමාජිකයන් පිරිසක් ද, 77 ක නිළධාරීන් පිරිසක් ද, ආවරණය කිරීමට නිවාරක අධ්‍යාපන පුහුණු අංශය සමත්ව ඇත.

**අධ්‍යාපනික ප්‍රදර්ශන**

2015 වසර තුළ දිවයින පුරා පැවති අධ්‍යාපනික ප්‍රදර්ශන 9 කට දායකත්වය දක්වා ඇත. ප්‍රදර්ශන කුටි හරහා 2015 වසර තුළ 13 000 කට අධික පිරිසක් මත්ද්‍රව්‍ය නිවාරණ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය සමත්ව ඇත.

**2015 ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය සැමරීම**

2015 ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය 2016 ජූනි මස 26/27 දෙදින පුරාවට දහස් සංඛ්‍යාත වූ ජනතා සහභාගීත්වයෙන් උත්කර්ෂවත්ව පැවැත්වීමට නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය ක්‍රියා කරනු ලැබීය.

මෙහි ප්‍රථම පියවර අරලියගහ මැදුරේ දී අතිගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිදුන්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලාංකීය මත්ද්‍රව්‍ය ක්ෂේත්‍රයේ ඉල්ලුම හා සැපයුම අවම කිරීමේ කටයුතු වල නියලෙන දහස් සංඛ්‍යාත නිළධාරීන්ගේ ප්‍රධානත්වයෙන් ජුනි මස 26 වන දින අරලිය ගහ මැදුරේ දී පවත්වන්නට යෙදින. මීට සමගාමීව කොළඹ ක්‍රම කාර්යංශයේ මූල්‍ය දායකත්වයෙන් මත්ද්‍රව්‍ය පිටු දැකීම උදෙසා ජාත්‍යන්තර අධ්‍යාපනික ප්‍රර්ශනයක් කොළඹ 07 ආකේඩ් පරිශ්‍රයේ දී ජුනි මස 27 සහ 28 දෙදින පුරා ක්‍රියාවට නැන්විනි. අලංකාර ප්‍රදර්ශන කුටි 50කින් සමන්විත වූ ප්‍රදර්ශනය නීතිය බලාත්මක කිරිමේ ආයතන හා ඉල්ලුම අවම කිරීමේ කාර්යයන්හි නිරත ආයතනයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. දහස් ගණන් පාසල් සිසු සිසුවියන් හා සාමාන්‍ය ජනතාව මෙම ප්‍රදර්ශනය ඔස්සේ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ අවබෝධය ලබන ලදී.

## 8.2 පර්යේෂණ අංශය




අන්තරායකර ඖෂධ දුර්භාවිත ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටලු පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම, ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීම පර්යේෂණ අංශය විසින් සිදුකරනු ලබයි. මත්ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් සිදුකිරීමට ප්‍රතිපත්ති සකස් කරන්නන්ට, සේවා සපයන්නන්ට, සේවාලාභීන්ට හා පහසුකම් සපයන්නන්ට මත්ද්‍රව්‍ය ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම, වාර්තා සකස් කිරීම හා අදාළ තොරතුරු ලබා දීම ප්‍රධාන කාර්යයන් වේ.

### මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත

සෑම වර්ෂයකම මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ තොරතුරු මෙන්ම ඊට පෙර වසර පහකට අදාළව තොරතුරු සංග්‍රහ ගත කිරීම සිදුකරනු ලබයි. ප්‍රධාන වශයෙන් සියලුම මත්ද්‍රව්‍ය සම්බන්ධව ලබා ගත් තොරතුරු මෙම අත්පොතෙහි සඳහන් කර ඇත.

මත්ද්‍රව්‍ය දුර්භාවිත අත්පොත 2015 සඳහා ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් මත්ද්‍රව්‍යනාශක අංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාරය වැනි නීතිය ක්‍රියාත්මක කරන අංශවලින්, සෞඛ්‍ය අමාත්‍යාංශය හා දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව ආදී ආයතන ගණනාවකින් අවශ්‍ය තොරතුරු ඒකරාශී කිරීම සිදු කරන ලදි. මත්ද්‍රව්‍ය දුර්භාවිත අත්පොත මුද්‍රණය සඳහා යොමුකර ඇත.






**මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛණ වාර්තා (2014 - 2015)**

මෙම වාර්තාව නීතිය බලාත්මක කරන ආයතන මගින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ලබා ගත් දත්ත උපයෝගි කරගෙන වර්තමාන මත්ද්‍රව්‍ය භාවිත රටාවන් පිළිබඳ සකසන ලද සංඛ්‍යාලේඛන වාර්තාවකි. වර්ෂය තුළදී පහත වාර්තා ප්‍රකාශයට පත් කරන ලදි.

1. මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛණ වාර්තාව (ජනවාරි සිට දෙසැම්බර් දක්වා 2014) ඉංග්‍රීසි සහ සිංහල

2. මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංඛ්‍යාලේඛණ වාර්තාව (ජනවාරි ජුනි 2015)

3. මත්ද්‍රව්‍ය ආශ්‍රිත සංසන්දනාත්මක සංඛ්‍යාලේඛණ වාර්තාව (ජනවාරි ජුනි 2014/2015)










**මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතිය**

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතිය යනු පරිගණක ගත කරන ලද තොරතුරු විශ්ලේෂණ පද්ධතියකි. ඒ තුළ ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්වන්නන්ගේ සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිකාර සඳහා ඇතුළත්වන්නන්ගේ තොරතුරු ඇතුළත් කරනු ලබයි. මෙම තොරතුරු මාසිකව සියලුම නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන් වලින් ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන, බන්ධනාගාරවලින් ලබා ගැනේ. ප්‍රතිකාර ලබා ගන්නන් පිළිබඳ තොරතුරු සෑම කාර්තුවකට වරක්ම විශ්ලේෂණය කර වාර්තා කරනු ලබයි.

2015 වර්ෂය තුළ දී පහත සඳහන් වාර්තා ප්‍රකාශයට පත්කරන ලදි.

☐ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන වාර්තාව 48 වෙළුම

☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 93 වෙළුම

☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 94 වෙළුම

☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 95 වෙළුම

☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 96 වෙළුම

☐ මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුලත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 97 වෙළුම

**මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ වාර්තා (DAMS)**

රාජ්‍ය නොවන සංවිධාන මගින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිකාර මධ්‍යස්ථාන මගින් දත්ත සංචිතයට ප්‍රතිකාර සඳහා ඇතුළත් වූවන්ගේ තොරතුරු පත්‍රිකා ලැබෙන්නේ ඉතා සුළු වශයෙනි. එබැවින් පර්යේෂණ අංශය විසින් මණ්ඩලයේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන නිලධාරීන් හා රාජ්‍ය නොවන ආයතන වල එකතුවේ (FONGODA) නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවක් 2015.09.04 වන දින පවත්වන ලදි. මෙම වැඩමුළුවේ මූලික අරමුණ වූයේ තොරතුරු පත්‍රිකා ගෙන්වා ගැනීම හා රාජ්‍ය නොවන සංවිධාන වලින් ගුණාත්මක දත්ත, දත්ත සංචිතයට ලබා ගැනීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමයි.





මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතිය පිළිබඳ දෙවන පුහුණු වැඩමුළුව බන්ධනාගාර නිළධාරීන් සඳහා 2015. 11. 26 දින පවත්වන ලදි.





2015 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන වාර්තා අදාළ ආයතන වලට බෙදාහරින ලදි. ප්‍රතිකාර මධ්‍යස්ථාන පෝරම හා පොලිස්/ සුරාබදු පෝරම අදාල ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට හා පොලිස් ස්ථාන වලට බෙදා හරින ලදි.

**ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ ලිපි එකතුව 111**

පර්යේෂණ අංශය විසින් පසුගිය වර්ෂ වල සිදුකරනු ලැබූ පර්යේෂණ හා සමීක්ෂණ වාර්තා කිහිපයක් එකතුකර "ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ ලිපි එකතුව - III" නැමැති ග්‍රන්ථය සම්පාදනය කරන ලදි. 2015 වසරේ මුද්‍රණය කළ මෙම ග්‍රන්ථයෙහි පහත සඳහන් සමීක්ෂණ/පර්යේෂණ ඇතුළත් වේ.

- කොළඹ දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රචලිත බව හා එහි උපනතීන් පිළිබඳ සමීක්ෂණය
- අම්පාර නගරයේ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාව පිළිබඳ කඩිනම් අධ්‍යයනය
- මත්ද්‍රව්‍ය එන්නත් කරන්නන් පිළිබඳ කඩිනම් සමීක්ෂණය
- කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රචලිත බව හා සුලභතාවය පිළිබඳ සමීක්ෂණය
- කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රචලිත බව හා එහි උපනතීන් පිළිබඳ සමීක්ෂණය

**පර්යේෂණ/සමීක්ෂණ**



**1.** මධ්‍යස්ථාන වලින් බැහැර වූ සේවාලාභීන්ගේ ප්‍රතිකාර හා පුනරුත්ථාපනයේ ප්‍රතිඵලදායක බව පිළිබඳ තක්සේරු අධ්‍යයනය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන මූලික කරගෙන මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන හතරෙහි ප්‍රතිකාර සඳහා පැමිණි සේවාලාභීන්ගේ ප්‍රතිකාර ක්‍රියාවලිය පිළිබඳ සොයා බැලීම සිදු කරන ලදි. 2013 වසරේදී ප්‍රතිකාර ලබාගත් 100ක නියැදියක් මේ සඳහා තෝරාගත් අතර ඉන් ලබාගත් ප්‍රතිකාර පිළිබඳව වාර්තාව 2015 වසරේදී දත්ත විශ්ලේෂණය කර පර්යේෂණ වාර්තාව සම්පූර්ණ කරන ලදි.

සරල සසම්භාවී ක්‍රමය ඔස්සේ මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් ප්‍රතිකාර ලබාගත් සේවාලාභීන් 100කින් යුත් නියැදියක් තෝරාගත් අතර සියළු දෙනාම පුරුෂයින් විය. බහුතරය බෞද්ධයන් (71%) ද, මුස්ලිම් (18%) ක් ද, දෙමල (9%) ක් ද වූ අතර බෞද්ධ 61%ක් ද, 19%ක් ඉස්ලාම් ද, 19%ක් හින්දු ද, 13%ක් ක්‍රිස්තියානි ද විය. වැඩි ප්‍රතිශතයක් අවිවාහකයන් (59%) විය. ප්‍රතිකාර ලබා ගත් අයගෙන් වැඩි ප්‍රතිශතයක් වයස අවුරුදු 19 - 25 ත් අතර බාණ්ඩයේ අය විය.

සමීක්ෂණ දත්ත වලට අනුව සේවාලාභීන්ගෙන් 36%ක් ප්‍රතිකාර ක්‍රියාවලියෙන් පසු මත්ද්‍රව්‍යවලින් නිදහස් වී ඇත. 64%ක පමණ ප්‍රතිශතයකට නිවසේදී බාහිර සේවා නිලධාරීන් මුණ ගැසී තිබුණි.

**නිදහස් වූ සේවාලාභීන්ගේ වර්තමාන තත්ත්වය**




2. **යාපනය දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය ප්‍රචලිතභාවය පිළිබඳ සමීක්ෂණය**

පර්යේෂණ අංශය විසින් මත්ද්‍රව්‍ය ප්‍රචලිතභාවය පිළිබඳ කඩිනම් තක්සේරු අධ්‍යයනයන් වාර්ෂිකව දිස්ත්‍රික්ක මට්ටමින් සිදුකරනු ලබන අතර, රට තුළ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තක්සේරු කර, මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමේ වැඩසටහන්, බාහිරසේවා කාර්යයන් හා ප්‍රතිකාර හා පුනරුත්ථාපනය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

යාපනය දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක් හා ග්‍රාම නිලධාරී වසම් 435 කින් සමන්විතය. යාපනය දිස්ත්‍රික්කයේ මුළු ජනගහණය 583,882 කි. නමුත් මත්ද්‍රව්‍ය භාවිතා කරන අවුරුදු 14 හෝ ඊට අඩු පුද්ගලයින් ඉතා සීමිත හෙයින් ප්‍රතිශතයන් සැලකීමේ දී සංගහනය ලෙස මත්ද්‍රව්‍ය භාවිතා කරන අවම වයස් මට්ටම අවුරුදු 14 ට වැඩි පුද්ගලයන් තෝරා ගන්නා ලදී. යාපනය දිස්ත්‍රික්කයේ අවුරුදු 14 ට වැඩි ජනගහනය 406,586 ක් වේ. ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සලකා බැලූ විටදී පුරුෂ ජනගහනය 190,892 ලෙස ද, ස්ත්‍රී ජනගහනය 215,694 ක් ද වේ.

යුධමය තත්ත්වයෙන් අනතුරුව සංවර්ධනය වෙමින් පවතින යාපනය දිස්ත්‍රික්කය මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් දක්වන ප්‍රවණතාවය හා සුලභතාවය කෙසේද යන්න සොයා බැලීම සඳහා යාපනය දිස්ත්‍රික්කයේ ගෘහස්ථ සමීක්ෂණය සිදු කෙරුණි. යාපනය දිස්ත්‍රික්කයේ ගෘහස්ථ සමීක්ෂණයේ දත්ත ලබාගැනීම සඳහා පවුල් 11,730 ක් සසම්භාවී නියැදි ක්‍රමය යටතේ එන ක්‍රමික නියැදි ක්‍රමයට අනුව තෝරාගන්නා ලදී.

සමීක්ෂණ දත්ත විශ්ලේෂණ තුළින් පහත තොරතුරු අනාවරණය විය. යාපනය දිස්ත්‍රික්කයේ නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය වන හෙරොයින් භාවිතා කරන්නන් පිළිබඳ ලබාගත් ඇස්තමේන්තු ගත අගයන් අනුව එය පුද්ගලයින් 332 ලෙසද, ගංජා භාවිතා කරන්නන් 1,132 කට ආසන්න ප්‍රමාණයක් ද යාපනය දිස්ත්‍රික්කය තුළ සිටින බවට තොරතුරු අනාවරණය විය. මීට අමතරව සිගරට්, බියර් හා මධ්‍යසාර සැලකු විට එය නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය වලට වඩා ඉහළ අගයක් ගන්නා අතර මෙම මත්ද්‍රව්‍ය අතරිනුත් ඉහළම ප්‍රචලිතභාවය මධ්‍යසාර සඳහා පවතින බවද කිව හැකිය. සිගරට් භාවිතා කරන පුද්ගලයන් 51,577 ක් ලෙසද බියර් භාවිතා කරන පුද්ගලයන් 52,180 ක් ද ලෙස ඇස්තමේන්තුගත කළ හැකිය.

නියැඳිය තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙහි සංයුතිය

| මත්ද්‍රව්‍ය වර්ගය | භාවිතා කරන පුද්ගලයන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| බියර් | 4239 | 12.8% |
| මද්‍යසාර (රා ඇතුළුව) | 4601 | 13.9% |
| සිගරට් | 4190 | 12.7% |
| ගංජා | 92 | 0.28% |
| හෙරොයින් | 27 | 0.08% |
| ඖෂධ අනිසි භාවිතය (පෙති වර්ග) | 16 | 0.05% |
| කොරෙක්ස් ඩී | 16 | 0.05% |

(සමීක්ෂණ දත්ත - 2014)

යාපනය දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් සිදු කළ මෙම සමීක්ෂණයේ දත්ත පදනම් කරගෙන වර්තමාන මත්ද්‍රව්‍ය ස්වභාවය, සමීක්ෂණය තුළින් අනාවරණය කරගත් තොරතුරු මගින් ඉදිරියේදී සිදුකරනු ලබන වැඩසටහන් පිළිබඳ මාධ්‍ය සමුළුවක් 2015 ජුනි 08 වන දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලීය ශ්‍රවණාගාරයේදී අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමා, උතුරු පළාත් සභා ප්‍රධාන අමාත්‍ය සී. වී. විග්නේශ්වරන් මැතිතුමා, මණ්ඩලයේ සභාපති නිලංග සමරසිංහ මහතා සහ මණ්ඩලයේ නිලධාරීන්ගේ දායකත්වයෙන් පවත්වන ලදි.





2015 දෙසැම්බර් මස 29 වන දින සමීක්ෂණය තුළින් අනාවරණය කර ගත් තොරතුරු ඇතුළත් සමීක්ෂණ වාර්තා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ඉදිරිපත් කරන ලදි.





### 3. වයඹ අධ්‍යාපන කලාපයේ පාසල් ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සමීක්ෂණය

පර්යේෂණ අංශය විසින් වයඹ අධ්‍යාපන කලාපයේ සහාය සහිතව පාසල් ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාව පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදි. දත්ත රැස්කිරීම සඳහා ගුරුභවතුන්, විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් කුරුණෑගල, පුත්තලම, හලාවත හා මහව යන අධ්‍යාපන කලාප තුළ පවත්වන ලදි. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පාසල් ළමුන් අතර අවදානමට ලක්විය හැකි කණ්ඩායම් හඳුනා ගැනීමත්, පාසල් ළමුන් එසේ අවදානම් තත්ත්වයන් වලට ගොදුරු වීමට හේතු සාධක විමසා බැලීමත්, තහවුරු කරගත් පාසල් සඳහා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මෙම අධ්‍යයනයේ මූලික අරමුණු විය. 2015 වර්ෂය තුළ දී පර්යේෂණ වාර්තාව සකස් කර අවසන් කරන ලදි. පර්යේෂණ අනාවරණයන් වයඹ පළාත් සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදී.

### 4. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය, ජාවාරම් කිරීම සහ ජාවාරම්කරුවන් පිළිබඳ කඩිනම් සමීක්ෂණය (බන්ධනාගාර ඇසුරින්)

පර්යේෂණ අංශය විසින් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය, ජාවාරම් කිරීම සහ ජාවාරම්කරුවන් පිළිබඳ කඩිනම් සමීක්ෂණයක් බන්ධනාගාර ඇසුරින් සිදු කරන ලදි. 2015 ජූලි 07 වන දින සමීක්ෂණය ආරම්භ කරන ලදි. වැලිකඩ, නව මැගසින් බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, පල්ලන්සේන, මීගමුව, ගාල්ල, තංගල්ල, මාතර, පල්ලෙකැලේ, කෑගල්ල, වටරැක, කලුතර, මහර, අනුරාධපුර ඇතුළු බන්ධනාගාර 14 කින් සමීක්ෂණයට ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් දත්ත රැස් කරන ලදි. 2015 වර්ෂය තුළදී අවසන් වාර්තාව පිළියෙල කරන ලදි.

පහත තොරතුරු සමීක්ෂණය තුළින් අනාවරණය විය. නියැදියෙන් 94%ක් (296) පුරුෂයින් නියෝජනය වූ අතර 6% (19) ක් ස්ත්‍රීන් විය. ඔවුන් අතරින් 5%ක් අධ්‍යාපනය නොලද පුද්ගලයින් වන අතර, 24%ක් පමණ ප්‍රාථමික අධ්‍යාපනය දක්වා ද, 45%ක් ද්විතීයික අධ්‍යාපනය ලැබූවන් ද විය. ඔවුන්ගෙන් 58%ක් පස්වතාවක් බන්ධනාගාරගත වී ඇති අතර, 2%ක් හය වතාවක් පමණ බන්ධනාගාරගත වී ඇත.




පුද්ගලයින් තිදෙනෙකු විසි වතාවක්ද බන්ධනාගාර ගත වී තිබූ අතර බහුතරය එක් වතාවකට වැඩි ප්‍රමාණයක් බන්ධනාගාරගත වී තිබුණි.

**ඉන්දියන් සාගරය හරහා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය වන ආකාරය**




### 5. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය හා නූතන ප්‍රවණතා පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණය

පර්යේෂණ අංශය විසින් මත්ද්‍රව්‍ය ප්‍රවණතාවය පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සැලසුම් කරන ලදි. මෙහි මූලික අරමුණු වූයේ මත්ද්‍රව්‍ය සඳහා ඉහළ අවදානමක් ඇති ප්‍රදේශ හඳුනාගැනීමත්, මත්ද්‍රව්‍ය භාවිතයේ නව ප්‍රවණතා හඳුනා ගැනීමත්ය. දිස්ත්‍රික්ක 18කින් පොලිස් බල ප්‍රදේශ 28ක් ආවරණය වන පරිදි නියැදිය තෝරාගන්නා ලදි.

| පොලිස් බල ප්‍රදේශ | ප්‍රශ්නාවලි සංඛ්‍යාව | පොලිස් බල ප්‍රදේශ | ප්‍රශ්නාවලි සංඛ්‍යාව |
|---|---|---|---|
| දකුණු කොළඹ | 40 | කුරුණෑගල | 40 |
| උතුරු කොළඹ | 40 | කුලියාපිටිය | 40 |
| මැද කොළඹ | 40 | පොලොන්නරුව | 40 |
| නුගේගොඩ | 40 | අනුරාධපුර | 40 |
| ගල්කිස්ස | 40 | හම්බන්තොට | 40 |
| ගාල්ල | 40 | තංගල්ල | 40 |
| ඇල්පිටිය | 40 | මන්නාරම | 40 |
| ගම්පහ | 40 | මාතලේ | 40 |
| කැලණිය | 40 | කෑගල්ල | 40 |
| මීගමුව | 40 | වවුනියාව | 40 |
| මාතර | 40 | මහනුවර | 40 |
| පානදුර | 40 | බදුල්ල | 40 |
| කලුතර | 40 | ත්‍රිකුණාමලය | 40 |
| රත්නපුර | 40 | පුත්තලම | 40 |

දත්ත රැස් කිරීම සිදු කෙරෙමින් පවතින අතර පොලිස් බල ප්‍රදේශ කිහිපයක මූලික තොරතුරු සපයන්නන්ගෙන් තොරතුරු ලබා ගන්නා ලදි.





2015 දෙසැම්බර් වන විට සම්පූර්ණ කරන ප්‍රශ්නාවලි 890ක් ලැබී ඇති අතර එම දත්ත පරිගණකගත කරන ලදි. තෝරාගත් පොලිස් බල ප්‍රදේශ 15 ක සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි.

**6. මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන් පිළිබඳ සමීක්ෂණය**

මෙම සමීක්ෂණයේ මූලික අරමුණ වූයේ, මත්ද්‍රව්‍ය එන්නත් කරගනු ලබන්නන් හඳුනාගැනීම, හා ප්‍රවණතාවය මැනබැලීමත් ඒ තුළින් එන්නත් කරගන්නන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමටත්, ඉහළ ප්‍රවණතාවක් සහිත ප්‍රදේශ හඳුනාගෙන එම පුද්ගලයින් ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා යොමු කිරීමයි.

දත්ත රැස්කිරීමට අදාලව ක්ෂේත්‍ර සමීක්ෂකයන් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් 2015 පෙබරවාරි 18 දින සහ 2015 මාර්තු 03 වන දින පවත්වන ලදි.

2015 මැයි 08 වන දින පෙ. ව. 9.00 ට ග්‍රාමනිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදි.

2015 මාර්තු 27 වන දින මත්ද්‍රව්‍ය එන්නත්කර ගන්නන්ගෙන් දත්ත රැස්කිරීම සඳහා ග්‍රාමනිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී. ග්‍රාමනිලධාරීන් 12 දෙනෙකු සහභාගී වූ අතර කොළඹ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවත්වූ වැඩසටහන සඳහා ග්‍රාමනිලධාරීන් 14 දෙනෙකු සහභාගී විය.

**7. මත්ද්‍රව්‍ය අධිමාත්‍රික වූවන් පිළිබඳ සමීක්ෂණය**

මත්ද්‍රව්‍ය අධිමාත්‍රික වූවන් පිලිබඳ සමීක්ෂණයක් පර්යේෂණ අංශය විසින් එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) සමඟ එක්ව සිදුකරන ලදි. UNODC ආයතනය විසින් අධිමාත්‍රික වීම පිලිබඳ පර්යේෂණ අංශයේ සහ බාහිර සේවා අංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි. ප්‍රදේශ 20ක් තෝරාගෙන දත්ත එක්රැස් කිරීමට ක්ෂේත්‍ර සමීක්ෂකයන් පුහුණු කිරීමේ වැඩමුළුවක් 2015 පෙබරවාරි මස 05 වන දින පවත්වන ලදි. සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි තුලින් ලබා ගත් දත්ත පර්යේෂණ වාර්තා සකස් කිරීම සඳහා UNODC ආයතනය වෙත ලබා දෙන ලදි.

## 8. පාසල් සිසුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය.

පර්යේෂණ අංශය විසින් පාසල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමට සැලසුම් කරන ලදී. නියැදිය ලෙස දිස්ත්‍රික්ක 15ක් මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතා ආශ්‍රිත වාර්තා වලින් ලබා ගන්නා ලදී. ස්ථරායන නියැදි ක්‍රමය යොදා ගනිමින් පාසල් 100 කින් පාසල් ළමුන් 1000ක් යොදාගෙන මෙම සමීක්ෂණය සිදු කිරීමට සැලසුම් කර ඇත.

| දිස්ත්‍රික්කය | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 15 | 145 |
| ගම්පහ | 13 | 131 |
| කුරුණෑගල | 12 | 120 |
| නුවර | 10 | 103 |
| ගාල්ල | 08 | 83 |
| කළුතර | 08 | 81 |
| රත්නපුර | 08 | 76 |
| අනුරාධපුර | 07 | 68 |
| පුත්තලම | 06 | 59 |
| යාපනය | 05 | 50 |
| හම්බන්තොට | 05 | 48 |
| මොනරාගල | 03 | 35 |
| එකතුව | 100 | 1000 |

### කැලණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සඳහා පර්යේෂණ පුහුණු පැවැත්වීම

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව විශේෂවේදී උපාධිය හදාරන විද්‍යාර්ථයින් 06 දෙනෙකු 2015 අගෝස්තු 31 දින සිට 2015 නොවැම්බර් 24 දක්වා පුහුණු කිරීම් සිදු කරන ලදි. පර්යේෂණ ක්‍රම වේද, දත්ත රැස්කිරීම, දත්ත පරිගණක ගතකිරීම සඳහා පුහුණු කරවන ලදි.







### ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ලෝක සෞඛ්‍ය සංවිධානය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය එක්ව පහත අයුරින් ව්‍යාපෘති තුනක් 2015 වසර තුළ ක්‍රියාත්මක කල අතර පර්යේෂණ අංශය මඟින් එම ව්‍යාපෘති සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කරවීම හා අධීක්ෂණය සිදුකරනු ලැබීය. ඒවායේ සාරාංශයක් පහත ඉදිරිපත් කර ඇත.

**මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන් සඳහා වූ ප්‍රතිකාරමය වැඩසටහන SESRL 1408462**

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මත්ද්‍රව්‍ය භාවිත කරන කාන්තාවන් සඳහා වූ ගොඩවැදීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා අරමුදල් සපයන අතර සෞඛ්‍යය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ඉහළ ප්‍රවණතාවක් ඇති ප්‍රදේශ තෝරා ගෙන මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම හා ප්‍රතිකාර ලබාදීමට මූලික වී ක්‍රියාකරනු ලබයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය එක්ව සමාජ රෝග/ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 15ක් සහ ක්ෂය රෝගය සම්බන්ධ සෙම පටල පරීක්ෂණ කොම්පඤ්ඤවීදිය, දෙහිවල, පිටකොටුව හා ගල්කිස්ස යන ප්‍රදේශ මුල්කරගෙන පවත්වන ලදී. කාන්තාවන් සඳහා අත්පත්‍රිකා බෙදා දෙමින් ක්ෂය රෝගය හා එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීම් කරන ලදී.



**අන්තර් ජාතික මාදක පාලක මණ්ඩලය (INCB)**

ශ්‍රී ලංකාව බැඳී සිටි අන්තර්ජාතික සම්මුතීන්ට සහාය දැක්වීමක් වශයෙන් සහ අවනතවීමක් වශයෙන් මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව **INCB** ආයතනය වෙත පහත වාර්තා සම්පාදනය කරන ලදී. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ අංශය, අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යවනු ලබන ශ්‍රී ලංකාවේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ හා ඒ ආශ්‍රිත පැන නගින කරුණු පිළිබඳ වගකීම් දරනු ලැබේ. එසේම වර්ෂය තුලදී පහත සඳහන් වාර්තා අදාළ ආයතන වෙත යවනු ලබයි.

අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය, වෛද්‍ය සැපයුම් අංශය, වෛද්‍ය තාක්ෂණ අංශය සමඟ තොරතුරු ගෙන්වා ගැනීමට අදාලව ලිපි ලේඛන සකස් කරන ලදි. පහත පෝරම අන්තර්ජාතික මාදක පාලක මණ්ඩලය වෙත යවන ලදි.

**මාසිකව යවන ලද දත්ත**

- ඳූනාගත් මත්ද්‍රව්‍ය වැටලීම් (පෝරම **DND/SDS**)

**ත්‍රෛමාසිකව යවන ලද දත්ත**

- මාදක ඖෂධ ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය A) 4 වන කාර්තුව 2012 සහ 1 කාර්තුව, 2 කාර්තුව, 3 කාර්තුව 2015
- 1971 සම්මුතීන් ලැයිස්තු 2 හි සඳහන් මනෝවර්තක ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය **A/P**) 4 වන කාර්තුව 2012 සහ 1 කාර්තුව, 2 කාර්තුව, 3 කාර්තුව 2015)

**ාදක ඖෂධ පිළිබඳ අවශ්‍යතා ඇස්තමේන්තු**

- 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතීන් ලැයිස්තු 2 හි අඩංගු වෛද්‍යමය හා විද්‍යාත්මක අවශ්‍යතා සඳහා වන ඖෂධ වර්ග (පෝරමය B/P)

**වාර්ෂිකව යවන ලද දත්ත**

- මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය නිෂ්පාදනය, පරිභෝජනය, ගබඩා කිරීම හා වැටලීම් පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය C)
- මනෝවර්ථක ද්‍රව්‍ය නීතිවිරෝධීව නිෂ්පාදනය සඳහා ඉවහල්වන රසායන ද්‍රව්‍ය පිළිබඳ වාර්ෂික තොරතුරු (පෝරමය D)
- මනෝවර්ථක ද්‍රව්‍ය පිළිබඳ සංඛ්‍යාලේඛන (පෝරමය P)
- වාර්ෂික වාර්තා ප්‍රශ්නාවලිය (පෝරමය E)

1. නීතිමය හා ආයතනික රාමුව

2. මත්ද්‍රව්‍ය ඉල්ලුම හා සැපයුම අවම කිරීම සඳහා වූ සූක්ෂම එළඹුම

3. මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ රටාව හා ප්‍රවණතාවය හඳුනා ගැනීම.

4. මත්ද්‍රව්‍ය වගාකිරීම්, නිෂ්පාදනය කිරීම් හා වැටලීම් සම්බන්ධයෙන් පවතින රටා හා ප්‍රවණතා හඳුනා ගැනීම

**විනාශ කරන ලද අන්තරායකර ඖෂධ පිළිබඳ මාසික වාර්තාව**

අධිකරණ සේවා කොමිෂන් සභා පනත අනුව විනාශ කරන ලද මත්ද්‍රව්‍ය පිළිබඳ වාර්තාවක් අධිකරණ මගින් මණ්ඩලයේ පර්යේෂණ අංශය වෙත එවනු ලැබේ.

| 2015.01.01 - 2015.12.31 (ලැබී ඇති දත්ත අනුව) | | |
|---|---|---|
| මත්ද්‍රව්‍ය | ප්‍රමාණය **(mg)** | වාර්තා කළ අධිකරණයේ නම |
| හෙරොයින් | 54391 | කුරුණෑගල ම. අධිකරණය |
| ගංජා | 199973 | කුරුණෑගල ම. අධිකරණය |
| හෙරොයින් | 230.04 | බිබිල ම. අධිකරණය |
| ගංජා | 10880 | පීලැස්ස ම. අධිකරණය |
| ගංජා | 20873 | බිබිල ම. අධිකරණය |
| එකතුව (හෙරොයින්) | **54621.04** | |
| එකතුව (ගංජා) | **231726** | |

**මත්ද්‍රව්‍ය උපදේශන සහතික පත් පාඨමාලාව**

මණ්ඩලයේ අධ්‍යාපන හා උපදේශන කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව පර්යේෂණ අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල උපදේශන සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර වල නියැලෙන්නන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට, වැනි විවිධ ඉලක්කගත පුද්ගලයන්ට මත්ද්‍රව්‍ය උපදේශන සහතිකපත් පාඨමාලාව 2012 වර්ෂයේ මාර්තු මස ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳ වෘත්තීමය වශයෙන් දැනුමක් ලබා දීමත් උපදේශන කටයුතු හරහා දැනුම වර්ධනය කර ගැනීමටත් අවකාශය ලබා දීම මෙහි මූලික පරමාර්ථය වේ. වර්ෂය තුළදී පාඨමාලා 7 ක් පවත්වන ලදී.





සහතික පත්‍ර ප්‍රදානය කරමින් ............




**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ "Newsletter" කාර්තුමය සඟරාව**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තොරතුරු/ සේවාවන් අනෙක් ආයතන සමඟ හුවමාරු කර ගැනීමේ අරමුණින් ත්‍රෛමාසික පුවත් හසුනක් නිර්මාණය කර එළිදක්වන ලදි. මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ අදහස් ලිපි ලේඛන ද කලා නිර්මාණ ද ඇතුළුව මත්ද්‍රව්‍ය පාලනය, නිවාරණය, ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ පර්යේෂණ තොරතුරු මෙහි ඇතුළත් වේ. 2015 වර්ෂය තුළ දොළොස්වන සඟරාව එළිදක්වනු ලැබූ අතර අදාළ ආයතන සඳහා බෙදා හරින ලදි.

**දින සියයයි වැඩ දහසයි ග්‍රන්ථය එළි දැක්වීම**




පර්යේෂණ අංශය විසින් නව රජයේ දින 100 වැඩසටහන යටතේ, සභාපතිතුමාගේ සංකල්පයක් මත සියළු අංශවල සිදු කළ කාර්යයන් ඇතුළත් ග්‍රන්ථයක් එළි දක්වන ලදි. සියළු අංශ නියෝජනය වූ පරිදි මෙම ග්‍රන්ථය තුළ කාර්යයන් 3545 ක් ඇතුළත් විය.

**මත්ද්‍රව්‍ය භාවිතයට හා ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය වෙනුවෙන් සමරු කලාපය නිකුත් කිරීම**

පර්යේෂණ අංශය විසින් මත්ද්‍රව්‍ය භාවිතයට හා ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය වෙනුවෙන් 2015 ජුනි 26 සමරු කලාපයක් මුද්‍රණය කරන ලදි. වෙළඳ දැන්වීම් තුළින් රුපියල් 253,000.00 ක් මණ්ඩලය වෙත උපයා දෙන ලදි. සමරු කලාපය සැමරුම් උළෙලට සහභාගී වූවන්ට සහ අනුග්‍රාහක ආයතන වෙත බෙදා දෙන ලදි.

**තොරතුරු තාක්ෂණ අංශය**

තොරතුරු තාක්ෂණ අංශය විසින් 2015 වර්ෂය ඇතුළත ප්‍රතිකාර හා පොලිස් සුරාබදු සමීක්ෂණ පත්‍රිකා වල දත්ත ඇතුළත් කිරීම අවසන් කර ඇත. පහත සඳහන් වාර්තා එම දත්ත ඇසුරෙන් ප්‍රකාශයට පත් කරන ලදි.

- මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යා ලේඛන වාර්තාව 48 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 94 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 95 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 96 වෙළුම
- මත්ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාරවලට ඇතුළත් වූවන් පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තාව 97 වෙළුම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය තුළ ඇති සියළුම අංශවල හා මධ්‍යස්ථාන වල පවතින පරිගණක වල පවතින දෝෂ හඳුනා ගෙන ඒවා පිළිසකර කිරීමේ කාර්යයන් තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලදි.

1984 ක්ෂණික ඇමතුම් අංකයට ලැබෙන පැමිණිලි සුපරීක්ෂණය කර, විද්‍යුත් තැපැල හරහා ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ ආයතන වලට ලබා දීමට කටයුතු කරන ලදි.

සහතික පත්‍ර/ අත් පත්‍රිකා නිර්මාණය කරන ලදි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වෙබ් අඩවිය දිනපතා යාවත්කාලීන කරන ලදි.

**මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කලමනාකරණ පද්ධතිය නවීකරණය කිරීම**

කොළඹ විශ්ව විද්‍යාලීය පරිගනක අධ්‍යාපන ආයතනය විසින් මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කලමනාකරණ පද්ධතිය සඳහා නව පද්ධතියක් සකස් කරන ලදි. මෙහි පළමු අදියර ප්‍රධාන කාර්යාලයේ පරිගණක අංශය වෙත ලබා දෙන ලදි.







දත්ත පද්ධතියේ දෙවන අදියර ආරම්භ කිරීම

බාහිර සේවා අංශයේ දත්ත පද්ධතිය සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සකස් කරන ලදි.

**ජංගම මත්ද්‍රව්‍ය නිවාරණ ව්‍යාපෘතිය**

මත්ද්‍රව්‍ය ආශ්‍රිත තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා ක්ෂණික දුරකතන අංක 02 ක් තිබෙන අතර මේ සඳහා ලැබෙන දුරකතන ඇමතුම් වලට දෛනිකව විස්තර ගැනීමට සිදු වී තිබේ. ඒ සඳහා 1984 තොරතුරු කේන්ද්‍රය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය මොබිටෙල් ආයතනය හා එක්ව ආරම්භ කර තිබේ. 2015 වර්ෂය තුළදී ඒ සඳහා වූ යෝජනාවලිය සකස් කර අනුමැතිය ලබා ගන්නා ලදි.

**පාසල් වල මත්ද්‍රව්‍ය නිවාරණ පණිවිඩ ප්‍රදර්ශනය කිරීම**

2012 වර්ෂයේ සිට පාසල් තාප්පවල මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩ ප්‍රදර්ශනය කිරීම පර්යේෂණ අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. 2015 වර්ෂය තුළදී පාසල් 4ක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලදි.

## 8.3 ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය

මණ්ඩලයේ සේවාවන් අතර ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය මගින් ලබා දෙන සේවාවන්ද සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. පෙර වර්ෂවල මෙන්ම මෙම වසරේද මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය කිරිමෙහිලා ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් කැපීපෙනෙන සේවාවක් සිදුකරන ලදී. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම නිසා විවිධ ප්‍රශ්න වලට මුහුණ දුන් මත්ලෝලීන් එම ගැටළු වලින් මුදවා ගැනීම, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වල සමාජිකයින්ට සහනයක් ලබා දීම, ඔවුන් ගේ හැකියාවන් ශක්තිමත් කිරීම, අධ්‍යාත්මික සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය ආදි ගුණාත්මක වෙනසක් මඟින් ප්‍රතිකාර ක්‍රියාවලිය පෝෂණය කරන ලදි.

ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට සේවාලාභින් ඇතුලත් කර ගැනිමේදී පසුගිය වසරේ අනුගමනය කල වර්ගීකරණයම මෙම වසරේදී අනුගමනය කරන ලදී. 2015 පෙබරවාරි මස සිට මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා සේවාලාභින් සඳහා පිලියන්දල තුම්බෝවිල ප්‍රදේශයේ නව ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනලදී.

ඒ අනුව මෙම වසරේ මණ්ඩලයේ නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩ සටහන ප්‍රතිකාර මධ්‍යස්ථාන 5 ක් මඟින් ක්‍රියාත්මක කරන ලදී.

එනම්,

| | |
|---|---|
| මධ්‍යම පළාත් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය | මහනුවර |
| දකුණු පළාත් ප්‍රතිකාර මධ්‍යස්ථානය | ගාල්ල |
| බස්නාහිර පළාත් ප්‍රතිකාර මධ්‍යස්ථානය | තලංගම |
| නවදිගන්ත ප්‍රතිකාර මධ්‍යස්ථානය | නිට්ටඹුව |
| ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | පිළියන්දල |

වයස අවුරුදු 21 ට අඩු සේවාලාභීන් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය වූ මහනුවරටත්
මත්ද්‍රව්‍ය භාවිත කාලය 0 අවු: 6 අතර ගාල්ල පුනරුත්ථාපන මධ්‍යස්ථානයටත්
මත්ද්‍රව්‍ය භාවිත කාලය අවු: 6-12 අතර තලංගම මධ්‍යස්ථානයටත්
මත්ද්‍රව්‍ය භාවිත කාලය අවු: 12 වැඩි අය නවදිගන්ත මධ්‍යස්ථානයටත්
මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නා සේවාලාභීන් පිලියන්දල මධ්‍යස්ථානයටත් වශයෙන් යොමු කරන ලදී.

**ප්‍රතිකාර වැඩසටහන සඳහා ඇතුළත් කරගැනිම**

ඉහත වර්ගීකරණයට අනුව සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් ඇතුලත් කර ගැනිම සිදුකල අතර සුපුරුදු පරිදි මෙම වසරේ ද සිය කැමැත්තෙන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත්වීම්, භාරකරුවන්ගේ ඉල්ලීම් මත ඇතුලත් කිරීම්, අධිකරණය සහ ප්‍රජාවිශෝධන ආයතන මඟින් ඇතුලත් කිරීම්, වෙනත් රජ්‍ය ආයතන දැනුවත් කිරිම මඟින් ඇතුලත් කිරීම් බාහිරසේවා මඟින් අතුලත් කර ගැනීම් බහුලව දක්නට ලැබුනි. ඉහත සියළු ඇතුලත් කිරීම් අපගේ පලපුරුදු උපදේශක වරුන්ගේ මැදිහත්වීම් මත සිදුකල අතර පූර්ව උපදේශන සැසි උපයෝගිකර ගනිමින් සේවාලාභීන් නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත්කර ගන්නා ලදී.

ඊට අමතරව 2007 අංක 54 දරණ (ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත අනුව අධිකරණය මඟින් පුනරුත්ථාපන කාර්යාංශය වෙත යොමුකරන සේවාලාභීන් කන්දකාඩු ප්‍රදේශයේ පිහිටා ඇති පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යොමුකල අතර අවශ්‍ය අවස්ථාවලදී අපගේ සේවය ඔවුන් වෙත ලබාදෙන ලදී.

**ප්‍රතිකාර වැඩසටහනෙහි කාලය**

සමස්ථයක් වශයෙන් ගත්කල අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල නේවාසික ප්‍රතිකාර කාලය අවම මාස 3 කි. කිසියම් සේවාලාභියෙක් නේවාසික ප්‍රතිකාර වැඩ සටහන සාර්ථක අයුරින් නිමකලහොත් ඔහුට මාස 3 අවසානයේ නේවාසික ප්‍රතිකාර වැඩසටහනින් සමුගත හැක. එහෙත් උපදේශකවරයාගේ සහ අනෙකුත් කාර්යය මණ්ඩලයේ ප්‍රගති තක්සේරුව අනුව ඔහු තව දුරටත් පුද්ගල සංවර්ධනය කල අයෙකු නම් ඔහුගේ ප්‍රතිකාර කාලය දීර්ඝ කරන ලදී.

### ප්‍රතිකාර වැඩසටහන

නේවාසික ප්‍රතිකාරය සඳහා ඇතුලත් කර ගත් පසු සෑම මධ්‍යස්ථානයක්ම ඒ ඒ සේවාලාභියාට අනුරූප වන අයුරින් ප්‍රතිකාර සැලැස්මක් උපයෝගීකර ගනිමින් ප්‍රතිකාර සේවය ලබා දෙන ලදි. විශේෂයෙන්ම සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයක්ම මනෝචිකිත්සක ප්‍රතිකාර ක්‍රමය උපයෝගී කරගනිමින් ඔවුන්ට අදාල සේවාවන් සැපයූහ. මත්ලෝලියා ගේ ගැටළු හඳුනා ගැනීම, ගැටළු නිර්වචනය කරගැනීම, ගැටළු විශ්ලේෂණය තුලින් ඔවුන්ට ගැලපෙන ප්‍රතිකාර සැලැස්ම උපදේශක, සහකාර උපදේශක වරුන්ගේ මැදිහත්වීම යටතේ සකස්කර උපදේශන සහායක වරුන්ගේ ද සහය ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී පුද්ගල උපදේශනය, කණ්ඩායම් උපදේශනය, පවුල් උපදේශන, වෘත්තීය මාර්ගෝපදේශනය, ආත්ම අභිමානය ඇති කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම්, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසාවූ උපදේශනයන්, පරිසර රසවින්දනය ආශ්‍රිත ක්‍රියාකාරකම්. වින්දනාත්මක ගුණාංග සංවර්ධනය වැනි සේවාලාභීයා සතු වූ විවිධ හැකියාවන් දියුණු කර ලීමේ අරමුණෙන් වූ ප්‍රතිකාර සැලැස්මක් උපයෝගි කරගැනීම මඟින් අදාල සේවාවන් ලබා දෙන ලදී.

### දෛනික වැඩසටහන

සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් සඳහා පොදු දෛනික වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදි. පෙ.ව. 5.30 සිට රාත්‍රි 10.00 දක්වා දිවෙන මෙම වැඩසටහන උදෑසන හමුව, භාවනා වැඩසටහන්, එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩා වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, වෘත්තීය පුහුණු වැඩසටහන්, නිශ්ශබ්ද කාලය, විනෝදාත්මක වැඩසටහන්, පුද්ගල සහ කණ්ඩායම් උපදේශන සැසි, සැඳෑ හමුව වැනි විවිධ ක්‍රියාකාරකම් මෙම වැඩසටහනෙහි අන්තර්ගතව ඇත. අපගේ සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සුවිශේෂී වැඩසටහන් නොමැති අවස්ථාවල ඉහත දෛනික වැඩ සටහන මධ්‍යස්ථාන තුල ක්‍රියාත්මක කළහ.

### අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන

මත්ලෝලීන් තුලින් ගිලිහී ගිය අධ්‍යාත්මික චර්යාවන් යලිත් පෝෂණය කිරීමේ අරමුණින් අප ගේ සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. සෑම පුර පසලොස්වක පොහොය දිනකම සෑම මධ්‍යස්ථානයකම නේවාසික සේවාලාභීන් අටසිල් සමාදම් කරවීම, ඔවුන් ධර්ම දේශනා සඳහා සවන් දීමට යොමුකිරීම. ආගමික සිද්ධස්ථාන වලට රැගෙන යාම, ප්‍රතිකාර මධ්‍යස්ථාන මූලිකත්වයෙන් බෞද්ධාලෝක මාවත තුල වෙසක් කුඩු නිර්මාණ තරඟ, මධ්‍යස්ථානවල වෙසක් කාඩ් සහ වෙසක් කුඩු නිර්මාණය සේවාලාභීන් දානමය පිංකම් සඳහා යොමු කිරීම, පොසොන් උත්සවය ආශ්‍රීත ක්‍රියාකාරකම් ඒ අතර වේ. මෙම වසරේ බෞද්ධාලෝක මාවතෙහි පැවැත්වූ වෙසක් කුඩු නිර්මාණ තරඟයෙන් නවදිගන්ත ප්‍රතිකාර මධ්‍යස්ථානය දෙවැනි ස්ථානය ලබා ගැනීම සේවාලාභීන් සහ කාර්යය මණ්ඩලය ලත් සුවිශේෂි ජයග්‍රහණයක් වේ.



**පොහොය දින සීල ව්‍යාපාර වැඩසටහන නවදිගන්ත මධ්‍යස්ථානය**

### වෘත්තිය පුහුණු වැඩසටහන්

මෙම වසරේ ද සෑම ප්‍රතිකාර මධ්‍යස්ථානයකම සේවාලාභීන් සඳහා විවිධ වූ වෘත්තීය පුහුණු ක්‍රියාකරකම් සිදුකරන ලදි. දෛනික ප්‍රතිකාර වැඩසටහන ක්‍රියාත්මක වන අතරතුර සේවාලාභීන්ගේ දායකත්වය මත වසර පුරාම මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලදි. සෑම මධ්‍යස්ථානයකම ප්‍රතිකාර ක්‍රියාකාරකමක් වශයෙන් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කලහ.

| මධ්‍යස්ථානය | ක්‍රියාත්මක කල පුහුණු වැඩසටයන් |
|---|---|
| යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය | ලියුම් කවර සැකසීම, කඩදාසි කවර සැකසීම, කෘෂි කටයුතු, ඇන්තුරියම් වගාව, ඕකිඩ් වගාව, මෝටර් කාර්මික. |
| තලංගම මධ්‍යස්ථානය | පාපිසි සැකසීම, ලියුම් කවර සැකසීම, කඩදාසි මල් සැකසීම, ඕකිඩ් වගාව, කොට්ටා උර මැසීම, කෘෂිකටයුතු, මෝටර් කාර්මික, පරිගණක අලුත්වැඩියාව, රූපලාවන්‍ය. |
| නවදිගන්ත මධ්‍යස්ථානය | ඉදල් සැකසීම, මල් වගාව (ඕකිඩ්, ඇන්තුරියම්* හතු වගාව, කෘෂි කටයුතු, මල්පෝච්චි සැකසීම, මෝටර් කාර්මික. |
| ගාල්ල මධ්‍යස්ථානය | ලියුම් කවර සැකසීම, පාපිසි නිර්මාණය, කොට්ටා උර සැකසීම, කෘෂි කටයුතු, පොල්කටු ආශ්‍රිත නිර්මාණ, මල් පෝච්චි සැකසීම, ඕකිඩ්, මෝටර් කාර්මික, විදුලි කාර්මික. |
| පිලියන්දල මධ්‍යස්ථානය | ලියුම් කවර සැකසීම, කෘෂි කාර්මික කටයුතු |



**මෝටර් කාර්මික පුහුණුව - නුවර මධ්‍යස්ථානය**

**විශේෂිත වැඩසටහන්**

ප්‍රතිකාර සහ දෛනික වැඩසටහනට අමතරව සෑම මධ්‍යස්ථානයකම සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා වසර තුල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කලහ. රචනා තරඟ, චිත්‍ර තරඟ, විනෝද චාරිකා වලට සහභාගි කරවා ගැනීම. මසකට වරක් පැවැත්වෙන පැදුරු පාටිය වැනි සුවිශේෂී වැඩසටහන් මෙයට අයත්ය. ආගමික උත්සව ක්‍රීඩා තරඟ, බැති ගී ප්‍රසංග වසර අවසාන ප්‍රාසාංගික වැඩසටහන්, අභිප්‍රේරණ වැඩසටහන් ද ඒ අතර වේ.



**ශ්‍රමදාන වැඩසටහනක් - නවදිගන්ත මධ්‍යස්ථානය**

**ආදායම් උත්පාදනය**

මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල 2015 වසරේ ද ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ග දෙකක් දක්නට ලැබිනි. පොල්වගාව තුලින් ලබා ගන්නා ලද අදායම සහ ගෙවීම් පදනම මත ප්‍රතිකාර සඳහා ඇතුලත් වූ සේවාලාභින්ගෙන් ලැබූ ආදායම් වශයෙනි.

**උපදේශන සහ ප්‍රතිකාරසේවා සැපයීම**

මෙම වසරේ මණ්ඩලය මඟින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් 2752 දනෙක් සඳහා ප්‍රතිකාර සේවා සැපයීම් සිදුකරන ලදී. මින් 1605 දෙනෙක් සඳහා අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් උපදේශන සේවා සපයා ඇති අතර නේවාසික ප්‍රතිකාරයට ඇතුලත් කර ගත් මුළු සංඛ්‍යාව 957 කි. බාහිර සේවා අංශය මඟින් 957 ද බන්ධනාගාර වැඩසටහන ආශ්‍රිත ප්‍රතිකාර සේවා සැපයීම මඟින් 1147 ලෙසද වාර්තාවේ.

**බස්නාහිර පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය තලංගම**

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 50 කට නේවාසික ප්‍රතිකාරය ලබා දිය හැකිය. මධ්‍යස්ථාන ප්‍රතිකාර වැඩසටහන අංශ 3 කින් සමන්විත වේ. සමාන්‍ය අංශය, ගෙවීම් අංශය, කාන්තා අංශය වශයෙනි. මධ්‍යස්ථානය මඟින් 2015 වසරේ සේවාලාභීන් 592 දෙනෙක් සඳහා උපදේශන කටයුතු සිදුකර තිබූ අතර සමාන්‍ය අංශය මඟින් සේවාලාභීන් 340 ක් සඳහා ද ගෙවීම් අංශය මඟින් සේවාලාභීන් 212 ක් සඳහා ද කාන්තා අංශය මඟින් සේවාලාභීන් 40 ක් සඳහා ද උපදේශන කටයුතු ලබා දී තිබුනි.

ඔවුන් අතරින් ප්‍රතිකාර සඳහා ඇතුලත් කරගත් මුළු සංඛ්‍යාව 270 කි. සාමාන්‍ය අංශය මඟින් සේවාලාභීන් 122 ක් ද ගෙවීම් අංශය මඟින් සේවාලාභීන් 124 ක්ද කාන්තා අංශය මඟින් සේවාලාභීන් 24 ක් සඳහා ද ප්‍රතිකාර කටයුතු ලබා දී තිබුනි.

**මෙම මධ්‍යස්ථානයේ ප්‍රතිකාර වැඩසටහන මඟින් ක්‍රියාත්මක කල විශේෂිත වැඩසටහන්**

සෑම පුර පසලොස්වක පොහොය දිනකම සිල්සමාදන් වැඩසටහන් හා ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා පැවැත්වීම.

මාසික දෙමාපිය හමුව සහ පසු රැකවරණ හමු පැවැත්වීම.

සේවාලාභීන්ගේ රසවින්දනය සඳහා පැදුරු පාටි පැවැත්වීම. සංගීත වැඩසටහන් පැවැත්වීම.

ක්ෂයරෝග මර්ධන වැඩසටහන් සඳහා කාර්යය මණ්ඩල සහ සේවා ලාභීන් දැනුවත් කිරීම. කාර්යය මණ්ඩල පුහුණු සැසි. H.I.V. හා ලිංගාශ්‍රිත රෝග පිළිබඳ විශේෂ දේශන හෙපටයිටිස් සී සඳහා දැනුවත් කිරීම සහ ප්‍රතිකාර කිරීම.

වෙසක් උත්සවය ආශ්‍රිත ආගමික ක්‍රියාකාරකම්. භක්ති ගීත ගායනය, බෞද්ධාලෝක වෙසක්කුඩු තරඟයෙන් ත්‍යාග ගැනීම

සිංහල අලුත් අවුරුදු උත්සවය.

කාන්තාවන් සඳහා උපදේශන සහ ප්‍රතිකාර මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වා ගෙන යෑම.

ඩෙංගු මර්ධන වැඩසටහන් සහ ශ්‍රමදාන.

රූපලාවන්‍ය පිළිබඳ වැඩමුළුව පැවැත්වීම.

එස් 5 වැඩසටහන.

කෘෂිකර්ම කටයුතු වගාව, මල් වගාව.

කාර්යය මණ්ඩල පුහුණු සැසි

ක්‍රීඩා කටයුතු

කොළඹ ක්‍රමය මඟින් නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා පවත්වාගෙන යාම : වැඩිහිටි ඉංග්‍රීසි පංති, පරිගණක පුහුණුව, ජංගම දුරකථන අලුත්වැඩියාව

නත්තල් උත්සවය

වසර අවසන් සාදය

**මධ්‍යම පළාත් (යොවුන්) ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය මහනුවර**

මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 40 දෙනෙකුට එකවර සේවය ලබා දිය හැකිය. මෙම වසරේ මෙම මධ්‍යස්ථානය මඟින් සේවාලාභීන් 150 දෙනෙක් සඳහා උපදේශන කටයුතු ලබා දී තිබූ අතර ඉන් 88 ක් සඳහා නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දෙන ලදී. 2012 සැප්තැම්බර් මස සිට මෙම මධ්‍යස්ථානය යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය ලෙස නම් කර ඒ වන විට කොට්ටාව මධ්‍යස්ථානයේ සිටි සියලුම නේවාසික සේවාලාභීන් මෙම මධ්‍යස්ථානයට අනුයුක්ත කරන ලදී.




දෙමව්පිය වන්දනාව - ගාල්ල මධ්‍යස්ථානය

මධ්‍යම පළාත් යොවුන් ප්‍රතිකාර මධ්‍යස්ථානය මඟින් පහත සඳහන් සුවිශේෂී වැඩසටහන් මෙම වසර තුල ක්‍රියාත්මක කරන ලදී.

- සේවාලාභීන්ගේ චින්තන හැකියාවන් සංවර්ධනය සඳහා මසකට දෙවතාවක් ක්ෂේමභූමි සමිතිය පැවැත්වීම හා ක්ෂේමභූමි සඟරාව එළිදැක්වීම.
- සේවාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධන ක්‍රියාවලිය සඳහා මසකට වරක් සිල්සමාදන් වීමේ වැඩසටහන, හේන්දෙනිය රජමහා විහාරයේ ශ්‍රමදානය, මහාසංඝරත්තනය වැඩමවා ධර්ම දේශනා පැවැත්වීම,
- ඔවුන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහා විවාද තරගාවලි, ඉංග්‍රීසි පංති පැවැත්වීම, ප්‍රශ්නවිචාරාත්මක වැඩසටහන්, නැටුම් පංති, රචනා තරඟ, චිත්‍ර තරඟ, අ.පො.ස (ස.පෙල) විභාගය සඳහා සුදානම් කරවීම, සංගීත පංති,
- පවුල් සබඳතා ගොඩනැගීම සඳහා සෑම සමසකට වරක් දෙමාපියහමු පැවැත්වීම. රසාස්වාදය දියුණු කිරීම උදෙසා චිත්‍රපටි නැරඹීම, පැදුරු සාද පැවැත්වීම, හැකි නම් අඳින්න වැනි කාණ්ඩායම් ක්‍රියාකාරකම්, සැදෑ හමු, විවිධ නාට්‍ය රඟ දැක්වීම්, කෙටි කථා, ගීත ගායනා, වැනි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- ආගමික චාරිකා වශයෙන් ගඩලාදෙනිය, ඇම්බැක්කේ, ලංකා තිලක රජමහා විහාරස්ථාන වන්දනා කිරීම.
- සිංහල අළුත් අවුරුදු උත්සවය සැමරීම, ඒ සඳහා විවිධ ජන ක්‍රීඩා පැවැත්වීම, වෙසක් උත්සවය සඳහා භක්ති ගීත ගායනය සහ ආගමික වැඩසටහන් පැවැත්වීම, බෞද්ධාලෝක වෙසක් කූඩු තරඟයෙන් ත්‍යාග ලබා ගැනීම.
- වොලිබෝල්, ටේබල් ටෙනිස්, කැරම් ක්‍රිකට්, දාම්, චෙස්, බැඩ්මින්ටන් තරඟාවලි පැවැත්වීම.
- මාසික සහ සති පතා කාර්යය මණ්ඩල හා ප්‍රතිකාර හමු පැවැත්වීම.
- එස් පහ වැඩසටහන වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.
- පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සහ වෙනත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්.
- විවිධ සෞඛ්‍ය වැඩසටහන් දන්ත සායන, ඩෙංගු මර්ධන ශ්‍රමදාන, මනෝ වෛද්‍ය විශේෂඥ අරඹේපොල මිය විසින් මානසික සෞඛ්‍ය පිළිබඳ දේශන පැවැත්වීම.
- ලෝක ළමා දිනයට සමගාමී විශේෂිත ක්‍රියාකාරකම්.
- වෘත්තීය පුහුණුව වශයෙන්, ලියුම් කවර, ඕකිඩ් වගාව ආශ්‍රිත ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික කටයුතු, මෝටර් කාර්මික පුහුණුව.
- අබින වැඩසටහන
- වසර අවසානයේ නත්තල් උත්සවය සහ දෙසැම්බර් 31 දින වර්ණ රාත්‍රීය පැවැත්වීම
- හෙද පුහුණුව
- වෘත්තීය පුහුණු අධිකාරයේ දැනුවත් කිරීමේ වැඩසටහන
- යෝගා වැඩසටහන

## දකුණු පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ගාල්ල

මෙම මධ්‍යස්ථානය මඟින් ද එකවර සේවාලාභීන් 40 කට සේවය සැපයිය හැකිය. ඒ අනුව දෛනිකව මෙම වසර තුල සේවාලාභීන් 233 ක් සඳහා උපදේශන කටයුතු ද 143 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර කටයුතු සඳහා ද ඇතුලත් කරගෙන තිබුනි.

මෙම මධ්‍යස්ථානය මඟින් ද නේවාසික සේවාලාභීන් සඳහා පහත සඳහන් වැඩසටහන් වසර තුල ක්‍රියාත්මක කරන ලදී.



නැටුම් පාඨමාලාව නුවර මධ්‍යස්ථානය

- ඩෙංගු මර්ධන වැඩසටහන්, දන්ත සායන, කායික හා මානසික සෞඛ්‍ය ආශ්‍රිත දේශන මධ්‍යස්ථානය තුල ශ්‍රමදාන කටයුතු.
- මාස්පතා සිල් සමාදන් වැඩසටහන, වෙසක් සහ පොසොන් උත්සව අශ්‍රිත ක්‍රියාකරකම්.
- බෞද්ධාලෝක වෙසක් කුඩු තරඟයෙන් ත්‍යාග ලබාගැනීම මාසික සහ සතිපතා කාර්ය මණ්ඩල සහ ප්‍රතිකාර හමු පැවැත්වීම.
- කෘෂිකාර්මික වැඩසටහන්, ඕකිඩ් වගාව බිම්මල් වගාව, රෝස වගාවන් පිළිබඳ ලබුදූව කෘෂිවිද්‍යාලයේ දේශනයන් සහ ක්‍රියාකාරකම්. විවිධ වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම, මොටර් කාර්මික, ඉලෙක්ට්‍රෝනික්.
- කාර්යය මණ්ඩල පුහුණු සැසි, සතිපතා සහ මාසික කාර්යය මණ්ඩල හමු.
- පවුල් හමු, පසුරැකවරණ හමු.
- යෝගා වැඩසටහන්.
- ලෝක ළමා දින ආශ්‍රීත විශේෂ වැඩසටහන්.
- එස් 5 වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- පළාත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සහ ඊට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
- අවුරුදු උළෙල, වෙසක් පොසොන් උත්සව, නත්තල් උත්සවය ආශ්‍රීත ආගමික ක්‍රියාකාරකම්.
- වොලිබෝල් ක්‍රිකට් කබඩි දාම් චෙස් කැරම් බැඩ්මින්ටන් වැනි ක්‍රීඩා
- කාය වර්ධන වැඩසටහන්
- වසර අවසන් වර්ණ රාත්‍රිය.



කායවර්ධන වැඩසටහන් ගාල්ල මධ්‍යස්ථානය



පාපිසි සැකසීම ගාල්ල මධ්‍යස්ථානය

### නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය නිට්ටඹුව

සේවාලාභීන් 60 කට එකවර සේවය සැපයිය හැකිය. ගෙවීම් අංශයක්ද පවතින අතර 2015 වසරේ උපදේශන සැපයූ මුළු සේවාලාභීන් සංඛ්‍යාව 558 කි. ඉන් 411 දෙනෙක් සඳහා නේවාසික ප්‍රතිකාර ලබා දී තිබුනි.

නවදිගන්ත මධ්‍යස්ථානය මඟින් මෙම වසර තුල පුනරුත්ථාපන වැඩසටහනෙහි පහත ක්‍රියාකරකම් සිදු කරනලදී.

- මාසික සිල්සමාදන් වැසටහන
- සිංහල අලුත් අවුරුදු උත්සවය
- වෙසක්, පොසොන්, නත්තල් උත්සව ආශ්‍රිත ක්‍රියකාරකම්
- ඩෙංගු මර්ධන ආශ්‍රිත ක්‍රියාකාරකම් ශ්‍රමදාන
- බෝධි පුජා වැඩසටහන්
- කාර්ය මණ්ඩල පුහුණු සැසි
- සතිපතා ප්‍රතිකාර හමු
- මාසික කාර්යය මණ්ඩල සැසිය
- පවුල් හමුව
- දොමාපිය හමුව
- එස් පහ වැඩසටහන
- කායික සහ මානසික සෞඛ්‍ය පිළිබඳ දේශන
- විවාද තරග
- වෘත්තීය පුහුණු වැඩසටහන්
- ක්ෂරෝග මර්ධන වැඩසටහන STD,HIV දේශන
- කාය වර්ධන වැඩසටහන්
- යෝග වැඩසටහන්.




### ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිළියන්දල

මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා සේවාලාභීන් වෙනුවෙන් ප්‍රතිකාර ලබා දීම සඳහා මෙම මධ්‍යස්ථානය පෙබරවාරි මස 25 වෙනි දින ආරම්භ කරන ලදී. මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා සේවාලාභීන් 72 ක් සඳහා උපදේශන කටයුතු සිදුකර ඇති අතර ඉන් 45 දෙනෙක් සඳහා නේවාසික වෛද්‍ය පර්යේෂණ ආයතනය මඟින් රුධිර පරික්ෂා කල අතර අදාල රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකාර ද ලබා දුනී. මෙම මධ්‍යස්ථානය මඟින් මෙම වසර තුල පහත ක්‍රියාකරකම් සිදුකරන ලදී.

- [redacted]ද්ගල කණ්ඩායම් සහ පවුල් උපදේශන සැසි
- [redacted]නෝ අධ්‍යාපනික වැඩසටහන්
- [redacted]ුධිර පරීක්ෂාවන් සහ ඩර්ඩන්ස් රෝහල මඟින් ක්ෂය රෝගය සඳහා ප්‍රතිකාර සේවාවන් ලබාදීම
- [redacted]ාගමික වැඩසටහන්
- [redacted]මදාන
- [redacted]ිංහල අළුත් අවුරුදු වැඩසටහන්
- [redacted]ෘෂි කාර්මික කටයුතු

**පසුරැකවරණ වැඩසටහන 2015**

ඒ ඒ මධ්‍යස්ථාන මඟින් 2015 වර්ෂය තුල කරන ලද පසුරැකවරණ තොරතුරු පහතින් දක්වා ඇත. මෙහිදී සේවාලාභීන් මධ්‍යස්ථානයට ගෙන්වා ගැනීම දුරකථන මාර්ගයෙන් තොරතුරු ලබා ගැනීම, බාහිරසේවා වැනි ක්‍රම උපයෝගී කර ගෙන ඇත.

| මධ්‍යස්ථානය | | ජන. | පෙබ. | මාර්. | අප්‍රි. | මැයි. | ජූනි. | ජූලි. | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තලංගම | පසුරැකවරණ | 167 | 41 | 149 | 119 | 143 | 107 | 123 | 99 | - | 129 | 78 | 90 |
| | NR | 102 | 30 | 79 | 69 | 79 | 52 | 76 | 64 | - | 77 | 49 | - |
| | | | | | | | | | | | | | |
| නුවර | පසුරැකවරණ | 57 | 32 | 15 | 51 | 30 | 32 | 21 | 19 | 22 | 60 | 29 | 35 |
| | NR | 44 | 22 | 12 | 40 | 09 | 23 | 14 | 12 | 14 | 40 | 16 | 16 |
| | | | | | | | | | | | | | |
| ගාල්ල | පසුරැකවරණ | 58 | 60 | 129 | 49 | 84 | 63 | 96 | 62 | 35 | 59 | 39 | 63 |
| | NR | 42 | 48 | 74 | 36 | 64 | 42 | 56 | 43 | 30 | 35 | 26 | 27 |
| | | | | | | | | | | | | | |
| නවදිගන්තය | පසුරැකවරණ | 43 | 49 | 44 | 47 | 55 | 86 | 69 | 64 | 67 | 60 | 56 | 53 |
| | NR | 42 | 47 | 43 | 46 | 52 | 81 | 66 | 62 | 65 | 57 | 52 | 49 |
| | | | | | | | | | | | | | |
| පිලියන්දල | පසුරැකවරණ | - | - | - | 09 | 10 | 04 | 04 | 06 | 04 | 12 | 30 | 26 |
| | NR | - | - | - | 09 | - | - | - | 06 | 05 | 12 | 24 | 25 |

NR - මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්

ඉහත සඳහන් තොරතුරු අනුව මෙම වසරේ ප්‍රතිකාර අංශය වෙත වාර්තා වු මුළු පසු රැකවරණ තොරතුරු මත අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන මඟින් කරනු ලැබූ මුළු පසුරැකවරණ සේවාලාභීන් සංඛ්‍යාව 3232 කි.

පසුරැකවරණ කටයුතු කල සේවාලාභීන්ගෙන් තලංගම මධ්‍යස්ථානයේ සේවාලාභීන් 677 ක් ද, නුවර මධ්‍යස්ථානයේ 262 ක් ද, ගාල්ල මධ්‍යස්ථානයේ 523 දෙනෙක්ද, නවදිගන්ත මධ්‍යස්ථානයේ සේවාලාභීන් 662 ක් ද, පිලියන්දල මධ්‍යස්ථානයේ 81 ක් ද මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස්ව සිටි බවට වාර්තා විය. මේ අනුව අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් පමණක් පුනරුත්ථාපනය වී නිදහස් වුවන්ගෙන් 2025 ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් වී ඇත.

**කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන**

කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත අප මණ්ඩලය මඟින් මෙම වසරේ ද සුවිශේෂි සේවාවක් ලබා දෙන ලදී. අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වල සේවාවන්හි නියැලෙන උපදේශන සහකාර නිලධාරි වරුන් ද අපගේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල දීර්ඝ කාලයක් පුහුණුව ලැබූ දෛනික පදනම මත බඳවාගත් උපදේශන සහකාරවරුන් තිදෙනෙකුගේ ද සේවය පූර්ණ කාලීනව ලබා දෙන ලදි.

## 8.4 පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන හා නමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථාන

**ප්‍රතිකාර හා විමර්ෂන**

2007 අංක 54 දරණ පනතට අනුව 2010 වර්ෂය තුල නිකුත් කරන ලද ගැසට් පත්‍රය මගින් මත්ද්‍රව්‍ය සම්බන්ධව බන්ධනාගාර ගත වූ රුදවියන්ගේ පුනරුත්තාපන හා උපදේශන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන 9 ක් නම් කොට ඇත. එනම්,

1. පල්ලේකැලේ
2. වටරැක
3. තල්දෙන
4. වීරවිල
5. අනුරාධපුර
6. පල්ලංසේන
7. කන්දෙවත්ත
8. මීතිරිගල
9. කන්දකාඩු

මෙම නම්කරන ලද මධ්‍යස්ථාන වල මත්ද්‍රව්‍ය උපදේශන කටයුතු සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරින් මෙම මධ්‍යස්ථානයන්ට අනුයුක්ත කොට ඇත.

**පෞද්ගලික මධ්‍යස්ථාන**

1. සුමිත්‍රයෝ උපදේශන මධ්‍යස්ථානය
2. බලය නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය
3. අල්අනෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය
4. අඳුරින් ආලෝකය ප්‍රතිකාර මධ්‍යස්ථානය
5. සෙනෙහස ප්‍රතිකාර මධ්‍යස්ථානය
6. නිසංසල ප්‍රතිකාර මධ්‍යස්ථානය
7. නව ජීවන අමධ්‍යප හඬ සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය
8. පැතුම ප්‍රතිකාර මධ්‍යස්ථානය
9. නේත්‍රා ප්‍රතිකාර මධ්‍යස්ථානය
10. යෞවන කිතුමග ප්‍රතිකාර මධ්‍යස්ථානය
11. නිදහස ප්‍රතිකාර මධ්‍යස්ථානය
12. කරුනාවේ නිවස ප්‍රතිකාර මධ්‍යස්ථානය
13. මීදුම ප්‍රතිකාර මධ්‍යස්ථානය
14. මිතුරු මිතුරෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය
15 . ජයවිරු සමාධි නිවහන ප්‍රතිකාර මධ්‍යස්ථානය
16. බෙතෙස්දා ප්‍රතිකාර මධ්‍යස්ථානය
17. යෞවන සහන සේවය ප්‍රතිකාර මධ්‍යස්ථානය
18. ප්‍රොමිස් ලැන්ඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය
19. විමෝචන ප්‍රතිකාර මධ්‍යස්ථානය
20. බොස්කෝ ප්‍රතිකාර මධ්‍යස්ථානය
21. මිත්‍ර ප්‍රතිකාර මධ්‍යස්ථානය
22. මට්ටක්කුලිය ප්‍රතිකාර මධ්‍යස්ථානය

මෙම පෞද්ගලික ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන විසිදෙක අතුරින් මධ්‍යස්ථාන දහයකට මධ්‍යස්ථාන වල අවම පහසුකම් පරික්ෂාකර බලා මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට බලපත්‍ර මණ්ඩලය මගින් නිකුත් කොට ඇත. ඔවුන්ගේ තාක්ෂණික හා ගුණාත්මක වර්ධනය උදෙසා පුහුණු සැසි දෙකක් අ.ඖ.පා.ජා. මණ්ඩලය විසින් පවත්වා ඇත.

**රාජ්‍ය ආයතන හා උපදේශන මධ්‍යස්ථාන**

පසුගිය වසර තුළ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වන ගාල්ල උණවටුන, කොළඹ තලංගම, නිට්ටඹුව නවදිගන්ත, මහනුවර හන්දෙස්ස හා මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නන් සඳහා ආරම්භ කරන ලද ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයද විමර්ෂණයට ලක් කරන ලදි.
විමර්ෂණ වලදී හඳුනාගත් දුර්වලතා නිවැරදි කර ගැනීමටත් කටයුතු කරන ලදි.

තවද අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සියපත හා මහාබෝධි උපදේශන මධ්‍යස්ථානද සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන උපදේශන මධ්‍යස්ථානද විමර්ෂණය කරන ලදි.

**බන්ධනාගාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව 2015 වර්ෂයේදි පහත සඳහන් මධ්‍යස්ථාන වල ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

1. වීරවිල එළිමහන් සිරකඳවුර
2. පල්ලේකැලේ
3. කළුතර බන්ධනාගාරය ( කාන්තා අංශය )
4. අනුරාධපුර
5. තල්දෙන තරුණ වරඳකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය
6. පල්ලන්සේන
7. කන්දවත්ත
8. මිතිරගල
9. ගාල්ල
10. බූස්ස
11. මහර
12. කන්දකාඩු
13. අඹේපුස්ස බන්ධනාගාරය

කන්දකාඩු, වීරවිල , පල්ලන්සේන, පල්ලේකැලේ එළිමහන් සිරකඳවුරු වලද ඉහත සඳහන් අනෙකුත් බන්ධනාගාර වල මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන ඒකක වලද මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු පවත්වා ගෙන යන ලදි.

මෙම බන්ධනාගාර වලින් වීරවිල, තල්දෙන එළිමහන් සිරකඳවුරු සඳහා මණ්ඩලයේ සේවකයන් දෙදෙනෙකු පූර්ණකාලීනව යොදවා උපදේශන කටයුතු සිදු කර ගෙන යන අතර අනෙකුත් බන්ධනාගාර වල (ගාල්ල ,මිතිරිගල, කන්දවත්ත, තල්දෙන, අනුරාධපුර) සතියකට දින දෙකක් හෝ තුනක් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

**බන්ධනාගාරයන් තුළ සිදු කරන අධ්‍යාපන කටයුතු**



බන්ධනාගාර ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු වඩාත් ගුණාත්මකභාවයෙන් යුතුව කර ගැනීම සඳහා රැඳවියන් ආගමික කටයුතු වලට යොමු කිරීම, ආධ්‍යාත්මික වර්ධනය කිරීමට ඉවහල් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි.

වර්තමානය වන විට බන්ධනාගාර වල මෙම ඒකකයේ රැඳවියන්ගේ ප්‍රමාණයේ අඩු වීමක් දැකිය හැක.

2015 වර්ෂයේදී මත්විරෝධී දිනය මුල්කොට ගෙන තල්දෙන බන්ධනාගාරයේ සාමකාමී පාගමනක් ක්‍රියාත්මක කරන ලදි. එසේම වෛද්‍ය සායනයක්ද, පෝය දින නිමිති කොටගෙන ධර්මදේශනාවක්ද, වැඩිහිටි නිවාසයකට දානයක් ලබා දීම ආදි විවිධ කටයුතු රැඳවියන්ගේ සහභාගීත්වයෙන් ඉටු කරන ලදි.

## 8.5 බාහිර සේවා 2016

බාහිර සේවා ඒකකය ද අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ හි ප්‍රධාන අංශයකි. බාහිර සේවා වැඩ සටහන් මගින් විශේෂ අවධානය යොමු කරනුයේ මහජනතාවගේ අවබෝධය වර්ධනය කිරීම සහ ඉල්ලුම් අවම කිරීම, සැපයුම් අවම කිරීම යන නිවාරණ යාන්ත්‍රණ දෙකක් පිළිබඳවය. නිවාරණය, ප්‍රතිකාර කිරීම, පුනරුත්තාපනය කිරීම, සහ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට ඇබ්බැහියෙන් නිදහස් වීමට සටන් කිරීම සඳහා අප ඔවුන්ට උපදෙස් ලබා දෙන්නෙමු. එසේම ඔවුන්ගේ පවුල් වල උදව්යද බලගන්වන්නෙමු. අප බාහිර සේවා ඒකකය පළාත් ගණනාවක වඩාත් පුළුල්ව ව්‍යාප්ත වී ඇති අතර 2015 දී එය උතුරු නැගෙනහිර පළාත් වලද ව්‍යාප්ත කරවීමට අපට හැකි විය.




මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් නව හඳුනාගැනීම - 2015

| පළාත | හෙරොයින් | ගංජා | මධ්‍යසාර | වෙනත් |
|---|---|---|---|---|
| බස්නාහිර | 1559 | 431 | 637 | 36 |
| මධ්‍යම | 189 | 236 | 422 | 8 |
| උතුරු මැද | 527 | 20 | 140 | 6 |
| වයඹ | 233 | 210 | 212 | 8 |
| දකුණ | 116 | 129 | 136 | 8 |
| උතුර | 79 | 109 | 239 | 13 |
| සබරගමු | 151 | 108 | 496 | - |
| ඌව | 171 | 03 | **185** | - |
| නැගෙනහිර | 11 | 09 | 04 | - |
| එකතුව | **3036** | **1147** | **2471** | **79** |

බාහිර සේවා නිලධාරීන් විසින් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් 6733 ක් හඳුනා ගෙන ඇති අතර ඉන් 3036 ක් හෙරොයින් භාවිත කරන්නන්ය.


හෙරොයින්
1559
189
527
233
116
79
151
171
11
Central
North central
North Western
Southern
Northern
Sabaragamuwa
Uwa
Eastern


ගංජා
431
236
20
210
129
109
108
3
9
Western
Central
North central
North Western
Southern
Northern
Sabaragamuwa
Uwa
Eastern


මධ්‍යසාර
637
422
140
212
136
239
496
185
4
Western
Central
North central
North Western
Southern
Northern
Sabaragamuwa
Uwa
Eastern


වෙනත්
36
8
6
8
8
13
0
0
0
Western
Central
North central
North Western
Southern
Northern
Sabaragamuwa
Uwa
Eastern

| පළාත | සේවා සැපයීම | යොමු කිරීම | භාවිතයෙන් නිදහස් වීම |
|---|---|---|---|
| බස්නාහිර | 7929 | 531 | 904 |
| මධ්‍යම | 487 | 83 | 305 |
| උතුරු මැද | 1048 | 7 | 441 |
| වයඹ | 1177 | 128 | 229 |
| දකුණ | 914 | 13 | 152 |
| උතුර | 1469 | - | 81 |
| සබරගමු | 1696 | - | 81 |
| ඌව | 1084 | 45 | 21 |
| නැගෙනහිර | 166 | 6 | 15 |
| එකතුව | **15679** | **861** | **2423** |

**<u>පසුරැකවරණ</u>**

| පළාත | ප්‍රජා | පවුල් උපදේශණය | මධ්‍යස්ථානය | බන්ධනාගාර |
|---|---|---|---|---|
| බස්නාහිර | 1034 | 699 | 968 | 359 |
| මධ්‍යම | 238 | 36 | 90 | 9 |
| උතුරු මැද | 145 | 104 | 97 | 70 |
| වයඹ | 204 | 48 | 72 | 62 |
| දකුණ | 211 | 10 | 142 | 23 |
| උතුර | 57 | 15 | 3 | 00 |
| සබරගමු | 219 | 2 | 9 | 6 |
| ඌව | 78 | 0 | 2 | 2 |
| නැගෙනහිර | 14 | - | 1 | - |
| එකතුව | 2200 | 914 | 1384 | 531 |

දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන්

ග්‍රාම නිළධාරීන්, සමෘද්ධි නිළධාරීන් ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන නිළධාරින් 831,263 ක් අපගේ බාහිර සේවා ඒකකය විසින් වැඩසටහන් 10,048 ක් මඟින් බල ගන්වන ලදී.

තොරතුරු පහත පරිදි වේ.

| අංකය | වැඩසටහන / ඉලක්කගත කණ්ඩායම | වැඩසටහන් ගණන | සහභාගි වු ගණන |
|---|---|---|---|
| 01 | පාසල් ගුරුවරු | 09 | 360 |
| 02 | සිසුන් | 611 | 84483 |
| 03 | SQS සිසුන් | 25 | 300 |
| 04 | දහම් පාසල් | 142 | 7847 |
| 05 | උපකාරක පංති | 387 | 6200 |
| 06 | ආගමික නායකයින් | 04 | 247 |
| 07 | රාජ්‍ය හා රාජ්‍ය නොවන නිළධාරින් | 5959 | 26979 |
| 08 | නීතිය ක්‍රියාත්මක කරන නිළධාරින් | 15 | 910 |
| 09 | රියදුරන් | 225 | 13345 |
| 10 | සමාජ සංවිධාන | 669 | 24840 |
| 11 | අවදානම් කණ්ඩායම් | 1702 | 50967 |
| 12 | ෆාමසි සාප්පු සේවකයින් | 563 | 563 |
| 13 | විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය | 09 | 100000 |
| 14 | පා ගමන් | 10 | 125000 |
| 15 | ජංගම සේවා | 44 | 77228 |
| 16 | ප්‍රදර්ශන | 10 | 72000 |
| 16 | එකතුව | **10048** | **8,31,263** |

රාජ්‍ය නිළධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන

මෙම වැඩසටහන රාජ්‍ය නිළධාරින් සඳහා වු මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන පිළිබඳ විශේෂිත පුහුණු වැඩසටහනකි. මෙම වැඩසටහන මතින් තොර පැවැත්මක් සඳහාත් රාජ්‍ය සේවකයන්ගේ දායකත්වය අවශ්‍ය විට මණ්ඩලයට ලබා ගැනීමටත් හැකිවන අයුරින් රාජ්‍ය සේවයේ නව පරම්පරාවක් ලෙස බලගන්වා ඇත.



### රාජ්‍ය නොවන ආයතන සඳහා වූ වැඩසටහන

වර්ෂ 2015 දී අප රාජ්‍ය නොවන සංගම් සඳහාත් විශේෂිත මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සංවිධානය කරන ලද්දේ සෙත් සරණ , සිංහ සමාජය, රොටරි සමාජය සහ බාහිර සේවා අංශය ඒකාබද්ධව වේ. මෙම වැඩසටහන් ප්‍රජා මූලික මත්ද්‍රව්‍ය නිවාරණය අරමුණු කරගෙන සිදු කරන ලදී.



### උපදේශන වැඩසටහන්

බාහිර සේවා අංශය විසින් උපදේශන මධ්‍යස්ථාන දෙකක් ස්ථාපනය කරන ලදී. ඒ අනුව,
මහාබෝධි උපදේශන මධ්‍යස්ථානය, මරදාන 1651 ක් පමණ හෙරොයින් ගංජා සහ මධ්‍යසාර භාවිත කරන්නන්ට ද
සියපත උපදේශන මධ්‍යස්ථානය කොළඹ, 797 ක් පමණ හෙරොයින්, ගංජා සහ මද්‍යසාර භාවිත කරන්නන්ට උපදේශනය ලබාදෙන ලදී.

**පාසල් සිසුන් සඳහා වූ මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පාසල් තුළ ඉලක්ක ගත කණ්ඩායම් වෙත පවත්වන ලදී. මෙහි අරමුණ අපගේ අනාගත පරපුර මතට තිත තැබීම උදෙසා බලගැන්වීමය. මේ යටතේ වැඩසටහන් 611 ක් පවත්වන ලදී. එහිදි සිසුන් 84483 කගේ අවබෝධය වර්ධනය කිරීමට හැකි විය.





### විශේෂිත මත්ද්‍රව්‍ය නිවාරණ සම්බන්ධීකරණ වැඩසටහන




අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි බාහිර සේවා ඒකකය විසින් පාසැල් ෆාමසි සහ පොදු මහජනතාව උදෙසා දුම්කොළ සහ මත්ද්‍රව්‍ය භාවිතය සහ ඇබ්බැහිය පිළිබඳව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් පවත්වන ලදී. අධ්‍යාපන අමාත්‍යංශය, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යංශය, ජාතික ශිෂ්‍යබට , ශ්‍රද්ධා රූපවාහිනී නාළිකාව, ඇතුළු ආයතන රැසක් මේ සඳහා සම්බන්ධ විය.

### බස්නාහිර පළාත් පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

බාහිර සේවා අංශයේ කාර්යයන් ඉතා අවධානම් කලාප වෙත වැඩි වශයෙන් යොමු කර ඇත. අප බස්නාහිර පළාත සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංවිධානය කරන ලදි. කොළඹ අවට මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් දෙකක් පවත්වා, 706 ක් සිසු සිසුවියන් දැනුවත් කළ අතර මීගමුවේ නිවාරණ වැඩසටහන් දෙකක් පවත්වා 350 ක් සිසු සිසුවියන් දැනුවත් කිරිමට සමත් වූහ. එසේම ගුරු පුහුණු වැඩසටහන් මෙන්ම නිපුණතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කළ අතර කොළඹ, කොළොන්නාව, වැල්ලම්පිටිය, ගල්කිස්ස, මොරටුව, පානදුර, මහරගම, නුගේගොඩ, පිළියන්දල, හොරණ, කහ තුඩුව, බොරලැස්ගමුව ප්‍රදේශ වල ගුරුවරුන් 100 ක් ද, මීගමුව, කටාන, ජා ඇල ප්‍රදේශ වල ගුරුවරුන් 80 ක් ද පුහුණු කරන ලදී.

### ගුණාත්මක ශිෂ්‍ය සංගම්

බාහිර සේවා ඒකකය විසින් ශ්‍රී ලංකාවේ පාසල් 15 ක් කේන්ද්‍ර කරගෙන ගුණාත්මක ශිෂ්‍ය සංගම් 15 ක් ස්ථාපිත කිරීමට 2015 වසරේදී සමත් විය. එම සාමාජිකයින්ගේ ආකල්ප, හැසිරීම් ආදී ගුණාංග සහ ඔවුන්ගේ හැකියා වර්ධනය කිරීමට අපට හැකි විය.



### දහම් පාසල් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

දහම් පාසල් සඳහා ද දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් 2015 වර්ෂය තුළදී පවත්වා ඇත. ඔවුන්ගේ හැසිරීම්, ආකල්ප, දැනුම වර්ධනය කිරීමේ අරමුණින් වැඩසටහන් 142 ක් පවත්වා ඇති අතර එමගින් සිසු සිසුවියන් හා දහම් පාසල් ආචාර්යවරුන් 7847 ක් දැනුවත් කිරීමට හැකි විය.



### ප්‍රජා මූලික උපදේශනය

අපගේ මහාබෝධි හා සියපත උපදේශන මධ්‍යස්ථාන පිළිවෙලින් මරදාන සහ බොරැල්ලේ පිහිටා ඇති අතර, පළාත් 09 ක උපදේශන වැඩසටහන් පවත්වා ඇත. එය අප අංශයේ ඉතා වැදගත් කාර්ය භාරයකි. අපගේ නියෝජිතයින් ගෙයින් ගෙට ගොස් මාසිකව එම පවුල් වල උදවියත් සමඟ සාකච්ඡා කොට ඔවුන්ගේ ජීවිතය ආලෝකමත් කිරීමට මනා පිටුවහලක් ලබාදෙන ලදී.




**රියදුරන්ගේ අවබෝධය වර්ධනය කිරීම**

මෙහි තවත් පියවරක් ලෙස ත්‍රීරෝද රථ, පාසල් වෑන්, බස්රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. අප විසින් බස්නාහිර පළාත් තුළ වැඩසටහන් 225 ක් පවත්වා ඇති අතර කොළඹ , ගම්පහ දිස්ත්‍රික්ක වල 13345 ක පමණ රියදුරන්ගේ අවබෝධය වර්ධනය කිරීමට අපට හැකි විය.



**කාන්තා දින සැමරුම ( 2015.03.07 දෙහිවල)**

අප කාන්තා ඒකකය විසින් 2015.03.07 වන දින දෙහිවලදී කාන්තා දින සැමරුමක් සංවිධානය කරන ලද අතර, ''මතට තිත'' මැයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් ද සංවිධානය කළහ. කාන්තවන් 550 ක්, අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් , මාධ්‍ය වේදීන් හා දේශපාලකයින් ඇතුළු බොහෝ පිරිසක් මෙම වැඩසටහනට සහභාගී විය.



**සිරස TV ''ගෙයින් ගෙට'' මත්ද්‍රව්‍ය නිවාරණය වැඩසටහන**

බාහිර සේවා අංශය විසින් සිරස TV හා සම්බන්ධව "ගෙයින් ගෙට" නම් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ගාල්ල, මාතර, මහනුවර, පුත්තලම, පොළොන්නරුව, යාපනය, ත්‍රිකුණාමලය, නුවර එළිය, බදුල්ල දිස්ත්‍රික්ක වල පවත්වන ලදී. සිරස TV නිළධාරීන් ද මෙම වැඩසටහන් වලට සහභාගී වන ලදී.

**ඡන්දදායකයින් දැනුවත් කිරීම**

අපගේ බාහිර සේවා ඒකකය විසින් මැතිවරණයේදී අපේක්ෂකයින් තෝරාපත් කර ගැනීමට ජනතාවට සහය වීමට විශාල කැපවීමක් සිදු කරන ලදී. අප විසින් ජංගම වැඩසටහන් කීපයක් පැවැත්වීම මගින් හා විද්‍යුත් මාධ්‍ය මගින් ජනතාව දැනුවත් කළෙමු. ( Sirasa / Derana )

**මතින් නිදහස් කලාපයක් ස්ථාපනය කිරීම**

බාහිර සේවා ඒකකය විසින් මතින් නිදහස් ගම්මාන ස්ථාපනයට පියවර ගන්නා ලදී. අප මේ වසරේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ''මතින් නිදහස් ගමක්'' ව්‍යාපෘතියට සහයෝගය දක්වන ලදී. අප මේ වසරේදී සමාජ සේවා නිලධාරීන් 40ක් සහ අනෙකුත් නිලධාරීන් 50 ක් පුහුණු කර ඔවුන්ගේ අවබෝධය වැඩි කිරීමෙහි ලා පුරෝගාමී විය. තවද අප විසින් කොළඹ රොටරි සමාජයේ ''මතින්තොර රටක්'' වැඩසටහන ස්ථාපනය කිරීමටද බලගන්වන ලදී.

**ආගමික නායකයින් දැනුවත් කිරීම**

අප විසින් ආගමික නායකයින් උදෙසා ද මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් සංවිධානය කරන ලදී. එහිදී වැඩසටහන් පහක් පවත්වන ලද අතර බෞද්ධ, ඉස්ලාම්, හින්දු, ක්‍රිස්තියානි, ආගමික නායකයින්, 247 ක් දැනුවත් කිරීමට අපට හැකි විය. ඔවුන් සමාජ සේවකයන් ලෙස මත්ද්‍රව්‍ය තුරන් කිරීමට අපට උපකාර කරන්නෙමු.

**මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීම**

2015 වසරේදී අප මුද්‍රිත මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ අවස්ථා ගණනාවකදී ජනතාව දැනුවත් කිරීමට සමත් වුණෙමු. ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, සිරස, TNL, දිනමිණ, සිළුමිණ, Sunday observer, Daily mirrow ආදී මාධ්‍ය ගණනාවකින් ජනතාව දැනුවත් කිරීමට අපට හැකි විය. සල්මල් යාය, ආයුබෝවන් හා දඹුලු ආදී ජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් ඔස්සේ ජනතාව දැනුවත් කිරීමට අපට හැකි විය.

**පා ගමන්**

ජාතික රූපවාහිනිය විසින් සංවිධානය කරන ලද ''පණ මෙන් සුරකිමු දරුවන්'' මැයෙන් වූ ළමා ආරක්ෂාව පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී විය. එසේම බාහිර සේවා ඒකකය විසින් සංවිධානය කරන ලද පා ගමනට හා කොළඹ රාජකීය විද්‍යාලය විසින් සංවිධානය කළ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනට ද අප සහභාගී විය.




**MADD පා ගමන 2015**

306 සී දිස්ත්‍රික් සිංහ සමාජය විසින් සංවිධානය කරන ලද කොළඹ 05 සිට ගාලු මුවදොර තෙක් වූ මතට එරෙහි පා ගමනට සහභාගි වීමටද අපට හැකි විය.



**ප්‍රදර්ශන**

බාහිර සේවා ඒකකය විසින් ජනතාව දැනුවත් කිරීමට ප්‍රදර්ශන ගණනාවක් පැවැත්වීමට 2015 වසරේ දි සමත් විය. **බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව , නිදහස් චතුරස්‍රය,** දෙහිවල, මොරටුව ආදී ප්‍රදේශ වල පැවැත් වූ ප්‍රදර්ශන 07 ක් මගින් 72,000 කට ආසන්න ජනතාවගේ දැනුම වර්ධනය කිරීමට අපට හැකි විය.



**විශේෂ අවස්ථාව 2015**

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනේ තානාපතිවරයා ලෙස ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක කුමාර් සංගක්කාර මහතාව 2015.08.19 වැනි දින ජනාධිපති නිල නිවසේදී පත් කරන ලදී. මෙම අවස්ථාව සංවිධානය කරන ලද්දේ අපගේ බාහිර සේවා ඒකකය විසිනි.

**2015.06.26 දින අරලිය ගහ මන්දිරයේදී පවත්වන ලද ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දින වැඩසටහන.**

රාජ්‍ය හා රජ්‍ය නොවන සංවිධාන වල නිලධාරීන් 5800 කගේ සහභාගීත්වයෙන් 2015.06.26 දින අරලිය ගහ මන්දිරයේදී ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දින වැඩසටහන පවත්වන ලදී.





**මතින් නිදහස් ජීවයෙන් පිරි රටක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන( ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ක්‍රිකට් තරගය)**

2015 වසරේ බොරැල්ලේ පැවති ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ක්‍රිකට් තරගයට සමගාමීව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් සංවිධානය කිරීමට අපට හැකි විය.



**ජීවන යාත්‍රා 2015**

ඌව පරණ ගම අධ්‍යාපන කලාපයේදී 2015 නොවැම්බර් මාසයේදී මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. අප විසින් ගුරු පුහුණු වැඩසටහන් 02 ක්, පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් හා කැප්පෙටිපොළ දහම් පාසලේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

| අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | බැනර්<br>ක්‍රිකට් තරගය ශ්‍රී ලංකා හා ඉන්දියා<br>දරුවන් පණ මෙන් සුරකිමු<br>නුවරඑළිය වසන්තය<br>මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් බස්නාහිර පළාත<br>රියදුරන් දැනුවත් කිරිම<br>පළාත් බැනරය | 10<br>02<br>02<br>01<br>01<br>01 17 |
| 02<br><br>03<br><br>04 | මුද්‍රණ - පිටත<br>මතින් නිදහස් ජීවයෙන් පිරි රටක්<br>සිංහල<br>දෙමළ<br>මතින් නිදහස් ජීවයෙන් පිරි රටක් එක්වෙමු අපි<br>තොරතුරු පත්‍රිකාව<br>අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය<br>සිංහල දෙමළ<br>මුද්‍රණ ඩුප්ලෝ<br>යුවති<br>මතින් නිදහස් ජීවයෙන් පිරි රටක් එක්වෙමු අපි<br>තොරතුරු පත්‍රිකාව<br>නිළධාරින් සඳහා<br>පාසල් සිසුනි<br>ස්ටිකර්<br>ත්‍රී රෝද රථ 1<br>ත්‍රී රෝද රථ 2 | 25000<br>1000000<br>25000<br>15000<br>25000 1 ,<br>90000<br>3000<br>35000<br>4500<br>5000<br>47,500<br>2,37500<br>03 10,000 |
| 05 | විද්‍යුත් මාධ්‍ය | 02 |
| | | |

## 8.6 ජාතික මාදක රසායනාගාරය

පසුගිය වසර හා සමගාමීව ජාතික මාදක රසායනාගාරය මඟින් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය පාලනය කාර්යක්ෂම කිරීමෙහි ක්‍රමෝපායයන් සාර්ථක කරගැනීම සඳහා එහි විද්‍යාත්මක සේවාවන් හා වගකීම් ඉතා විශ්වාසනියව ඉටුකර ඇත. ඒහිදි එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලනය වැඩසටහන (UNODC) මඟින් රසායනාගාර ප්‍රමිතිකරනය සඳහා ජාත්‍යන්තර මට්ටමේ විශ්ලේෂණ සාර්ථකත්වයන් මැන බැලීම සඳහා පවත්වනු ලබන පරික්ෂණ වැඩ සටහනට අඛණ්ඩව සහභාගි වෙමින් විශ්ලේෂණ හැකියාවන් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් උසස්ම මට්ටමකින් පවත්වාගෙන යනු ලැබීය.

සැක සහිතව ඉදිරිපත් කරනු ලබන ද්‍රව්‍යයන්ගේ විශ්ලේෂණ හා ප්‍රතිඵල ජාතික ආයතන හා නියෝජිතයන් සමග හුවමාරු කර ඒවා අපරාධ පරික්ෂණ, මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සම්බන්ධ විශ්ලේෂණ, ක්‍රමෝපාය විශ්ලේෂණ, ප්‍රතිපත්ති සැකසීම, නීති අණපනත් සැකසීම,  හා සෞඛ්‍ය ගැටළු අවම කිරීමේ ක්‍රියාමර්ගයන් සාර්ථක කරගැනීම සඳහා භාවිතා කරනු ලැබීය.

මත්ද්‍රව්‍ය අනිසි භාවිතාව සහ ඒවා හඳුනා ගැනීම සම්බන්ධව විද්‍යාත්මක පැතිකඩයන් ඔස්සේ නීතිය ක්‍රියත්මක කරන නිලධාරීන් සහ ඒ හා සම්බන්ධව අනෙකුත් ආයතනයන් හි නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩමුළු සහ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී. මෙම නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවයන් වැඩි කිරීම මඟින් විශ්ලේෂණ හැකියාවන් වැඩි දියුණු වීම මත්ද්‍රව්‍ය හා පූර්ව රසායනයන්ගේ මූලාරම්භය හඳුනා ගැනීම, ආනයනය අපනයනය හා බෙදාහැරීම සම්බන්ධව ඉතා කර්යයක්ෂම විමර්ශන හැකියාවන් ගොඩනැගීම බලාපොරොත්තුවේ.

අමතරව ජාතික මාදක රසායනාගාරය ක්‍රීඩාවේදී භාවිතා කරන තහනම් උත්තේජක විශ්ලේෂණ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම තුළින් අද වන විට ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය මුහුණ දී ඇති මෙම ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා විශ්ලේෂණ වාර්තා ලබාදීමෙන් ක්ෂණික සහායක් ලබාදීම සිදුකරන ලදී.

මෙම වාර්ථාවේ එක් එක් පරිජේදයන් හි දක්වා ඇති ආකාරයට නීතිය ක්‍රියාත්මක කරන ආයතන, මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධව කටයුතු කරන අනෙකුත් ආයතන සහ ප්‍රජාව සඳහා මත්ද්‍රව්‍ය පාලනය හා නිවාරණයට වැදගත් වන විද්‍යාත්මක සහයන් ජාතික මාදක රසායනාගාරයේ අරමුණු වලට අනුව ඉතා වගකීම් සහිතව මෙම කාල සීමාව තුළදී ඉටුකර ඇත.

**ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති දුර්භාවිත ඖෂධයන් හඳුනා ගැනීම.**

වීථි වල දක්නට ලැබෙන මත්ද්‍රව්‍යය ; හෙරොයින් වලට අදාළ පර්යේෂණ
නිරතුරුවම සිදුකරන විශ්ලේෂණයන්ට අමතරව පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අඛන්ඩව සිදුකරනු ලබයි.

- වීථි වල දක්නට ලැබෙන හෙරොයින් වල මිල සහ පිරිසිදු භාවය අනාවරණය කොට එහි ඇති සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ.
- හෙරොයින් සාම්පල වල මූලාරම්භය හා විකාශණය හඳුනාගැනීම.
- වීථි හෙරොයින් සාම්පල වල ඇති නව තනුකකරන ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන විශ්ලේෂණයන්.

මෙම ව්‍යාපෘතිය පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශයේ සහයෙන් සිදුකරනු ලබන අතර දිවයිනේ විවිධ ප්‍රදේශ වලින්
මාසිකව එකතු කරගන්නා සාම්පල රසායනාගාරය වෙත යොමු කරනු ලබයි.
2015 වසර තුළ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් වීථි හෙරොයින් සාම්පල් 60 ලැබී ඇති අතර ඒවායේ අඩංගු ඩයි ඇසටයිල් මොර්ෆීන්(හෙරොයින්) ප්‍රතිශතය, එකතු කරන හා තනුකකරන ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා විශ්ලේෂණ සිදුකොට ඇත.

**වගු අංක 01 2015 වසරේදී විශ්ලේෂණ කරන ලද සාම්පල සංඛ්‍යාව.**

| මාසය | සාම්පල සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | |
| පෙබරවාරි | |
| මාර්තු | - |
| අප්‍රේල් | - |
| මැයි | |
| ජුනි | |
| ජූලි | |
| අගෝස්තු | |
| සැප්තැම්බර් | 18 |
| ඔක්තොබර් | 15 |
| නොවැම්බර් | 20 |
| දෙසැම්බර් | 07 |
| එකතුව | **60** |

වීථි හෙරොයින් සාම්පල වල මිල සහ පිරිසිදු භාවය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම, භාවිතා කරන්නා හා වෙළඳ පොල අතර සම්බන්ධය අධීක්ෂනය සඳහා ඉතාමත් හොඳ දර්ශකයක් ලෙස සැලකීමෙන් සුලභතාවයෙහි ඇතිවන්නාවූ වෙනස්කම් ඉතා පහසුවෙන් වටහා ගත හැකිය. මීට අමතරව මිල සහ පිරිසිදු භාවය අතර ඇති සබඳතා පැහැදිලි කර ගැනීමේන් මත්ද්‍රව්‍ය සැපයුමේ විධික්‍රම හඳුනා ගැනිම තුලින් සැලසුම් සහගත යම් යම් ඉලක්ක භාවිතා කරගනිමින් ක්‍රියාත්මක වීම තුලින් ජාවාරම් කිරීම, ප්‍රවාහනය කිරීම හා අත් අඩංගුවට පත්වන හෙරොයින් හා භාවිතා කරන්නන් සඳහා වඩත් හොඳින් නීතිය ක්‍රියාත්මක කල හැක.

මෙම පර්යේෂණ ව්‍යාපෘතියට අනුව ශ්‍රී ලංකාව තුළ වීථි මට්ටමේ හෙරොයින් සම්පල වල පිරිසිදු භාවය හා මිල අතර ඇති සබඳතාවය ක්‍රමානුකූල අධ්‍යනයකින් ලබාගන්නා තොරතුරු, ප්‍රතිපත්ති සැකසුම් වලදිත්, නීතය ක්‍රියත්මක කරන නිළධාරින්ගේ කාර්‍යයභාරයේදිත් වැදගත් වන අතර අත්අඩංගුවට පත්වන මහා පරිමාණ මත්ද්‍රව්‍ය තොග හේතුවෙන් හෙරොයින් සාම්පල වල පිරිසිදු භාවය හා මිල අතර ඇති සබඳතාවය කෙරෙහි බලපෑමක් ඇතිකල හැකිද යන්න අනාවරණය කරගත හැක.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මඟින් මත්ද්‍රව්‍ය සාම්පල ලබාදි ඇත්තේ සැප්තැම්බර්, ඔක්තොබර්, නොවැම්බර් හා දෙසැම්බර් යන මාස වලදී පමණි. එබැවින් මෙම මාසවලට අදාළව පර්යේෂණය සඳහා බඳුන්වන දිස්ත්‍රික්ක 9ක් නියෝජනය කරන විවිධ නගර කිහිපයක මිල සහ පිරිසිදු භාවය සම්බන්ධ දත්ත පහත වගුවේ සටහන් වේ. දත්ත වලට අනුව හෙරොයින් වල පිරිසිදු භාවය සාමාන්‍ය අගය 15.55% වන අතර 2014 වර්ෂයට සාපේක්ෂව සාමාන්‍යය පිරිසිදු භාවය 13.98% කින් පහල යාමක් හඳුනා ගත හැක. පිරිසිදු භාවයේ ඉහලම සාමාන්‍යය අගය 18.78% සැප්තැම්බර් මාසයේදි වර්තා වන අතර සාමාන්‍යය අගය වන 12.71% දෙසැම්බර් මාසයේදි වාර්තවේ.

**වගු අංක 02** සාම්පල වල පිරිසිදුතාවය (ඩයි ඇසටයිල් මෝර්ෆීන් ප්‍රතිශතය)

| ප්‍රදේශය | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය (අනුරාධපුරය) | - | - | - | - | - | - | - | - | 02.20 | 01.22 | 15.98 | - |
| ( ග්‍රෑන්ඩ්පාස් )<br>හලාවත 1 (හලාවත) | - | - | - | - | - | - | - | - | - | 44.78 | 24.02 | - |
| කොළඹ 1 (කොළඹ) | - | - | - | - | - | - | - | - | - | 27.00 | 13.87 | - |
| කොළඹ 2 | - | - | - | - | - | - | - | - | 35.49 | - | - | - |
| ගාල්ල 1 (ගාල්ල 1) | - | - | - | - | - | - | - | - | 22.64 | 25.26 | - | 0.00 |
| ගාල්ල 1 (ගාල්ල 1) | - | - | - | - | - | - | - | - | - | - | - | 20.95 |
| ගාල්ල 2 (අම්බලංගොඩ) | - | - | - | - | - | - | - | - | - | - | 23.22 | - |
| ගම්පහ 1 (ගම්පහ) | - | - | - | - | - | - | - | - | 24.61 | 11.04 | 17.41 | 14.72 |
| මහනුවර (මහනුවර 1) | - | - | - | - | - | - | - | - | 41.53 | 0.47 | 1.55 | - |
| මහනුවර (මහනුවර 2) | - | - | - | - | - | - | - | - | - | 27.25 | - | - |
| කළුතර 1( කළුතර) | - | - | - | - | - | - | - | - | 12.76 | - | 26.64 | - |
| කුරුණෑගල 1( කුරුණෑගල) | - | - | - | - | - | - | - | - | 23.83 | 9.48 | 0.00 | 12.03 |
| පුත්තලම (පුත්තලම) | - | - | - | - | - | - | - | - | 0.74 | - | 19.54 | - |
| රත්නපුර (රත්නපුර) | - | - | - | - | - | - | - | - | 5.22 | 0.00 | 1.64 | 15.87 |
| **සාමාන්‍යය** | - | - | - | - | - | - | - | - | **18.78** | **16.31** | **14.39** | **12.71** |

ශුද්ධ හෙරොයින් මිලිග්‍රෑම් 1ක සාමාන්‍ය මිල රු.201.16 සිට රු. 1863.68 දක්වා වෙනස්වී ඇත. ඉහළම මිල වාර්තා වී ඇත්තේ ඔක්තෝබර් මාසයේය. වගු අංක 3 මගින් පිරිසිදු හෙරොයින් මිලිග්‍රෑම් 1ක මිල විවිධ ප්‍රදේශයන්හි වෙනස් වන ආකාරය සඳහන් වේ.

**වගු අංක 03** වීදි හෙරොයින් සාම්පල වල මිල සහ පිරිසිදුතාවය (ඩයි ඇසටයිල් මොර්ෆීන් මිලිග්‍රෑමයක් සඳහා වන මිල රුපියල් වලින්)

| ප්‍රදේශය | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය (අනුරාධපුරය) | - | - | - | - | - | - | - | - | 416.62 | 1503.12 | 80.80 | - |
| හලාවත 1 (හලාවත) | - | - | - | - | - | - | - | - | - | 42.31 | 33.96 | - |
| කොළඹ 1 (කොළඹ) | - | - | - | - | - | - | - | - | - | 48.65 | 97.73 | - |
| කොළඹ 2 (ග්රෑන්ඩ්පාස්) | - | - | - | - | - | - | - | - | 123.58 | - | - | - |
| ගාල්ල 1 (ගාල්ල 1) | - | - | - | - | - | - | - | - | 108.01 | 138.00 | - | 0.00 |
| ගාල්ල 1 (ගාල්ල 1) | - | - | - | - | - | - | - | - | - | - | - | 211.16 |
| ගාල්ල 2 (අම්බලංගොඩ) | - | - | - | - | - | - | - | - | - | - | 265.88 | - |
| ගම්පහ 1 (ගම්පහ) | - | - | - | - | - | - | - | - | 70.32 | 194.95 | 176.42 | 240.72 |
| මහනුවර (මහනුවර 1) | - | - | - | - | - | - | - | - | 120.74 | 12307.01 | 918.91 | - |
| මහනුවර (මහනුවර 2) | - | - | - | - | - | - | - | - | - | 291.51 | - | - |
| කළුතර 1( කළුතර) | - | - | - | - | - | - | - | - | 110.81 | - | 75.30 | - |
| කුරුණෑගල 1( කුරුණෑගල) | - | - | - | - | - | - | - | - | 68.35 | 383.87 | 0.00 | 330.04 |
| පුත්තලම (පුත්තලම) | - | - | - | - | - | - | - | - | 1545.25 | - | 151.32 | - |
| රත්නපුර (රත්නපුර) | - | - | - | - | - | - | - | - | 428.62 | 0.00 | 467.91 | 223.89 |
| **සාමාන්‍යය** | - | - | - | - | - | - | - | - | **332.48** | **1863.68** | **252.03** | **201.16** |

**වීදි හෙරොයින් සාම්පල වල ඇති ඇල්කොලොයිඩ අපද්‍රව්‍ය, තනුකරණ ද්‍රව්‍ය / එකතු කරන වෙනත් ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන විශ්ලේෂණයන්.**

වීදි හෙරොයින් සාම්පල විශ්ලේෂණ රාමුව තුළදී මත්ද්‍රව්‍යයේ ප්‍රමිතිය, එමෙන්ම ඒ අනුව ආරම්භක ප්‍රදේශ හා සාම්පල් එකිනෙක අතර ඇති සම්බන්ධතාවය අනාවරණය වේ.

කෙසේ වෙතත් වඩාත් අර්ථාන්විත නිගමන වලට එළඹීමට නොහැකි වී ඇත්තේ ප්‍රමාණවත් සම්පල ප්‍රමාණයක් නොලැබීම හා එකම ප්‍රදේශයෙන් නිසි පරිදි සාම්පල නොලැබීම යන කාරණා හේතුවෙනි. මේ හේතුවෙන් බලාපොරොත්තු වන අභිමතාර්ථයන් සියල්ල සම්පූර්ණ කරගැනීමට නොහැකි වී ඇත.

ඉතා සුළු ප්‍රමාණ වලින් අඩංගු ප්‍රධාන ඇල්කොලොයිඩ හා අපිරිසිදු ද්‍රව්‍ය ගෑස්ක්‍රොමටග්‍රැපි මැස්ස්පෙක්ට්‍රකොපි (Gas Chromatography Mass Spectroscopy) තාක්ෂණය යටතේ හඳුනා ගෙන ඇති අතර ඒවා වගු අංක 04 හා 05 මගින් පෙන්වා දී ඇත.

වගු අංක 04 වීථි හෙරොයින් සාම්පල දක්නට ඇල්කොලොයිඩ ඝනයේ අපිරිසිදු ද්‍රව්‍යයන්.

| ප්‍රදේශය | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය (අනුරාධපුරය) | - | - | - | - | - | - | - | - | AC<br>MAM | AC<br>MAM | AC<br>MAM | |
| හලාවත 1 (හලාවත) | - | - | - | - | - | - | - | - | - | AC<br>MAM | AC<br>MAM | |
| කොළඹ 1 (කොළඹ) | - | - | - | - | - | - | - | - | | MAM<br>AC | AC<br>MAM | |
| කොළඹ 2 (ග්‍රෑන්ඩ්පාස්) | - | - | - | - | - | - | - | - | COD<br>AC<br>MAM | | | |
| ගාල්ල 1 (ගාල්ල 1) | - | - | - | - | - | - | - | - | MC<br>HC<br>COD<br>AC<br>MAM<br>PAP<br>NOS | AC<br>MAM | | - |
| ගාල්ල 1 (ගාල්ල 1) | | | | | | | | | | | | AC<br>MAM<br>MC |
| ගාල්ල 2 (අම්බලංගොඩ) | - | - | - | - | - | - | - | - | | | MAM | |
| ගම්පහ 1 (ගම්පහ) | - | - | - | - | - | - | - | - | COD<br>AC<br>MAM<br>PAP<br>NOS | AC<br>MAM | AC<br>MAM | AC<br>MAM |
| මහනුවර (මහනුවර 1) | - | - | - | - | - | - | - | - | COD<br>AC<br>PAP | MOR<br>AC<br>MAM | | |
| මහනුවර (මහනුවර 2) | - | - | - | - | - | - | - | - | - | AC<br>MAM<br>COD<br>MOR | AC<br>MAM | |
| කළුතර 1( කළුතර) | - | - | - | - | - | - | - | - | HC<br>AC | | AC<br>MAM | |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | MAM | | | |
| කුරුණෑගල 1 (කුරුණෑගල) | - | - | - | - | - | - | - | - | HC<br>MEC<br>COD<br>AC<br>MAM<br>PAP<br>NOS | AC<br>AHE<br>MEG<br>PEG | - | AC<br>MAM |
| පුත්තලම (පුත්තලම) | - | - | - | - | - | - | - | - | AC<br>MAM | | AC<br>MAM | |
| රත්නපුර (රත්නපුර) | - | - | - | - | - | - | - | - | COD<br>MOR<br>AC<br>MAM | - | AC<br>MAM | AC<br>MAM |

***MOR** -මෝෆීන් ; **AC** – ඇසිටල්කොඩේන් ; **MAM** – 6-ඇසිටල්මෝෆීන් ; **ATH** - ඇසිටල්තිබෙඔල් ; **THE** –තිබේන් ; **PAP** – පැපාවරින් ;*
***NOS** –නොස්කැපීන් ; **COD** – කොඩේන්; **HC** – හයිඩ්රොකොටනීන්; **MEC** – මෙකොනීන්;*
***AHE**- ඇන්හයිඩ්රොඑක්ගොනීන්මිතයිල් එස්ටර; **MEG** මිතයිල්එක්ගොනීන්; **PEG**- සියුඩොඑක්ගොනීන්මිතයිල් එස්ටර*

**වගු අංක 04** වීදි හෙරොයින් සාම්පල වල හඳුනාගත් එකතු කල ද්‍රව්‍ය හා තනුකාරක

| ප්‍රදේශය | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය (අනුරාධපුරය) | - | - | - | - | - | - | - | - | CAF<br>DIZ | CAF | ACT<br>CAF | - |
| හලාවත 1 (හලාවත) | - | - | - | - | - | - | - | - | - | CAF | ACT<br>CAF | - |
| කොළඹ 1 (කොළඹ) | - | - | - | - | - | - | - | - | - | CAF | ACT<br>CAF | - |
| කොළඹ 2 (ග්‍රෑන්ඩ්පාස්) | - | - | - | - | - | - | - | - | ACT<br>CAF | - | - | - |
| ගාල්ල 1 (ගාල්ල 1) | - | - | - | - | - | - | - | - | ACT<br>CAF<br>DIZ | CAF | - | - |
| ගාල්ල 1 (ගාල්ල 1) | - | - | - | - | - | - | - | - | - | - | - | CAF<br>DIZ |
| ගාල්ල 2 (අම්බලංගොඩ) | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ගම්පහ 1 (ගම්පහ) | - | - | - | - | - | - | - | - | ACT<br>CAF<br>DIZ | CAF | ACT<br>CAF | CAF |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මහනුවර (මහනුවර 1) | - | - | - | - | - | - | - | - | CAF | CAF | - | - |
| මහනුවර (මහනුවර 2) | - | - | - | - | - | - | - | - | - | CAF<br>DIZ | ACT | - |
| කළුතර 1( කළුතර) | - | - | - | - | - | - | - | - | ACT<br>CAF<br>DIZ | - | ACT<br>CAF | - |
| කුරුණෑගල 1 (කුරුණෑගල) | - | - | - | - | - | - | - | - | ACT<br>CAF<br>DIZ | ACT<br>CAF<br>DIZ | ACT<br>CAF | CAF<br>DIZ |
| පුත්තලම (පුත්තලම) | - | - | - | - | - | - | - | - | CAF<br>DIZ | - | ACT<br>CAF | - |
| රත්නපුර (රත්නපුර) | - | - | - | - | - | - | - | - | ACT<br>CAF<br>DIZ | ACT | CAF | CAF |

***ACT*** *ඇසිටැමිනොෆින් ;* ***CAF*** *කැෆේන් ;* ***DIZ*** *ඩයිසපෑම්*

## 1.2 අනෙකුත් පර්යේෂණ ව්‍යාපෘති

### දැනට සිදුකරමින් පවතින මාදක සහ මනෝවර්ථක ද්‍රව්‍ය සම්බන්ධ පර්යේෂණ

සැක සහිත මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම පිණිස නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල මූලිකව පර්යේෂණ ගණනාවක් ජාතික මාදක රසායනාගාරය මගින් සිදු කරනු ලබයි. ඇම්ෆෙටමින්, මෙත්ඇම්ෆෙටමින්, මෙතිලීන්ඩයොක්සි මෙත්ඇම්ෆෙටමින් (MDMA) සහ ලයිසජික් ඇසිඩ් ඩයිඑතිල් ඇමයිඩ් (LSD) යන මත්ද්‍රව්‍ය මේ අතර තිබේ දැයි හඳුනා ගැනීම මෙහි විශේෂ අරමුණයි. මේවා තුලින් හඳුනා ගන්නා අනෙකුත් අපද්‍රව්‍යයන් හා රසායන වල කොටස් හඳුනා ගැනීමෙන් මේවා නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන වෙනස් වූ රසායනික ක්‍රමවේදයන් හා භාවිතා කරන රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම ද විශේෂයෙන්ම ඉලක්ක කෙරේ.

### ක්‍රීඩාවේදී භාවිතා කරන ක්‍රියාකාරිත්ව වර්ධක ඖෂධ ( තහනම් උත්තේජක) සඳහා කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති

තහනම් උත්තේජක භාවිතා කිරීම මගින් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය සඳහා ඉතා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම වැදගත් වන අතර ශ්‍රී ලංකාව මේ අර්බුදයට සාර්ථකව මුහුණ දීම පිණිස ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය සමඟ එක්ව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක භාවිතාව සහ අවභාවිතාව මූලික කොට පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘතීන් ජාතික මාදක රසායනාගාරය මගින් දියත් කොට ඇත.

- මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි අංක 1 දරන 2008 පනතට අනුව පාලනයට නතු ද්‍රව්‍ය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ භාවිතාව සම්බන්ධ විශ්ලේෂණයන්.
- ලෝක තහනම් උත්තේජක විරෝධී ආයතනය මගින් ලැයිස්තු කොට ඇති ද්‍රව්‍ය, ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් භාවිතා කිරීම පිළිබඳ විශ්ලේෂණයන්
- තහනම් උත්තේජක භාවිතය පිළිබඳ ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම සඳහා නිවාරණ අධ්‍යාපනය, නිවාරණ පිළිබඳ නව ක්‍රමෝපායයන් වර්ධනය කිරීම සහ පුහුණු වැඩසටහන් කිරීම.

### මධ්‍යසාර පිළිබඳ පර්යේෂණ

ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් පරිභෝජනය කරන බියර් සාම්පල වල අඩංගු මද්‍යසාර ප්‍රතිශතයන් නිවැරදිව හඳුනා ගැනීම පිණිස ආරම්භ කර ඇති පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සාම්පල විශ්ලේෂණයන් සිදු කරමින් තවදුරටත් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යනු ලබයි.

**දුර්භාවිත මත්ද්‍රව්‍ය පාලනය සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන අදාළ අනෙකුත් අධිකාරීත්වයන් වෙත අවශ්‍ය විද්‍යාත්මක සහයන් ලබාදීම.**

2.1 සැක සහිත මත්ද්‍රව්‍ය/ඖෂධ විශ්ලේෂණය.

ජාතික මාදක රසායනාගාරය මගින් 2015 වසර තුළ අවස්ථා 30කදී කරන ලද ඉල්ලීම් අනුව මත්ද්‍රව්‍ය බවට සැකසහිත සාම්පල 172ක් සඳහා විශ්ලේෂණයන් සිදු කොට ඇත.

ඉහත විශ්ලේෂණ ප්‍රතිඵල ජාතික හා අනෙකුත් වගකිව යුතු ආයතන සමඟ බෙදා ගනිමින් මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳ විවිධ මෙහෙයුම්, නව ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණ කිරීම, උපක්‍රමික විශ්ලේෂණ කිරීම, නීති ප්‍රතිපත්ති විශ්ලේෂණය හා සැකසුම් අවශ්‍යතා, නෛතික හා සෞඛ්‍ය ගැටළු අවම කිරීම හා අරමුණු මුදුන් පත් කර ගැනීම යන කරුණු සඳහා භාවිතා කොට ඇත. මෙම තොරතුරු තුළ රටේ නීති බල ගැන්වීම් අපරාධ නිවාරණය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීම් සඳහා අවශ්‍ය විද්‍යාත්මක අනාවරණයන් අන්තර්ගතය.

පහත ඇතුලත් කොට ඇත්තේ විෂ අබිං සහ අන්තාරයකර ඖෂධ පාලන පනත හා 2008 අංක 01 දරණ මාදක ඖෂධ සහ මනෝවර්ධක ද්‍රව්‍ය නීති විරෝධි ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ ජාතික මාදක රසායනාගාරය මගින් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් රසායනාගාරය වෙත යොමු කරන ලද මත්ද්‍රව්‍ය යැයි සැක සහිත සාම්පල පර්යේෂණ මූලිකව විශ්ලේෂණය කර නිකුත් කරන ලද වාර්තාවන්ය.

**වගු අංක 6 ඃ 2015 වසර තුළදී විශ්ලේෂණය කරන ලද මත්ද්‍රව්‍ය බවට සැක සහිත සාම්පල සංඛ්‍යාවන්**

| | | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව කටුනායක | අවස්ථා සංඛ්‍යාව | | | | | 01 | | | | | | | |
| | සාම්පල සංඛ්‍යාව | | | | | 01 | | | | | | | |
| ශ්‍රී ලංකා පොලිසිය / පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය | අවස්ථා සංඛ්‍යාව | | | | | | | 01 | | 01 | | | 06 |
| | සාම්පල සංඛ්‍යාව | | | | | | | 01 | | 03 | | | 61 |
| විශේෂ කාර්‍යය බලකාය | අවස්ථා සංඛ්‍යාව | | | | | | | 01 | | | | | 02 |
| | සාම්පල සංඛ්‍යාව | | | | | | | 01 | | | | | 04 |
| ශ්‍රී ලංකා රේගුව | අවස්ථා සංඛ්‍යාව | | | | | 01 | | 01 | 01 | 01 | 01 | | |
| | සාම්පල සංඛ්‍යාව | | | | | 01 | | 12 | 02 | 02 | 01 | | |
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය | අවස්ථා සංඛ්‍යාව | | | | | | 01 | 01 | | | | | 03 |
| | සාම්පල සංඛ්‍යාව | | | | | | 06 | 22 | | | | | 42 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | අවස්ථා සංඛ්‍යාව | | | | | | | 01 | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සාම්පල සංඛ්‍යාව | | | 02 | | | | | |
| අ.ඖ.පා.ජ.ම | අවස්ථා සංඛ්‍යාව | | | 01 | | | | | 03 |
| | සාම්පල සංඛ්‍යාව | | | 02 | | | | | 03 |
| වෙනත් | අවස්ථා සංඛ්‍යාව | | | | | 01 | 01 | 01 | |
| | සාම්පල සංඛ්‍යාව | | | | | 01 | 01 | 02 | |
| එකතුව | අවස්ථා සංඛ්‍යාව | **02** | **01** | **06** | **01** | **03** | **02** | **01** | **14** |
| | සාම්පල සංඛ්‍යාව | **02** | **06** | **40** | **02** | **06** | **02** | **02** | **110** |

**මුළු පරීක්ෂණ සංඛ්‍යාව - *30***
**මුළු සාම්පල සංඛ්‍යාව - *170***

## 2.2 මධ්‍යසාර සාම්පල විශ්ලේෂණය.

පහත දැක්වෙන්නේ ජාතික මාදක රසායනාගාරය මගින් පර්යේෂණ මට්ටමෙන් සිදුකරණ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව හරහා එවනු ලබන මධ්‍යසාර විශ්ලේෂණය මගින් ඒවායේ අඩංගු මෙතනොල් හා අනෙකුත් අපද්‍රව්‍ය පිළිබඳ වාර්ථා විස්තරයයි. මෙසේ සිදුකරණු ලැබූ අවස්ථා 20ට අදාළව සාම්පල 63ක විශ්ලේෂණයන් පහත දැක්වේ.

**වගු අංක 7 2015 වසර තුළදී විශ්ලේෂණය කරන ලද සාම්පල සංඛ්‍යාවන්**

| | | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | අවස්ථා සංඛ්‍යාව | 02 | | 01 | 02 | 01 | 02 | | 03 | 04 | 02 | 01 | 01 |
| | සාම්පල සංඛ්‍යාව | 05 | | 04 | 05 | 05 | 05 | | 10 | 16 | 09 | 01 | 01 |
| මධ්‍යම දූෂණ මර්ධන ඒකකය, වලාන, පානදුර | අවස්ථා සංඛ්‍යාව | | | | | | | | | 01 | | | |
| | සාම්පල සංඛ්‍යාව | | | | | | | | | 02 | | | |
| **එකතුව** | අවස්ථා **සංඛ්‍යාව** | **02** | | **01** | **02** | **01** | **02** | | **03** | **05** | **02** | **01** | **01** |
| | **සාම්පල සංඛ්‍යාව** | **05** | | **04** | **05** | **05** | **05** | | **10** | **18** | **09** | **01** | **01** |

**මුළු අවස්ථා සංඛ්‍යාව *: 20***
**මුළු සාම්පල සංඛ්‍යාව *: 63***

**2.5 ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල වල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම**

පහත සඳහන් ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සහ ශ්‍රී ලංකා රේගුව මඟින් ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා ආයතනයට යොමුකරන ලද අතර එවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව රසායනික ප්‍රතිකාරක නැවත සකසා දෙන ලදී.

| ආයතනය | ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය | මාදක රසායන හඳුනා ගැනීමේ කට්ටල | 01 |
| | පූරෝගාමී රසායන හඳුනා ගැනීමේ කට්ටල | 01 |
| ශ්‍රී ලංකා රේගුව | මාදක රසායන හඳුනා ගැනීමේ කට්ටල | 01 |
| | පූරෝගාමී රසායන හඳුනා ගැනීමේ කට්ටල | 01 |
| **එකතුව** | | **04** |

**2.4 අධිකරණ අවශ්‍යතා සඳහා විද්‍යාත්මක සහාය ලබා දීම මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු ඇසීම් අවසන් වූ මත්ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා අවසාන වශයෙන් විද්‍යාත්මක සනාථ කිරීම.**

පෙබරවාරි සහ අගෝස්තු යන මාස වලදි අවස්ථා දෙකකදී පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ ඉල්ලීම අනුව මහාධිකරණ අංක 03 ගරු මහාධිකරණ විනිසුරුතුමාගේ දැනුම් දීම මත නඩු 20කට අදාල නඩු ඇසීම් අවසන් වූ මත්ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා අවසාන වශයෙන් විද්‍යාත්මක සනාථ කිරීම මත්ද්‍රව්‍ය විනාශ කිරීමේ දී ජාතික මාදක රසායනාගාරයේ විද්‍යාත්මක කාර්ය මණ්ඩලයේ විද්‍යාත්මක සහය ලබාදෙන ලදී. මෙහිදී නඩු 16ක් හෙරෝයින් සඳහාත් නඩු 04ක් ගංජා සඳහාත් වන බවට විශ්ලේෂණ මගින් තහවුරු කරන ලදී. මෙම මත්ද්‍රව්‍ය තොග ගරු මහාධිකරණ විනිසුරුතුමන් ඉදිරිපිට දී විනාශ කිරීම සිදුකරන ලදී.

2.5 1961 මාදක ඖෂධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යටතේ පාලනයට නතු රසායනික ද්‍රව්‍ය/ ඖෂධ/ ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය සඳහා පාලන යාන්ත්‍රණයක් සංස්ථාපනය සඳහා අවශ්‍ය තාක්ෂණික සහය විද්‍යාත්මක අනුමැතීන් ලබා දීම.

දූර්භාවිත ඖෂධ පාලනයට අදාළව විද්‍යාත්මක අනුමැතීන් ලබාදීම සහ තාක්ෂණික සහාය ලබා දීම ජාතිත මාදක රසායනාගාරයේ වගකීමයි. ඒ අනුව ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවට පහත විෂයයන් සම්බන්ධව විද්‍යාත්මක අනුමැතින් ලබාදෙන ලදී.

- ඉහත දැක්වෙන එක්සත් ජාතින්ගේ සම්මුතීන්ට අදාල කරුණු දැක්වීමට අනුව රසායන ද්‍රව්‍ය/ ඖෂධ වර්ග ආනයනය සහ අපනයන පාලනය සඳහා අවශ්‍යතාව.

  - 1961 මාදක ඖෂධ පිළිබඳ එකල සම්මුතිය.
  - 1971 මනෝවර්තක ද්‍රව්‍ය පිළිබඳ සම්මුතිය.

- ඉහත සම්මුතීන්ට අනුකුලව මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධ අධිකාරිත්වය සතු එකම ජාතික ආයතනය ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් නිකුත් කරන බලපත්‍ර වලට අනුව පාලනයට නතු රසායනික ද්‍රව්‍ය/ ඖෂධ ද්‍රව්‍ය ආනයනය සහ අපනයන සඳහා අදාල රෙගුලාසි නැවත සකස් කිරීමේ අවශ්‍යතාව.

ඒ අනුව ශ්‍රී ලංකාවේ දූර්භාවිත ඖෂධ පාලනය සහ මර්ධනය සඳහා ක්‍රියාකරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කාර්යක්ෂම ජාතික අධිකාරියක් බව හඳුනා ගන්නා ලද අතර එය මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය ආදි පාලනයට නතු ඖෂධ ආනයනය / අපනයනය හා බලය පවරන ඒකකයක් ලෙස පත් කරනු ඇත. ඊට අදාළව විද්‍යත්මක අනුමැතීන් සහ නිරීක්ෂණයන් මගින් යෝජනාවලියක් පිළියෙල කරන ලදී.

**මත්ද්‍රව්‍ය පාලන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් හා අදාල අනෙකුත් ආයතනයන සඳහා කාර්යක්ෂමතා හා බුද්ධිමය වර්ධන වැඩසටහන.**

පාලනයට යටත් ඖෂධ හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය අපනයනය, ආනයනය හා බෙදා හැරීම යන කාරණා වලදී මේ හා කටයුතු ආයතනයන්හි සේවය කරන නිලධාරීන්ගේ දැනුම හා පර්යේෂණ හැකියාව විද්‍යාත්මක පැතිකඩක් ඔස්සේ දැනුවත් කිරීමේ පුහුණු සැසි පැවැත්වීම ජාතික මාදක රසායනාගාරය විසින් සිදුකරනු ලැබේ. මෙහිදී දුර්භාවිත ඖෂධ හඳුනා ගැනීම හා නීතිය ක්‍රියත්මක කරන ආයතන නිළධාරීන්, විශේෂිතව පුහුණු කරනු ලැබේ. මෙවැනි පුහුණු වැඩසටහන් / වැඩමුළු මත්ද්‍රව්‍ය පාලන කටයුතු සඳහා සම්බන්ධ අනෙකුත් ආයතන සඳහා ද ක්‍රියාත්මක කරන ලදි.

3.1 විද්‍යාත්මක පුහුණු වැඩසටහන් / වැඩමුළු

ශ්‍රී ලංකාවේ නීති විරෝධි ඖෂධ හඳුනා ගැනිමේ හා පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම යන තේමාව යටතේ දෙදින විද්‍යාත්මක පුහුණු වැඩසටහන් පුරොගාමී පාලන අධිකාරියේ සහයෝගීත්වය ඇතිව සංවිධානය කරන ලද අතර මෙම පුහුණු වැඩමුළුවේ අභිමතාර්ථය වූයේ,

1. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය නීතිවිරෝධි ලෙස ජාවාරම් කිරීම සම්බන්ධ මූලික දැනුම ලබා දීම.
2. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය සම්බන්ධ පුළුල් අවබෝධාත්මක දැනුම ලබා දීම.
3. මාදක ඖෂධ, මනෝවර්තක ද්‍රව්‍ය සහ පුරෝගාමී රසායන ද්‍රව්‍ය හඳුනා ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල භාවිතා කරමින් ප්‍රායෝගික දැනුම ලබා දීම.
4. මත්ද්‍රව්‍ය වල නවීන ආකාර සම්බන්ධව සහභාගි වන්නන් යාවත්කාලීන කිරීම.

මත්ද්‍රව්‍ය පාලන සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම බලගන්වනු වස් උසාවි සඳහා විධිමත්ව නඩු ඉදිරිපත් කිරීම අරමුණු කොට නීති ක්ෂේත්‍රය පිළිබඳ නිළධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු සැසි 2ක් පවත්වන ලදී. මෙහිදී සාක්ෂි මෙහෙයවීම, චෝදනා ගොනු කිරීම, පැමිණිලි අධික්ෂණය, පොලිස් වාර්තා නඩු ගොනු කිරීම සම්බන්ධව පූර්ව පුහුණු සැසි, ඔප්පුකල හැකි ආකාරයට සාක්ෂි සැකසීම වැනි අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ දැනුවත් කරන ලදී. මෙම පුහුණු දේශන හිටපු නීතිපති ජනාධිපති නීතිඥ පාලිත ප්‍රණාන්දු මහතා විසින් මෙහෙවන ලදී.

**3.2 වෙනත් ආයතන සඳහා පුහුණු වැඩසටහන්**

දිවයිනේ ඖෂධහල් වල අලෙවිකරණු ලබන මත් විය හැකි ඖෂධ අවභාවිතාව පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයක් හා විශ්ලේෂණයන් කාලීනව ඉතා වැදගත් කමක් උසුලයි. මෙහිදි ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මනෝ වෛද්‍ය ඒකකයේ සිසුන් හට මේ පිළිබඳ පුහුණු වැඩසටහන් අඛන්ඩව පවත්වනු ලබයි මීට අමතරව මත්ද්‍රව්‍ය කළමණාකරන ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන් සඳහා ද විශේෂ දේශන හා පුහුණු සැසි පවත්වනු ලැබීය.
2015 වසරේ දි සිදු කරනු ලැබු මෙම වැඩමුළු වගු අංක 8 වගුවෙන් විස්තර කෙරේ.

### වගු අංක 8 2015 වසරේ දී පවත්වනු ලැබූ පුහුණු / සැසි සංඛ්‍යාව

| | | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 01 | 01 | | 01 | | | | 01 | 01 | | 01 | 01 |
| | සහභාගිවූ සංඛ්‍යාව | 18 | 18 | | 19 | | | | 22 | 21 | | 19 | 20 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 02 | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | 12 | | | | | | | | | | | |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | | | | |
| ශ්‍රී ලංකා පොලිස් | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 02 | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | 15 | | | | | | | | | | | |
| පොලිස් විශේෂ කාර්ය බලකාය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | 01 | 04 | 01 | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | 50 | 307 | 171 | | | | | | | | |
| ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 02 | | | | | 01 | 01 | | | | 01 | 02 |
| | සහභාගිවූ සංඛ්‍යාව | 11 | | | | | 20 | 40 | | | | 39 | 48 |
| සුරා බදු දෙපාර්තමේන්තුව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | | | | 01 |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | | | | 47 |
| ශ්‍රී ලංකා රේගුව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | 01 | | 01 | | 01 | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | 17 | | 12 | | 09 | | |
| පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | 01 | | | | | 01 | 01 |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | 16 | | | | | 09 | 18 |
| මත්ද්‍රව්‍ය කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන් | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | | | | |
| මත්ද්‍රව්‍ය කළමණාකරන සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන් | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | 01 | | | 01 | | 01 | | 01 | | 02 | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | 31 | | | 50 | | 50 | | 42 | | 99 | |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සබරගමු විශ්ව විද්‍යාලය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | | | | |
| සමාජ සේව දෙපාර්තමේන්තුව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | | | | |
| ප්‍රාදේශිය ලේකම් | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | | | | |
| **එකතුව** | **පුහුණු වැඩමුළු සංඛ්‍යාව** | **03** | **03** | **04** | **02** | **01** | **02** | **02** | **02** | **02** | **01** | **05** | **03** |
| | **සහභාගිවූ සංඛ්‍යාව** | **56** | **99** | **307** | **190** | **50** | **53** | **90** | **34** | **63** | **09** | **166** | **133** |

**මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව** ***: 30***
**සහභාගි වූ සංඛ්‍යාව** ***: 1250***

### 3.3 මත්ද්‍රව්‍ය හා සම්බන්ධ නීති ක්‍රියාත්මක කරන ආයතන නිළධාරින් සඳහා පවත්වනු ලබන පරිගණක පුහුණු වැඩසටහන්.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය (NDDCB) එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යයාලයේ (UNODC) තාක්ෂණික සහාය සමගින් මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවන් සවිමත් කිරීම සඳහා පරිගණක පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

මෙම පුහුණු වැඩසටහන්වල අභිමතාර්ථය වුයේ පහත සඳහන් විෂයයන් සම්බන්ධ පුළුල් දැක්මක් ලබා දීම මගින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වල ධාරිතාව සවිමත් කිරීමයි.

- සයුරේ, ගුවන හා භූමි මායිම් හරහා සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම් නැවැත්වීම.
- සොයා බැලීමේ ක්‍රමවේද.
- මත්ද්‍රව්‍ය පාලිත බෙදාහැරීම.
- අවදානම් කළමණාකරනය.
- මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සහ පරීක්ෂණ කටයුතු

කෙසේ වුවද මෙම වැඩසටහන් නව සැකසුම් වලින් සමන්විත වු අතර ඊ අධ්‍යාපන මොඩියුල සිංහළ මධ්‍යයෙන් 32ක් හා ඉංග්‍රිසි මධ්‍යයෙන් 86ක් වශයෙන් යාවත් කාලින කරන ලදී. මත්ද්‍රව්‍ය නීතිය ක්‍රියාත්මක කරවීම සඳහා මෙම වැඩසටහන් අත්‍යවශ්‍ය වන අතර නීති විරෝධි මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව ඉලක්ක ගත ක්‍රමවේද සහිත පුහුණු පාඨමාලාවන් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතාව පිළිබඳ පාලන හා නිවාරණ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩසටහන් මහත් පිටුවහලක් වනු ඇත.

ප්‍රමිතිගත කොට යාවත් කාලීන කරන ලද පුහුණු වැඩසටහන් මගින් ඉතාමත් සර්ථක ක්‍රියාදාමයක් සහිත තාක්ෂණික උපක්‍රම යොදාගනිමින් එමෙන්ම බුද්ධිමය උපක්‍රම භාවිතා කරමින් මෙහෙයුම් කිරීම කලහැකි අතර එමගින් ඉතාමත් සාර්ථකව නීතිය ක්‍රියාත්මක කලහැක. එමනිසා පරිගණක මුලාශ්‍ර පුහුණු පාඨමාලාව තුල දැනුම වර්ධනය කිරීම අවබෝධය ඇති කිරීම සහ ඉලක්ක ගත කාරණා සඳහා වෙනස් වු මොඩියුල මගින් ඉතා ප්‍රතිඵල දායක සාර්ථක උපක්‍රමික විධික්‍රම සහිත පුහුණු වැඩසටහන් නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන් හට ලබාදී ඇත. පහත වගුවෙන් පුහුණු වැඩසටහන් සම්බන්ධ විස්තර ඇතුලත් කොට ඇත.

වගු අංක 9 2015 වසරේ පරිගණක මූලාශ්‍ර පුහුණු පාඨමාලාව සංඛ්‍යාව

| | | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | | | | |
| ශ්‍රී ලංකා යුධ හමුදාව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 02 | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | 05 | | | | | | | | | | | |
| ශ්‍රී ලංකා පොලිසිය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 02 | | | | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | 04 | | | | | | | | | | | |
| පොලිස් විශේෂ කාර්ය බලකාය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | 04 | 02 | | | | | | | | |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | 30 | 17 | | | | | | | | |
| ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | 01 | | | | | | | | | 02 | | 02 |
| | සහභාගිවූ සංඛ්‍යාව | 01 | | | | | | | | | 16 | | 06 |
| සුරා බදු දෙපාර්තමේන්තුව | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | | | | | 02 | 02 | | 02 |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | | | | | 09 | 08 | | 05 |
| පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය | පුහුණු වැඩමුළු සංඛ්‍යාව | | | | | 02 | | | | | | | 03 |
| | සහභාගිවූ සංඛ්‍යාව | | | | | 17 | | | | | | | 09 |
| **එකතුව** | **පුහුණු වැඩමුළු සංඛ්‍යාව** | **02** | **-** | **04** | **02** | **02** | **-** | **-** | **-** | **02** | **04** | **-** | **03** |
| | **සහභාගිවූ සංඛ්‍යාව** | **10** | **-** | **30** | **17** | **17** | **-** | **-** | **-** | **09** | **24** | **-** | **20** |

**මුළු පුහුණු වැඩමුළු සංඛ්‍යාව** ***: 19***
**සහභාගි වූ සංඛ්‍යාව** ***: 127***

## 3.4 මත්ද්‍රව්‍ය දුර්භාවිතාව සම්බන්ධ මහජනතාව සඳහා පැවැත්වූ වැඩසටහන්

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ඉල්ලීම මත "විදු ලොව " විද්‍යාත්මක වැඩසටහන සඳහා මහජනතාව දැනුවත් කිරීම පිණිස දින 2ක සම්පත් දායකත්වය ලබා දෙන ලදී. මෙම වැඩසටහනේ ද මත්ද්‍රව්‍ය භාවිතාව විකාශනය වීම පිළිබඳ විද්‍යාත්මක දැනුවත් කිරීමක් මහජනතාව වෙත ලබා දුනි.

## 3.5 පුරෝගාමී ද්‍රව්‍ය පාලන අධිකාරියේ අධීක්ෂණ කටයුතු

පෙර වසරේ මෙන්ම මෙහි අධීක්ෂණ කටයුතු විද්‍යාත්මක නිලධාරි ඩබ්.ඩී. අමරසිංහ මහතා විසින් සිදුකළ අතර ඔහු වැඩබලන රසායනඥ ධුරයට පත් කරන ලදී. මෙහි අධීක්ෂණ කටයුතු මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ විද්‍යාත්මක පර්යේෂණ ඩී.පී.පී. වීරසිංහ විසින් 2015 පෙබරවාරි 16 දින සිට සිදු කරනු ලැබීය.

2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ II වන පරිච්ඡේදයෙහි 19 වන සහ 21 වන වගන්ති වල විස්තර කරන ලද පුරෝගාමී පාලන අධිකාරියට අදාල සියළුම කටයුතු රෙගුලාසි අනුව අධීක්ෂණය කරන ලද අතර පුරෝගාමී ද්‍රව්‍ය පාලන අධිකාරියේ සේවක මණ්ඩලය භාරව ඇති රාජකාරීන්ද පරීක්ෂා කරන ලදී.

**දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය.**

මේ කර්තව්‍යයේදී ජීව විද්‍යාත්මක සාම්පල වල ඇති පාලනයට නතු ඖෂධයන්ගේ පරිවෘත්තීය ද්‍රව්‍ය කොටස් හඳුනා ගැනීම සඳහා පුද්ගල හා ආයතන මට්ටමින් විශ්ලේෂණ කරනු ලබයි. විශ්ලේෂණයෙන් පසුව මත්ද්‍රව්‍ය වලින් නිදහස් බවට දෙනු ලබන සහතිකය රැකියා ලබා ගැනීම හා වෙනත් කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම රසායනාගාර වාර්තාව රෝග නිධාන හඳුනා ගැනීම ප්‍රතිකාර තීරණය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා පුද්ගලයන් යොමු කිරීම වැනි කාරණා වලදී ප්‍රයෝජනවත් වේ.

විෂ අබිං අන්තරායකර ඖෂධ පාලනය පිළිබඳ පනත හා 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධි ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත බලගැන්වීම උදෙසා ජාතික මාදක රසායනාගාරය විසින් විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක සාම්පල වල විස්තරාත්මක ලේඛණයන් පහත වගු අංක 10 මඟින් ඉදිරිපත් කෙරේ.

වගු අංක 10 2015 වසරේදී විශ්ලේෂණය කරන ලද ජීව විද්‍යාත්මක නියැඳි සංඛ්‍යාව

| | | JAN | FEB | MAR | APR | MAY | JUN | JUL | AUG | SEP | OCT | NOV | DEC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රජයේ පෞද්ගලික රෝහල් | සාම්පල සංඛ්‍යාව | | 01 | 04 | 01 | 04 | | | 05 | 04 | 05 | 02 | 01 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | 02 | 07 | 02 | 14 | | | 11 | 06 | 18 | 02 | 03 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | සාම්පල සංඛ්‍යාව | | | | 01 | | | | | | | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | 01 | | | | | | | | |
| ඩෙලිකා මෙඩිකෙයා මධ්‍යස්ථානය | සාම්පල සංඛ්‍යාව | | | | | | 02 | | | | 01 | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | | | 10 | | | | 05 | | |
| නාවින්න වෛද්‍ය මධ්‍යස්ථානය | සාම්පල සංඛ්‍යාව | | | | | | | | | 01 | | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | | | | | | 02 | | | |
| බ්ලූ ක්‍රොස් මධ්‍යස්ථානය | සාම්පල සංඛ්‍යාව | | | | | | 01 | | | | | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | | | 02 | | | | | | |
| මහේස්ත්‍රාත් උසාවිය | සාම්පල සංඛ්‍යාව | | | | | | 01 | | 02 | 01 | 01 | | 01 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | | | 01 | | 02 | 10 | 01 | | 01 |
| සැන්කෝ ලයින් ෂිපින් පුද්. සමාගම | සාම්පල සංඛ්‍යාව | | | | | | | | | | 01 | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | | | | | | | 02 | | |
| ගුවන් හමුදා රෝහල | සාම්පල සංඛ්‍යාව | | | | | 02 | | | | | | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | | 04 | | | | | | | |
| වෙනත් | සාම්පල සංඛ්‍යාව | | | | | 04 | | | | | | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | | | | 16 | | | | | | | |
| **එකතුව** | සාම්පල සංඛ්‍යාව | | **01** | **04** | **02** | **10** | **04** | | **07** | **06** | **08** | **02** | **02** |
| | පරීක්ෂණ සංඛ්‍යාව | | **02** | **07** | **03** | **34** | **13** | | **13** | **18** | **26** | **02** | **04** |

***මුළු සාම්පල සංඛ්‍යාව : 46***

***මුළු පරීක්ෂණ සංඛ්‍යාව : 122***

**ක්‍රියාකාරිත්ව වර්ධන ඖෂධ විශ්ලේෂණය, නව සංවර්ධන වැඩසටහන**

අදවන විට රටට බරපතල ප්‍රශ්නයක් වී ඇති ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක / ඖෂධ භාවිතය සම්බන්ධයෙන් ගතහැකි ඉක්මන් පිළියමක් ලෙස, අනිසි ලෙස භාවිතා කරන ඖෂධ පාලනය, දුර්භාවිතය වැලැක්වීම පිළිබද වගකිවයුතු එකම රාජ්‍ය ආයතනය ලෙස අ.ඖ.පා.ජා.ම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තහනම් උත්තේජක / ඖෂධ විශ්ලේෂණය ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන ජාතික ක්‍රීඩා විද්‍යායතනය හා ඒකාබද්ධව පරික්ෂණ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී.

**5.1 රසායනාගාරයේ විශ්ලේෂණ හැකියාව ඉහළ මට්ටමකට ගෙන ඒම.**

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දේහ තරල වල අඩංගු ක්‍රීඩාවේදී භාවිතා කරන තහනම් ද්‍රව්‍ය හා ඒවායේ පරිවෘත්තිය ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා පහත දක්වා ඇති විශ්ලේෂණ හා තාක්ෂණික ක්‍රම භාවිතා කරන ලදී.

- විශ්ලේෂණ සහ පරික්ෂණ ක්‍රමවේද සොයාගැනීම.
- පරික්ෂණ ක්‍රමවේද වලංගු කිරීම.

**5.2 ජීව විද්‍යාත්මක සාම්පල විශ්ලේෂණය.**

ජාතික ක්‍රීඩා විද්‍යායතනය මඟින් ජීව විද්‍යාත්මක සාම්පල 03ක් තහනම් ද්‍රව්‍ය විශ්ලේෂණයට යොමුකර ඇති අතර ඒවා විශ්ලේෂණය කරන ලදී.

වගු අංක 11: අදාළ කාලය තුළදි විශ්ලේෂණ කළ ජීව විද්‍යාත්මක සාම්පල සංඛ්‍යාව

| **ආයතනය** | සාම්පල සංඛ්‍යාව | **පරික්ෂණ වර්ගය** | විශ්ලේෂණ කරන ලද ඖෂධ / පරිවෘත්තිය ද්‍රව්‍ය |
|---|---|---|---|
| ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 03 | Steroids | තහනම් ලැයිස්තුව WADA |
| **එකතුව** | 03 | | |

**5.3 අතිරේක ආහාරමය නිෂ්පාදන වල අඩංගු තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණ.**

ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන වල ඇති තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම රසායනාගාරය මඟින් සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ මෙන්ම පාසැල් මට්ටමේද ක්‍රීඩක ක්‍රීඩිකාවන් භාවිතා කරන අතිරේක ආහාර නිෂ්පාදන තුළ තහනම් ද්‍රව්‍ය අඩංගු බවට ලැබුණු තොරතුරු අනුව මෙවැනි ද්‍රව්‍ය විශ්ලේෂණ කොට එවැනි ද්‍රව්‍ය හඳුනා ගැනීම ක්‍රීඩාවේ ජීවගුණය පවත්වා ගැනීම හා ඉදිරියේ දී ඇතිවිය හැකි අපකීර්තිමය තත්වය නිසා රටට ඇතිවිය හැකි බලපෑම අවම කරනු වස් ජාතික කර්තව්‍යයක් ලෙස සලකා ජාතික මාදක රසායනාගාරය මෙම අතිරේක ආහාර නිෂ්පාදන විශ්ලේෂණ කටයුතු අරඹන ලදී. මෙහිදී ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය / ශ්‍රී ලංකාවේ තහනම් උත්තේජක මර්ධන ආයතනය මඟින් ඉදිරිපත් කරනු ලැබූ සම්පල විද්‍යාත්මක විශ්ලේෂණයන් පර්යේෂණ මට්ටමෙන් සිදු කරන ලදී. දිවයිනේ විවිධ අතිරේක ආහාර නිෂ්පාදන සමාගම් මඟින් ඉදිරිපත් කරන ලද සම්පල විශ්ලේෂණයන් වගු අංක 12 මඟින් දැක්වේ.

**වගු අංක 12** : අදාළ කාලය තුළදී විශ්ලේෂණය කළ අතිරේක ආහාර නිෂ්පාදන සම්පල සංඛ්‍යාව.

| | අවස්ථා ගණන | සාම්පල සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජිත ආයතනය | 02 | 05 |
| ජාතික ක්‍රීඩා විද්‍යායතනය | 01 | 01 |
| මෙගා ලයිෆ් සයන්සස් පුද්. සමාගම | 01 | 01 |
| ඇස්ට්‍රන් සමාගම | 03 | 03 |
| ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය | 01 | 04 |
| ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය | 01 | 01 |
| **එකතුව** | **09** | **15** |

**අනෙකුත් සේවාවන්**

**6.1 පරීක්ෂණ කට්ටල වල තත්ත්ව පරීක්ෂා කිරීම**

මත්ද්‍රව්‍ය දුර්භාවිත කිරීමට යොමුවී ඇතිද යන්න ගුණාත්මකව ජීව විද්‍යාත්මක සාම්පල උපයොගි කර පරීක්ෂා කරන Immuno Chromatographic 1-Step පරීක්ෂණ කට්ටලවල නිර්වද්‍යතාවය පරීක්ෂා කිරීම සෙනිත් ඉම්පෙක්ස් පුද්. සමාගම සඳහා සිදු කරන ලදී.

| පරීක්ෂණ කට්ටලයේ නම | සංඛ්‍යාව |
|---|---|
| කොකේන්<br>මුත්‍රා සාම්පල වල කොකේන් ගුණාත්මක විශ්ලේෂණය සඳහා පරීක්ෂණය | පැකට් 02<br>පරීක්ෂණ කට්ටල 30 |
| මෙත්ඇම්ෆෙටමින්<br>මුත්‍රා සාම්පල වල මෙත්ඇම්ෆෙටමින් ගුණාත්මක විශ්ලේෂණය සඳහා පරීක්ෂණය | පැකට් 02<br>පරීක්ෂණ කට්ටල 30 |
| කැනබිනොයිඩ<br>මුත්‍රා සාම්පල වල කැනබිනොයිඩ ගුණාත්මක විශ්ලේෂණය සඳහා පරීක්ෂණය | පැකට් 02<br>පරීක්ෂණ කට්ටල 30 |
| ඕපියේට<br>මුත්‍රා සාම්පල වල ඕපියේට ගුණාත්මක විශ්ලේෂණය සඳහා පරීක්ෂණය | පැකට් 02<br>පරීක්ෂණ කට්ටල 30 |

**දුර්භාවිත මත්ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර ප්‍රමිතිකරණය, පවත්වාගෙන යැම හා නඩත්තුකරණය.**

**7.1 ජාත්‍යන්තර කාර්යක්ෂමතා පරීක්ෂණ වැඩසටහන්.**

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන මගින් ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන නමින් පවත්වන ජාත්‍යන්තර රසායනාගාර කුසලතා පරීක්ෂණ වැඩසටහනට ජාතික මාදක රසායනාගාරය සහභාගී වේ. මෙම වැඩසටහනට සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල රසායනාගාරයන් සහභාගී වේ.

මේ සඳහා අඛණ්ඩව සිදුකරන සහභාගීත්වය මගින් ගෝලීය මට්ටමෙන් රසායනාගාර සම්මතකරණ කර ගැනීම, විශ්ලේෂණ හැකියාවන් වර්ධනය කරගැනීම නිවැරදි තීන්දු ගැනීම පිළිබඳ වඩා නිවැරදි ප්‍රවිෂ්ඨයක් ලබා ගනී. ස්ථාවර මෙන්ම ඒකාබද්ධ ප්‍රතිඵල හා වර්තාකරණයන් සියලුම රසායනාගාර මගින් ලබා ගැනීම මෙහිදී බලාපොරොත්තු වේ.

මේ සඳහා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීමේ කාර්යාලය මගින් අවශ්‍ය නිර්දිෂ්ඨ සාම්පල සහ හඳුනා නොගත් සැක සහිත සාම්පල සහ ජීව විද්‍යාත්මක සම්පල, හඳුනා ගැනීම සහ විශ්ලේෂණ සඳහා එවනු ලබයි.

<u>ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන **(ICE) – 2014** සහ **2015**</u>

මෙම කාලය තුළ ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන් 2014 අදියර 2 සහ 2015 අදියර 1 සඳහා රසායනාගාරය සහභාගී විය. මෙම සාම්පල සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණයන් සිදුකොට මාදක ද්‍රව්‍ය අඩංගු හෝ නැති බවට (සැක සහිත සාම්පල හා ජීව විද්‍යාත්මක සාම්පල) අවශ්‍ය වාර්තා සපයන ලදී.

<u>ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන **(ICE) – 2014** අදියර 2</u>

ජාත්‍යන්තර සහායෝගීතා අභ්‍යාස වැඩසටහන් 2014 අදියර 2 ප්‍රතිඵල සමාලෝචනයට අනුව සුදුසු කම් ලබන රසායනාගාර ලයිස්තු ගත කිරීම මේ සඳහා රටවල් 61 ක රසායනාගාර 190ක් සහභාගි වී ඇති අතර වගු අංක 13 මගින් ජාතික මාදක රසායනාගාරයේ ප්‍රතිඵල ඇගයීම දැක්වේ.

**වගු අංක 13 ඃ 2014 දෙවන වටයේ ICE වැඩසටහනට අදාල ප්‍රතිඵල ඇගයීම**

| පරීක්ෂණය | අගය |
|---|---|
| මෙත් ඇම්ෆෙටමින් | 0.7 |
| කොකේන් | -0.8 |

පිළිගතහැකි සීමාව ( Z ) අගය ඃ <2

## ජාත්‍යන්තර සහයෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) 2015 අදියර 1

ජාත්‍යන්තර සහායෝගීතා අභ්‍යාස වැඩසටහන (ICE) – 2015 අදියර 1 ප්‍රතිඵල සමාලෝචනයට අනුව සුදුසු කම් ලබන රසායනාගාර ලයිස්තු ගත කිරීම මේ සඳහා රටවල් 66ක රසායනාගාර 207ක් සහභාගි වී ඇති අතර වගු අංක 14 මගින් ජාතික මාදක රසායනාගාරයේ ප්‍රතිඵල ඇගයීම දැක්වේ.

**වගු අංක 14 ඃ 2015 පළවන වටයේ ICE වැඩසටහනට අදාල ප්‍රතිඵල ඇගයීම**

| පරීක්ෂණය | අගය |
|---|---|
| කොකේන් | -0.4 |
| ඇම්ෆෙටමින් | -0.8 |
| හෙරොයින් | 0.6 |

පිළිගතහැකි සීමාව ( Z ) අගය ඃ <2

## 7.2 ISO 9001 තත්ත්ව කළමණාකරන සහතිකය

මේ සඳහා රසායනාගාරය සුදානම් කිරීම රසායනාගාරයෙහි විද්‍යාත්මක විශ්ලේෂණ කිරීමට ඇති හැකියාව වර්ධනය කිරීමෙන්ද ක්‍රීඩා සම්පල විශ්ලේෂණය සිදුකිරීම උසස් මට්ටමක පවත්වා ගනිමින් ද කළමණාකරන කටයුතු විධිමත් කිරීමෙන්ද තහවුරු කොට ඇත.

මේ අනුව අවශ්‍ය පළමු විගණනය මේ වන විට සිදුකර ඇති අතර මේ වනවිට විගණනය අනුව නිවැරදි කිරීම් සිදු කරමින් පවති.

### මුල්‍යමය විස්තර

වගු අංක 15 ජාතික මාදක රසායනාගාරයේ සේවය ලබාදෙමින් 2015 වසර සඳහා සිදුකල ඉපයීම් සම්බන්ධ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| විශ්ලේෂණ ආකාරයන් | රු. |
|---|---|
| මද්‍යසාර සාම්පල විශ්ලේෂණය | *299,000.00* |
| දුර්භාවිත ඖෂධයන්ගේ පරිවෘත්තිය ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විශ්ලේෂණය | *88,750.00* |
| ක්‍රීඩාවේදී භාවිතා කරන තහනම් උත්තේජකවල පරිවෘත්තිය ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ විශ්ලේෂණය | *12,000.00* |
| අතිරේක ආහාරමය නිශ්පාදන වල අඩංගු තහනම් ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණ | *250,000.00* |
| ක්ෂේත්‍ර පරීක්ෂණ කට්ටල වල ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම හා නැවත සකස් කිරීම | *10,000.00* |
| පරීක්ෂණ කට්ටල තත්ත්ව පරීක්ෂා කිරීම | *14,000.00* |
| **එකතුව** | ***673,750.00*** |

## 8.7 පුරෝගාමී පාලන අධිකාරිය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම නිසි බලධාරියා ලෙස පුරෝගාමී පාලන අධිකාරිය විසින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයන අපනයන හා ව්‍යාප්තිය පාලනය කිරීම පිණිස පහත සඳහන් කාර්යන් වල නියැලෙනු ලබයි...
1.බලපත්‍ර නිකුත් කිරීම

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ ලයිස්තුගත කර ඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය සඳහා සෑම පුද්ගලයෙකුම පුරෝගාමී පාලන අධිකාරියේ බලපත්‍ර ලබාගත යුතුය.

11. පරිශ්‍ර ලියාපදිංචිය

බලපත්‍ර ලාභී සෑම ආනයන අපනයන කරුවෙකු ම පනතේ ලයිස්තු ගත කර ඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍යයන්ට අදාල කටයුතු සිදු කෙරෙන ගබඩා පරිශ්‍රයන් ලියාපදිංචි කළයුතුය.

111. අධීක්ෂණය සහ පිරීක්සුම

පනතේ ලයිස්තුගත කරඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍යයන් ගබඩාකර ඇති පරිශ්‍රයන් සහ ඊට අදාළ කාර්යන් ත්‍රෛමාසිකව පරීක්ෂාවට ලක් කළයුතුය.

අධිකාරිය විසින් .......

- ❖ සමාගම් පරීක්ෂා කිරිම.
- ❖ සමාගම් ලියාපදිංචි කිරිම.
- ❖ ''පූර්වජ රසායන පාලන යාන්ත්‍රණය" ග්‍රන්ථය එළිදැක්වීම.
- ❖ මත්ද්‍රව්‍ය සම්බන්ධ නීතිය බලාත්මක කරන අධිකාරීන් සහ අනෙකුත් මත්ද්‍රව්‍ය/ පූර්වජ රසායන ද්‍රව්‍ය හා කටයුතු කරන නියෝජිත ආයතන වල ක්‍රියාකාරීත්වය ඉහළනැංවීම.
- ❖ මත්ද්‍රව්‍ය සම්බන්ධ නිතීය ක්‍රියාත්මක කරන නිළධාරින් සඳහා පරිගණක පුහුණු වැඩසටහන්දියත් කිරීම
- ❖ පූර්වජ රසායන ද්‍රව්‍යයන් අපහරණ සඳහා විද්‍යාත්මක නිර්දේශ සැපයීම

**සමාගම් පරීක්ෂා කිරීම**

2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති ලයිස්තු ගත කර ඇති වගු අංක 1 සහ 11 සඳහන් ද්‍රව්‍යයන් ගබඩා කර ඇති පරිශ්‍රයන් පුරෝගාමී පාලන අධිකාරිය විසින් පරීක්ෂාවට ලක්කරන ලදී. එසේම පූර්වජ රසායන අංශයේ ලියාපදිංචිය සම්පූර්ණ කරන ලද ආයතන වල වාර්තා සහ උපාංග ආදිය පරීක්ෂා කරනු ලැබේ. ඒ අනුව 2015 වර්ෂය තුලදී පහත සඳහන් අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී.

| **මාසය** | **පිරික්සුම** |
|---|---|
| ජනවාරි පෙබරවාරි | 19 |
| මාර්තු | 09 |
| අප්‍රේල් | 07 |
| මැයි | 11 |
| ජූනි | 07 |
| ජූලි අගෝස්තු සැප්තැම්බර් | 13 |
| ඔක්තෝම්බර් නොවැම්බර් | 02 |
| දෙසැම්බර් | 01 |
| මුළු ගණන | 69 |

**සමාගම් ලියාපදිංචි කිරීම**

| | |
|---|---|
| ආනයනකරුවන් | 117 |
| අපනයනකරුන් | |
| අවසන් භාවිතා කරන්නන් | 859 |
| වෙළෙන්දන් | 112 |
| පරිශ්‍ර | 237 |
| මුළු ගණන | 1325 |

**"පූර්වජ රසායන පාලන යාන්ත්‍රණය" ග්‍රන්ථය එළි දැක්වීම**

මත්ද්‍රව්‍ය සම්බන්ධ නිතීය බලාත්මක කරන නියෝජිත වරුන්ගේ සහ අනෙකුත් අධිකාරින් වල දැනුම සහ කුසලතා වර්ධනය කිරීමේ හා පූර්වජ රසායන පාලන අධිකාරියේ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2015 පෙබරවාරි 16 දින "පූර්වජ රසායන පාලන යාන්ත්‍රණය " නමින් ග්‍රන්ථයක් එළි දක්වන ලදී.

මෙම පොත මුද්‍රණයේ සහ ප්‍රකාශනයේ අරමුණ පහත පරිදිවේ.

මත්ද්‍රව්‍ය සම්බන්ධ නිතීය බලාත්මක කිරීමේ නිලධාරීන් සඳහා ඔවුන්ගේ විශේෂඥ කුසලතාවයන් වර්ධනය කිරීමේ උපක්‍රමයක් ලෙස පූර්වජ රසායන ද්‍රව්‍ය පිළිබඳ බුද්ධි එකතුවක් සහ සොයා ගැනිම් වලින් සමන්විත විස්තරාත්මක පරිශීලන ග්‍රන්ථයක් සැපයීම.

ලයිස්තු ගත රසායන ද්‍රව්‍ය නීත්‍යානුකූල පරිභෝජනය පිළිබඳ තොරතුරු සන්නිවේදනය ප්‍රවර්ධනය සඳහා වැදගත් වන පූර්වජ රසායන ක්ෂේත්‍රයේ කටයුතු වල නියැලෙන පුද්ගලයින්ගේ දැනුම වර්ධනය කිරීම සහ මත්ද්‍රව්‍ය පිටුදැකීමේ ජාතික ප්‍රයත්නය එලදැරීම, විශේෂයෙන් පූර්වජ රසායන ද්‍රව්‍ය භාවිත කරමින් නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ පූර්වජ රසායන අධිකාරිය සමඟ සහ සම්බන්ධතා ප්‍රවර්ධනය

**මත්ද්‍රව්‍ය සම්බන්ධ නිතීය ක්‍රියාත්මක කරන ආයතන සහ එහි ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම**

මත්ද්‍රව්‍ය සම්බන්ධ නිතීය ක්‍රියාත්මක කරන ආයතන සහ එහි ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

| ආයතනයේ නම | සහභාගී වූ ගණන |
|---|---|
| විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලිසිය) | 398 |
| විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලිසිය) | 171 |
| පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, ශ්‍රී ලංකා රේගුව | 95 |
| පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 62 |
| ශ්‍රී ලංකා රේගුව | 12 |
| ශ්‍රී ලංකා වෙරළආරක්ෂක දෙපාර්තමේන්තුව | 39 |

<u>පරිගණක ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>

| ආයතනයේ නම | සහභාගී වූ ගණන |
|---|---|
| විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලිසිය) | 29 |
| විශේෂ කාර්ය බලකාය (ශ්‍රී ලංකා පොලිසිය) | 17 |
| පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය | 17 |
| ශ්‍රී ලංකා වෙරළආරක්ෂක දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව | 24 |

## 9. ආදායම් ප්‍රකාශය

### 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | | 2015 | 2014 |
|---|---|---|---|
| **ආදායම්** | | රු | රු |
| රාජ්‍ය පුනරාවර්ථන ප්‍රදාන | සට. 17 | 170,633,833 | 139,123,000 |
| වෙනත් ආදායම් | සට. 18 | 8,069,704 | 7,158,898 |
| විදේශ පුනරාවර්ථන ප්‍රදාන | | 105,900 | 1,073,588 |
| | | 178,809,437 | 147,355,485 |
| **වියදම්** | | | |
| පුද්ගල හා පරිපාලන පිරිවැය | සට. 20 | 110,700,459 | 73,907,192 |
| මෙහෙයුම් පිරිවැය | සට. 21 | 36,738,975 | 40,136,902 |
| දේශිය/විදේශිය වෙන්කිරීම් | සට. 22 | 466,000 | 398,000 |
| නිවාරණ පිරිවැය | සට. 23 | 4,185,199 | 2,764,309 |
| ප්‍රතිකාර හා පුනරුත්ථාපන | සට. 24 | 15,634,080 | 17,449,489 |
| පර්යේෂණ පිරිවැය | සට. 25 | 4,788,572 | 3,914,546 |
| බාහිර සේවා පිරිවැය | සට. 26 | 3,872,679 | 3,545,951 |
| විද්‍යාගාර පිරිවැය | සට. 27 | 610,985 | 1,189,206 |
| බන්ධනාගාර හා අනෙකුත් මධ්‍යස්ථාන පිරිවැය | සට. 28 | 161,235 | 14,829 |
| මානව සම්පත් සංවර්ධන පිරිවැය | සට. 29 | 732,236 | 599,423 |
| මූල්‍ය පිරිවැය | සට. 30 | 521,529 | 245,153 |
| ක්ෂයවීම් | සට. 31 | 14,508,323 | 18,870,275 |
| ඉවත්කිරීමේ අලාභ | සට. 32 | | 226,836 |
| මුළු මෙහෙයුම් පිරිවැය | | 192,920,272 | 163,262,111 |
| වියදම් ඉක්මවන ආදායම් අතිරික්තය හෝ හිඟය | | (14,110,836) | (15,906,625) |

සභාපති
අ.ඖ.පා.ජා.ම

මාණ්ඩලික සාමාජික
අ.ඖ.පා.ජා.ම

## 10. ශේෂ පත්‍රය

### 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | | 2015 | | 2014 | |
|---|---|---|---|---|---|
| **වත්කම් සටහන්** | | රු | රු | රු | රු |
| බැංකුවේ ඇති මුදල් | සට. 02 | 6,345,367 | | 8,408,554 | |
| ණයගැතියෝ | සට. 03 | 10,161,282 | | 9,416,116 | |
| පුරෝගාමී පාලන අධිකාරිය | සට. 04 | - | | - | |
| තොගය | සට. 05 | 3,130,329 | | 2,029,341 | |
| පෙර ගෙවීම් | සට. 06 | 2,461,847 | | 1.982,362 | |
| කොටස් වශයෙන් ගෙවීම් | සට. 07 | 11,449,488 | | 10,741,487 | |
| අත්තිකාරම් | සට. 08 | 1,939,670 | | 1,906,010 | |
| තැන්පත් | සට. 09 | 356,813 | | 356,813 | |
| | | | 35,844,795 | | 34,840,683 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ආයෝජන හා ස්ථාවර වත්කම් | සට. 10 | | 83,627,182 | | 81,166,499 |
| මුළු වත්කම් | | | 119,471,977 | | 116,007,182 |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ණයහිමියෝ | සට. 11 | 51,000 | | 54,500 | |
| උපචිත වියදම් | සට. 12 | 5,381,179 | | 5,486,978 | |
| රඳවාගත් වියදම් | සට. 13 | 10,000 | | 10,000 | |
| | | | 5,442,179 | | 5,551,478 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂිත | සට. 14 | | 22,861,183 | | 22,409,253 |
| **හිමිකම්** | | | | | |
| පරිත්‍යාග | | | | | |
| රජයේ ප්‍රධාන ප්‍රාග්ධන | සට. 15 | 17,233,000 | | 30,000,000 | |
| ප්‍රාග්ධන වෙන්කිරීම් | සට. 16 | 63,343,346 | | 48,288,171 | |
| ප්‍රත්‍යාගණන වෙන්කිරීම් | | 25,184,005 | | 25,184,005 | |
| පෙර වසරේ ගැලපුම් | | (480,900) | | 480,900 | |
| අතිරික්තය/ඌනතාවය | | (14,110,836) | | (15,906,625) | |
| මුළු හිමිකම් | | | 91,168,616 | | 88,046,451 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 119,471,977 | | 116,007,182 |

## 11. ගිණුම්කරණ ප්‍රතිපත්ති
## වැදගත් ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති

1. පොදු කරුණු

1.1 සැකසීමේ පදනම

1.1 පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම සහ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී.

1.1.3 ඓතිහාසික පිරිවැය යටතේ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

1.1.4 ශ්‍රී ලංකා රුපියල් වලින් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

1.2 රජයේ ප්‍රදානයන් පුනරාවර්තන හා ප්‍රාග්ධන යන දෙයාකාරයෙන් මණ්ඩලය වෙත ලැබේ.

2. වත්කම් තක්සේරු කිරීමේ පදනම

2.1 ඉඩම් හා ගොඩනැගිලි, ගෘහ උපකරණ, කාර්යාලීය උපකරණ සහ වෙනත් වත්කම් සමුච්චිත ක්ෂයවීම් අඩුකල පිරිවැය හෝ තක්සේරුව අනුව දක්වනු ලැබේ.

2.2 සරල රේඛීය ක්‍රමය උපයෝගී කර වත්කම් වෙනුවෙන් දක්වන අතර එම ප්‍රමාණයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 5% |
| කාර්යාලීය උපකරණ | 20% |
| ගෘහ උපකරණ | 10% |
| සවි කිරීම් | 20% |
| රථ වාහන | 25% |
| පුස්තකාල පොත් | 25% |

3. බැරකම් හා ප්‍රතිපාදන

3.1 ශේෂ පත්‍රයේ සඳහන් දිනට සියලුම ද්‍රව්‍යවල ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් බැඳීම් සහ අවිනිශ්චිත බැරකම් ගිණුම් පිළිබඳ සටහන් වල අනාවරණය කර තිබේ.

3.2 තොග ලේඛන සාමාන්‍ය පිරිවැයට අනුව තක්සේරු කර තිබේ.

4. ආදායම් හා වියදම් ගිණුම

4.1 මණ්ඩලයේ ආදායමින් නිරූපණය වන්නේ ප්‍රාග්ධනයන්ගෙන් ලබන ආදායම් සහ අනෙකුත් විවිධ ආදායම්ය.

4.2 සියලුම ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

## 12. විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එල්ඕආර්/බි/එන්ඩිඩිසිබි/2015/1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 නොවැම්බර් 23 දින

සභාපති,

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2016 අප්‍රේල් 29 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවය ඇති විට ඒවා වෙනම හඳුනාගත යුතු වුවත් මණ්ඩලයේ ඉඩම් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

(ආ) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.1 අනුව වත්කම් පිරිවැයට හෝ තක්සේරු වටිනාකමට පෙන්වා ඇති බව සඳහන් වුවද පිරිවැයට හා තක්සේරු වටිනාකමට හඳුනා ගන්නා ලද වත්කම් පන්ති පිළිබඳ අනාවරණය කර නොතිබුණි.

3

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.2 අනුව ඉඩම් සහ ගොඩනැගිලි වෙන්ව හඳුනා නොගෙන ඉඩම් සඳහා සියයට 5 ක් බැගින් ක්ෂය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

2015 වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබූ එකතුව රු. 1,136,503 ක වියදම් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.356,813 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර ඉන් බාහිර ආයතන 18 ක තැන්පත් කරන ලද රු.295,313 ක් වටිනා තැන්පතු පිළිබඳ ලදුපත් මණ්ඩලය සතු නොවූ බැවින්, එම තැන්පතු මුදල් කර ගැනීම පිළිබඳ අවදානමක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂ 10 කට අධික කාලයක් පවතින එකතුව රු.1,782,060 ක් වූ විවිධ අත්තිකාරම් 16 ක් අයකරගෙන නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු.2,971,405 ක් වූ හෝමාගම පිටිපන ඉඩම සඳහා හිමිකම් සහතික හා රු.1,425,000 ක් වූ පරිගණක මිලදී ගැනීම් සඳහා වූ බිල්පත් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් හා උපලේඛනයේ එකතු ශේෂ අතර රු.15,251,102 ක වෙනසක් පැවතුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත | ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වන පොලිස්පති නම්කළ නියෝජිත, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නම්කළ නියෝජිත හා ශ්‍රී ලංකා රේගුව නම්කළ නියෝජිතයන්ගේ පැමිණීම සියයට 30 ක අඩු මට්ටමක පැවතුණි. |
| (ආ) 2007 අංක 54 දරන ඖෂධ වලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්තාපනය කිරීම) පිළිබඳ පනතේ 4(3) වගන්තිය | පුද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන විසින් සිදුකරනු ලබන ප්‍රතිකාර පිළිබඳ සාර්ථකභාවය සම්බන්ධයෙන් ප්‍රතිකාර හා පුනරුත්තාපන මධ්‍යස්ථාන අධ්‍යක්ෂක විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු කාලීන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 109 (1)(ආ) | වාහන අනතුරු සම්බන්ධයෙන් වූ පොතෙන් අස් කිරීමේ සෑම නියෝගයකම පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ නිලධාරීන් වෙත අවස්ථා 41 දී ලබාදී තිබූ එකතුව රු.476,325 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 14 සිට 261 ක් දක්වා වූ කාලයක් ගතකර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 751 | සියලු භාණ්ඩ ලැබීම් හා නිකුත්කිරීම් නිසි පරිදි භාණ්ඩ ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

AGDSL

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.14,110,836 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,906,625 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,795,789 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් වියදම් රු. 29,658,161 කින් වැඩි වී තිබුණද රජයේ දායකය හා අනෙකුත් ආදායම් රු. 31,453,952 කින් වැඩි වී තිබීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ දායකත්වය 2011 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2013 වර්ෂයේ සිට 2015 දක්වා පිළිවෙලින් රු.67,539,371, රු.76,486,442 හා රු.110,609,846 ක දායකත්වයක් විය. ඒ අනුව 2015 වර්ෂයේ දායකත්වය ඉහළ අගයක් පෙන්නුම් කළ නමුත් ඊට පෙර වර්ෂවලදී ඒ මට්ටමින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

### 3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම් 6 ක එකතුව රු.6,309,030 ක මුදල් ඵලදායී කාර්යයක යෙදවීමකින් තොරව වර්ෂ ගණනාවක සිට අක්‍රීයව පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පනතේ අරමුණු පහත දැක්වේ.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලනය කිරීම සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම සහ එවැනි ප්‍රතිපත්ති පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා සමාලෝචනය කිරීම එවැනි ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

6

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

* මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් පරිත්‍යාග හා ආධාර භාර ගැනීම.

* අන්තරායකර ඖෂධ නිවාරණ හා පාලයේ නිරතව සිටින නියෝජිතායතනවල කටයුතු සම්බන්ධකරණය.

* මත්ද්‍රව්‍ය වලට අබ්බැහිවූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු වැඩි දියුණු කිරීම සහ ළමුන් හා වැඩිහිටි පුද්ගලයන් සඳහා ජාතික මත්ද්‍රව්‍ය භාවිතය හා නිවාරණය පිළිබඳ අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම.

* අන්තරායකර ඖෂධ භාවිතය ව්‍යාප්තිය, ඒ සඳහා හේතු හා අන්තරායකර ඖෂධ භාවිතයෙන් ඇති වන නෛතික, වෛද්‍ය, සාමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටළු පිළිබඳ පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම හා ඒ සම්බන්ධ කටයුතු ඉටු කිරීමට භාරගැනීම, ඖෂධ පාලන කටයුතු වල නියැලී සිටින ජාතික කලාපීය හා අන්තර් ජාතික සංවිධාන හා නියෝජිතායතන සමඟ සම්බන්ධකරණය පවත්වා ගැනිම.

ඉහත අරමුණු ඉටුකර ගැනීමට අදාළ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රතිකාර සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථානයට ඇතුළත්වන සේවාලාභීන් ආයතනයෙන් බැහැර වූ විට ආයතනය මගින් සහ බාහිර සේවා නිලධාරීන් මගින් (Outreach Officer) ඔවුන් පිළිබඳව සිදු කරනු ලබන පසු විපරමේදී සේවාලාභීන්ගෙන් වැඩි ප්‍රමාණයක් නැවතත් මත්ද්‍රව්‍ය භාවිතයට නැඹුරුවීම, මධ්‍යස්ථානයටම නැවත පුනරුත්ථාපනය සඳහා පැමිණීම හෝ ඔවුන් පිළිබඳ තොරතුරු නොමැති තත්ත්වයක් පැවතුණි.

(ආ) 2015 සැප්තැම්බර් 12 දින ඇතුළත් වූ සේවා අංක 10060 දරන සේවාලාභියාගේ පසු රැකවරණ වාර්තාව නිරීක්ෂණයේදී නේවාසික වී මාස 2 සති 2 ක් දක්වා කාලයක් ගත වුවද, සේවාලාභියා සමඟ එක් වරක්වත් උපදේශන සඳහා යොමු වී නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

සෞඛ්‍යය අමාත්‍යාංශය සතු ගොඩනැගිල්ලක කුලී ගෙවීමකින් තොරව තලංගම ප්‍රතිකාර නිවාරණ මධ්‍යස්ථානය පවත්වා ගෙන යන අතර ගොඩනැගිල්ල සහ ඉඩම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

7

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජෙනරේටරයක්, කාර්යයාල උපකරණ, ගෘහ උපකරණ හා පරිගණක මිලදී ගැනීම වෙනුවෙන් ගෙවන ලද එකතුව රු. 5,074,427 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබියදී එය මූල්‍ය ප්‍රකාශනවල කොටස් ගෙවීමක් ලෙස දක්වා තිබුණි. මෙම භාණ්ඩ මණ්ඩලය වෙත නොලැබී ඇති බැවින් ක්ෂය කළ නොහැකි නිසා මෙම ගෙවීම් කොටසක් ගෙවීම් ලෙස සටහන් කර ඇති බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ආ) සේවා මධ්‍යස්ථානයේ නේවාසික ප්‍රතිකාර සඳහා 2015 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු 25 දක්වා සේවාලාභීන් 272 ක් ඇතුළත් වී තිබුණු අතර ඉන් සේවාලාභීන් 43 දෙනෙකු අනවසරයෙන් බැහැර වී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ගාස්තු නොගෙවා නේවාසික වූ සේවාලාභීන් 146 කින් 45 දෙනෙකු නැවත ප්‍රතිකාර සඳහා ඇතුළත්වූ සේවාලාභීන් විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 30 ක ප්‍රමාණයක් විය.

(ඈ) 2015 වර්ෂය තුළදී තලංගම මධ්‍යස්ථානයේ උපදේශකවරුන් හා සහකාර උපදේශකවරුන් 9 දෙනෙකු විසින් සේවාලාභීන් සමඟ උපදේශන සිදුකළ අවස්ථා ගණන අනුව එම නිලධාරීන් මාසයකට උපදේශන සේවා අවස්ථා ගණන ආසන්න වශයෙන් 8 ක් පමණක් වූ අතර එය ප්‍රමාණවත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නිශ්චිත පරමාර්ථයකින් තොරව 2014 වර්ෂයේ දී රු.2,971,405 කට මිලදී ගෙන තිබූ හෝමාගම පිහිටි පර්චස් 40 ක ඉඩම එලදායී කාර්යයක යොදා ගැනීම සම්බන්ධයෙන් විධිමත් සැලසුමක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2011 වර්ෂයේ සිට සහකාර මූල්‍ය අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

මණ්ඩලය සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර රජයේ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කටයුතු සිදුකර තිබුණි. එහෙත් අභ්‍යන්තර විගණන වැඩසටහන හෝ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන සැලැස්මේ ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 81 ක් එනම් රු.40,961,000 ක් අඩුවෙන් වැයකර තිබූ බැවින් ප්‍රසම්පාදන සැලැස්ම තාත්විකව පිළියෙල කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී විෂයයන් 29 කට අදාළව සියයට 96 සිට සියයට 783 ක් දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) අයවැය ඇස්තමේන්තු සකස් නොකරන ලද වියදම් විෂයයන් 12 ක් සඳහා එකතුව රු.12,844,147 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් පොත්පත් නිවැරදිව පිළියෙල නොකිරීම<br>ජ'නල් සටහන් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබීම |
| (ආ) පුනරුත්තාපන මධ්‍යස්ථාන උපයෝජනය | මධ්‍යස්ථානවලට පැමිණෙන සේවාලාභීන් සඳහා ප්‍රමාණවත් සේවාවක් නොසැපයීම. |
| (ඇ) වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන විධිමත්ව නඩත්තු නොකිරීම |
| (ඈ) තොග හා ඉන්වෙන්ට්‍රි පාලනය | ඉන්වෙන්ට්‍රි ලේඛන නිවැරදිව පවත්වා ගෙන නොයාම |
| (ඉ) මූල්‍ය කළමනාකරණය | අක්‍රීය බැංකු ගිණුම් වල ඉහළ වාසිදායක ශේෂ පවත්වා ගැනීම, භාණ්ඩ ලැබීමට පෙර මුදල් ගෙවීම. |
| (ඊ) මානව සම්පත් කළමනාකරණය | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

10

## 13. විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ

2017.01.20

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
පොල්දූව පාර
බත්තරමුල්ල.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

අ) මණ්ඩලයට අයත් ඉඩම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කොට ගිණුම්ගත කරන ලදී.

ආ) වත්කම් නැවත තක්සේරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

අ) පිරිවැයට හා කත්සේරු වටිනාකමට හඳුනා ගන්නා ලද වත්කම් පන්ති පිළිබඳ අනාවරණය කිරීමට ඉදිරියේදී පියවර ගනු ඇත.

ආ) 2016 වසරේ සිට ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව ක්ෂය කර ගිණුම්ගත කරනු ඇත.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

මෙම පෙන්වා ඇති උපචිත වියදම් 2016 වසරේදී නිවැරදි කර ඇත.

**2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

අ) මෙම ලදුපත් පිළිබඳව විමසා අදාල ආයතන වෙත ලිපි යැවූ අතර ඇතැම් ආයතන ඒ සඳහා දුරකථන ඔස්සේ පිළිතුරු ලබා දී ඇත. මෙම මුදල් කඩිනමින් නැවත අයකර ගැනීමට කටයුතු කරමින් සිටී.

ආ) රු.1,782,059/50 ක් ලෙස පෙන්වා ඇති අත්තිකාරම් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන්ද උපදෙස් ලබා ගැනීමට අවස්ථා කීපයකදීම උත්සාහ කරන ලදී. මෙහි දක්වා ඇති බොහෝ වියදම් අත්තිකාරම් නොව මූලික ගෙවීම් ලෙස සිදු කර ඇති ගෙවීම්ය. මෙම ගෙවීම් ඉතා පැරණි ගෙවීම් වන බැවින් විස්තරයක් ලබා ගැනීමද අපහසු කාර්යයකි. මෙම මුදල කපා හැරීම සඳහා මුදල් අමාත්‍යශයෙන්ද විමසීම් කරන ලදී. එම උපදෙස් අනුව හැකි ඉක්මණින් මෙය නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මෙම පෙන්වා ඇති සියලු අඩුපාඩු ඉදිරි වසරේදී නිවැරදි කරනු ඇත.

**2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්**

මෙහි රු.1,359.00 ක වෙනසක් ලෙස දක්වා ඇත්තේ ගිණුම් තැබීමේදී සිදු වී ඇති අතපසුවීමකි. මෙය 2013 වසරේ ලබාගත් කබඩ් 01 ක් සඳහා තබා ඇති ක්ෂය සටහනකි. මෙහිදී සිදුව ඇත්තේ 2013 වසරේ මෙම කබඩ් එක මිලදී ගැනීම සඳහා චෙක්පත් ලියා තිබුනද 2014 වසරේ එම කබඩය මිලදී නොගන්නා බව දන්වා එම චෙක්පත අවලංගු කරන මෙන් දන්වා ඇත. නමුත් ඒ වන විටත් එය සඳහා 2013 වසර සඳහා කිරීම් කර ඇත. චෙක්පත අවලංගු කළ නමුත් ක්ෂයවීම්, ක්ෂය ගිණුමෙන් ඉවත් කර නොමැත. 2016 වසරේ මෙම වරද නිවැරදි කරනු ඇත.

**2.3 නීති රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම**

**අ) පාලක මණ්ඩලය**

1986 අංක 41 දරණ අ.ඖ.පා.ජා.ම පනත යටතේ පිහිටුවා ඇති අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 6(2) වගන්තිය අනුව, මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණ පූරණය මණ්ඩලයේ සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. 2015 වර්ෂයේ පවත්වන ලද සියළුම මණ්ඩලීය රැස්වීම් සඳහා සාමාජික සහභාගිත්වය පහත පරිදි වේ.

| මාසය | සාමාජික ගණන |
|---|---|
| පෙබරවාරි | 10 |
| මාර්තු | 08 |
| අප්‍රේල් | 07 |
| මැයි | 07 |
| ජුනි | 06 |
| ජූලි | 05 |
| ජූලි (විශේෂ) | 09 |
| අගෝස්තු | 07 |
| සැප්තැම්බර් | 05 |
| ඔක්තොම්බර් | 07 |
| නොවැම්බර් | 09 |
| දෙසැම්බර් | 07 |

ආ) පුද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානය අධීක්ෂණය කිරීම සඳහා පත්කර සිටි අධ්‍යක්ෂවරයා අදාළ වාර්තා නිසි පරිදි ඉදිරිපත් කර නැත. මේ වන විට නව අධ්‍යක්ෂකවරයකු එකී තනතුරට පත්කොට ඇත. ඔහු විසින් කාලීන වාර්තා ඉදිරිපත් කොට ඇති අතර එම වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කොට ඇත.

ඇ)

i. වාහන අනතුරු සම්බන්ධයෙන් පාඩු ලබන දෑ පිළිබඳව වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

ii. මෙම සියළුම අත්තිකාරම් මුදල් මේ වන විට පියවා ඇති අතර මින් ඉදිරියට මෙසේ ප්‍රමාදවීම් සිදු නොවීමට කටයුතු කර ඇත.

iii. සියලු භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් යාවත්කාලීනව සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

මත්ද්‍රව්‍ය භාවිතය ලංකාවේ දැඩි අවධානයට ලක් වූ විෂයක් වන අතර මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් දීප ව්‍යාප්තව වැඩසටහන් දියත් කර ඇත. ඒ අනුව රට පුරා විවිධ ක්‍රියාකාරකම් අවස්ථානුකූලව සිදු කිරීමට සිදු වී ඇත. එබැවින් මෙවැනි අවස්ථාවලට මුහුණ දීමට සිදු වී ඇත. කෙසේ නමුත් 2017 අය වැය සකස් කිරීමේදී මේ පිළබඳව අවධානය යොමු කරනු ඇත.

### 3.2 කාරක ප්‍රාග්ධන කළමණාකරණය

මෙම ජංගම ගිණුම් වනුයේ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති ගිණුම් වේ. මෙම මුදල් මඟින් මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් විටින් විට සිදු කරනු ලබයි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

අ) මත්ද්‍රව්‍ය භාවිතය සාමාන්‍ය හැසිරීමක් නොව මොළය ආශ්‍රිත නැවත නැවතත් භාවිතයට යොමු විය හැකි රෝගී තත්වයකි. එබැවින් ප්‍රතිකාර වල ප්‍රතිශතය 15% පමණ වීමද ඉතා සාර්ථක තත්ත්වයකි.

ලෝකයේ සියළුම රටවල ප්‍රතිකාර ලබන්නන් නැවත භාවිතයට යොමු වීම 90% ක පමණ වේ.

එබැවින් මෙම ලබා ගෙන ඇති සාර්ථකත්වය ගැන සතුටු විය හැකිය.

මෙය මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය කිරීමේදී මතු වන ස්වාභාවික තත්ත්වයකි . එබැවින්, බාහිර සේවා නිළධාරීන් නිරන්තරයෙන්ම මෙම පිරිස් පිළිබඳ පසු විපරම් හා ප්‍රජා මූලික මැදිහත්වීම් නිරන්තරයෙන් සිදු කරනු ලබයි.

ආ) සමහර සේවාලාභීන් මත්ද්‍රව්‍ය භාවිතය නිසා දැඩි ලෙස මානසික රෝග වලට ගොදුරු වන අවස්ථා ඇත. එවැනි මානසික රෝගීන් සේවාලාභියෙකුට උපදේශන ක්‍රියාවලිය සිදු නොකරනු ලබයි. ඔවුන් සඳහා සිදු කරනු ලබන්නේ මානසික රෝගීන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමයි.

### 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශය සතු ඉඩමක වන අතර එම ඉඩම පවරා ගැනීමට මණ්ඩලයට හැකියාවක් නොමැත.

### 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

අ) මෙම ආයතන සඳහා 2015/12/31 දින වන විට ගෙවීම් සිදු කර තිබුනද ඒ වන විට භාණ්ඩ මණ්ඩලය වෙත නොලැබී ඇති බැවින් එම භාණ්ඩ ක්ෂය කළ නොහැකි බැවින් මෙම ගෙවීම් කොටසක් ගෙවීම් ලෙස සටහන් කර ඇත.

ආ) එයද මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ ස්වභාවයකි. නමුත්, එය වළක්වා ගැනීමට උපරිමයෙන් කටයුතු කරන අතර කිසිදු සේවාලාභියෙකු බලෙන් රඳවා ගැනීමට කටයුතු නොකරයි. එසේ වුවහොත් සියදිවි නසා ගැනීම වැනි තත්ත්වයන් ඇති විය හැකිය.

ඇ) මෙය රෝගී තත්වයක් බැවින්, නැවත භාවිතයට යොමු වූ අය සඳහා සේවා සැපයීම අත්‍යාවශයෙන්ම සිදුකළ යුතු දෙයකි. එබැවින් නැවත භාවිතයට යොමු කිරීමට බාහිර සේවා නිළධාරීන් කටයුතු කරනු ලැබේ.

ඇ) දැනට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිකාර ක්‍රමය වනුයේ මනෝ විද්‍යාත්මක ප්‍රවේශයයි. ඒ අනුව සියළුම සේවාලාභීන් සඳහා ප්‍රතිකාර සැලැස්මක් සකස් කර ඇත. ප්‍රතිකාර සැලැස්ම අනුව, උපදේශන කටයුතු කරනු ලැබේ.

### 4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

මෙම හෝමාගම ඉඩමෙහි මේ වනතුරුද ඔප්පුව ලබා දී නොමැත. මණ්ඩලයේ අරමුදල් යොදා ගනිමින් එහි මිනුම් කටයුතු මේ වන විට අවසන් කර ඇත. ඔප්පුව ලබා ගැනීමෙන් අනතුරුව ඵලදායි කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් සකස් කරනු ඇත.

### 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

මෙම පුරප්පාඩු සපුරා ගැනීම සඳහා කිහිපවරක්ම අයදුම්පත් කැඳවුවද සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වී නොතිබුණි. නැවතත් 2016.03.20 දිනද අයදුම්පත් කැඳවන ලදී.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණක සඳහා සුදුසුකම් සපුරාගත් අයදුම්කරුවන් ඉදිරිපත් වී නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

2015 වසරේ ක්‍රියාකාරි සැලැස්ම අනුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වීමට නියමිතව තිබුණු අතර අවිනිශ්චිත යෙදවීම් රාශියක් කිරීමට සිදු විය. ඒ අනුව මෙම විෂමතාවය මතු වී ඇත. 2016 වසරේ හැකිතාක් දුරට එවැනි වෙනස්වීම් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අ) ඉදිරි වසරේ අයවැය නිසි පරිදි කළමණාකරණය කිරීමට කටයුතු කරනු ඇත.

ආ) මණ්ඩලයේ කටයුතු වලදී අවිනිශ්චිත වියදම් කිරීමට සිදුවේ. ඉදිරියේදී එම වියදම් අවම කිරීමට කටයුතු කරනු ඇත.

**6. පද්ධති හා පාලනයන්**

මෙම ක්ෂේත්‍රයන් පිළිබඳව නිරන්තරයෙන් අවධානය යොමු කරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය කරන මූල්‍ය හා වෙනත් යෙදවුම් වර්ධනය කර ගැනීමටද අවශ්‍ය බව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතද දැනුම් දී ඇත.

මෙයට විශ්වාසී,

මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු
සභාපති

පිටපත - ලේකම්, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

ඇමුණුම I

# මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය - 2015

| | |
|---|---|
| සභාපති | |
| සී. නිලංග සමරසිංහ මහතා | වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය |
| අධ්‍යක්ෂ ජනරාල් (විධායක අධ්‍යක්ෂ) | |
| කේ. ගමගේ මහතා | ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,<br>ලේඛකත්ව හා ජන සන්නිවේදන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br>ශාස්ත්‍රවේදී උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය, |
| මණ්ඩලයේ ලේකම් හා නීති නිළධාරී | |
| ඩී.ජී.ටී.එන්. නන්දසිරි මහත්මිය | නීතිඥ |
| සහකාර අධ්‍යක්ෂ- ප්‍රතිකාර හා පුනරුත්ථාපන | |
| ටී.ඩබ්. ජේමසිරි මහතා | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය<br>වාණිජවේදී විශේෂ උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය<br>සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව - ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| සහකාර අධ්‍යක්ෂ- පර්යේෂණ | |
| එස්.එම්.බී. නන්දා කුමාරිහාමි මහත්මිය | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය- කැලණිය විශ්ව විද්‍යාලය<br>ශාස්ත්‍රවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| සහකාර අධ්‍යක්ෂ - බාහිරසේවා | ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| ඩී.කේ.එස්. ගනේගොඩ මහතා | (2015.05.25 දින දක්වා සේවය කරන ලදී.) |
| සහකාර අධ්‍යක්ෂ - නිවාරක, අධ්‍යාපන හා පුහුණු | |
| ප්‍රදීප් කුමාර කොහොලානේගෙදර මහතා | ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය,දෙවන පංතිය- කොළඹ විශ්ව විද්‍යාලය<br>ජාත්‍යන්තර කටයුතු අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - උප්සාලා විශ්ව විද්‍යාලය, ස්වීඩනය<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව මනෝවිද්‍යා උපදේශනය - කොළඹ විශ්ව විද්‍යාලය |
| සහකාර අධ්‍යක්ෂ- පරිපාලන | |
| ඒ.ඩබ්.ඒ. කුමාරි මහත්මිය | ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br>විද්‍යාවේදී මානව සම්පත් කළමණාකරණ (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br>මත්ද්‍රව්‍ය දුර්භාවිතා කළමණාකරන ඩිප්ලෝමාව - කොළඹ විශ්ව විද්‍යාලය |

<u>සහකාර අධ්‍යක්ෂ- විද්‍යාත්මක පර්යේෂණ</u>

| | |
|---|---|
| ඩී.පී.පී. වීරසිංහ මහත්මිය | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය - දිල්ලි විශ්ව විද්‍යාලය, ඉන්දියාව<br>විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය |

<u>සහකාර අධ්‍යක්ෂ- නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන</u>

| | |
|---|---|
| ජී.ආර්. ගුණවර්ධන මහතා | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය- කැළණිය විශ්ව විද්‍යාලය<br>සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය- කැළණිය විශ්ව විද්‍යාලය |

<u>සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය</u>

| | |
|---|---|
| එන්. රාජපක්ෂ මහත්මිය | 2014.10.01 දින සිට වැඩබලන තනතුරේ සේවයේ නිරත වෙයි. |

<u>පරිපාලන නිළධාරී</u>

| | |
|---|---|
| ආර්.එම්. සමන්ත රත්නායක මහතා | කළමනාකරණවේදී (මානව සම්පත්) උපාධිය- කැළණිය විශ්ව විද්‍යාල |

<u>පුස්තකාලයාධිපති</u>

| | |
|---|---|
| කේ.ඒ.ආර්. ඉනෝකා කුරුප්පු මෙනවිය | පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය- කැළණිය විශ්ව විද්‍යාලය<br>ශාස්ත්‍රවේදී උපාධිය- කැළණිය විශ්ව විද්‍යාලය<br>පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව- කැළණිය විශ්ව විද්‍යාලය |

<u>කළමනාකරු</u>

| | |
|---|---|
| එස්.එන්. දිනසේකර මහතා | වාණිජවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය |
| එම්.ඩී. වික්‍රමගේ මහතා | විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ උපාධිය- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| සී. ජයසිංහ මහතා | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව |
| පී.එන්.ටී. පීරිස් මහතා | විද්‍යාවේදී රාජ්‍ය කළමණාකරණ (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

<u>උපදේශකවරුන්</u>

| | |
|---|---|
| එම්.ඒ.ඩබ්. මාරසිංහ මහතා | මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව - මනෝවිද්‍යා අධ්‍යයන ආයතනය<br>උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව - මනෝ විද්‍යා අධ්‍යයන ආයතනය |
| වී.එච්. පතිරණ මහත්මිය | සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව - ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| බී.ජී.එස්. දිසානායක මහතා | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - මානව සම්පත් කළමනාකරණ ආයතනය - කොළඹ විශ්ව විද්‍යාලය |

| | |
|---|---|
| ආර්.පී.කේ.යූ.පී. රණසිංහ මහත්මිය | සමාජ විද්‍යාව ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය<br>සමාජ විද්‍යාව ශාස්ත්‍රවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලය<br>මත්ද්‍රව්‍ය දූර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්ව විද්‍යාලය |
| එම්.සී. ජයතිලක මහත්මිය | මත්ද්‍රව්‍ය දූර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්ව විද්‍යාලය |
| එස්.එම්.අයි. ලක්මාල් සමරකෝන් මහතා | මනෝවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. - පේරාදෙණිය විශ්ව විද්‍යාලය |

<u>පර්යේෂණ නිළධාරින්</u>

| | |
|---|---|
| කේ.ඒ.ඩී.එච්. ලක්මිණි මහත්මිය | ජපන් භාෂාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය- සබරගමු විශ්ව විද්‍යාලය |
| ඩී.ජී.කේ. මධුශංක චන්ද්‍රදාස මහතා | ශාස්ත්‍රවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය<br>(2015.01.13 දින දක්වා සේවය කරන ලදී.) |
| බී.වී.එච්. වත්සලා චතුරංගි මෙනවිය | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය, - කැළණිය විශ්ව විද්‍යාලය |
| ඒ.ටී. දර්ශන මහතා | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය, - කොළඹ විශ්ව විද්‍යාලය |

<u>මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිළධාරීන්</u>

| | |
|---|---|
| කේ.ඩී.එම්. කුමුදිනී ජයතිලක මහත්මිය | මත්ද්‍රව්‍ය දූර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්ව විද්‍යාලය<br>(2015.06.15 දින සිට සහකාර අධ්‍යක්‍ෂ - බාහිරසේවා (වැඩබලන) තනතුරෙහි සේවය කරනු ලබයි.) |
| ආර්.එම්.එස්.පී.එම්. රත්නායක මහත්මිය | ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය, - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| අයි.එම්.සී. ප්‍රදීප් කරුණාරත්න මහතා | ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය, - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |

<u>විද්‍යාත්මක නිළධාරී</u>

| | |
|---|---|
| ඩබ්.ඩී.ඒ. අමරසිංහ මහතා | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| කේ.එම්. මුතුමාල මිය | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය<br>(2015.05.15 දින සිට සේවය කරනු ලබයි.) |

| | |
|---|---|
| ඒ.ඩී.වයි.කේ. අතාවුද මිය | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය<br>(2015.06.15 දින සිට සේවය කරනු ලබයි.) |
| කේ.කේ.ඩී.ටී.ඩී. ගොඩකුඹුර මහතා | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය - රුහුණ විශ්වවිද්‍යාලය<br>(2015.07.06 දින සිට සේවය කරනු ලබයි.) |

<u>ප්‍රතිකාර හා විමර්ශන නිළධාරීන්</u>

| | |
|---|---|
| ඩී කුලතුංග මහතා | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්ව විද්‍යාලය |
| එච්.එම්.පී.බී. හේරත් මහතා | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව - මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්ව විද්‍යාලය |
| ඒ.ඩබ්. රණසිංහ මහතා | මඟපෙන්වීම හා උපදේශනය පිළිබඳ උසස් සහතිකය |

<u>අනෙකුත් නිළධාරීන්</u>

සහකාර උපදේශකවරුන්, සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිළධාරීන්, සහකාර විද්‍යාත්මක නිළධාරී, සහකාර බාහිරසේවා නිළධාරීන්, පද්ධති විශ්ලේෂක හා වැඩසටහන් සම්පාදක, සහකාර පර්යේෂණ නිළධාරීන්, උපදේශන සහකාරවරුන්, මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාරවරුන්, තොරතුරු තාක්ෂණ සහකාරවරුන්, කළමනාකරණ සහකරුවන්, පොත් තබන්නා, රියදුරන්, පුස්තකාල සහකාර,කාර්යාල කාර්ය සහයකවරුන්)

ඇමුණුම ii

## නීතිය බලාත්මක කිරීමේ කමිටු සාමාජිකයින් - 2015

01. සරත් ජයමාන්න මහතා
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්
නීතිපති දෙපාර්මේන්තුව
කොළඹ 12

02. නීතිඥ කමල් ද සිල්වා මහතා
අධ්‍යක්ෂ
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය
3 වන මහල, නව ලේකම් ගොඩනැගිල්ල
කොළඹ 03

03. ඩී. සී. බී. වල්ගම්පාය මහතා
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා නාවුක ආයතනය
56, වෝර්ඩ් ස්ථානය
කොළඹ 07

04. පී. එස්. කේ. රාජපක්ෂ මහත්මිය
ජ්‍යෙෂ්ඨ රජයේ රස පරීක්ෂක
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො.31, ඉසුරු මාවත
පැලවත්ත
බත්තරමුල්ල

05. ඩී. ඒ. ආර්. පතිරණ මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති)
මධ්‍යම පරිසර අධිකාරිය
නො 104,"පරිසර පියස"
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල

06. අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා වෙරළාරක්ෂණ අධිකාරිය
ප්‍රධාන කාර්යාලය
උඩුපිල
මිරිස්ස
මාතර

07. ඩබ්. දිසානායක මහතා
සුරාබදු කොමසාරිස්
සුරාබදු දෙපාර්තමේන්තුව
නො 34, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත
කොළඹ 02

08. කපිතාන් ටී. එම්. ඒ. ඒ. තෙන්නකෝන්
හමුදා පොලිසි ප්‍රධානියා
ශ්‍රී ලංකා නාවුක හමුදාව
නාවුක හමුදා මූලස්ථානය
කොළඹ 01

09. ජී. එච්. ජී. ඒ. ලංකාදේව මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා රේගුව
නො.40
කොළඹ 01

10. මිහිර ලියනාරච්චි මහතා
අධ්‍යක්ෂ (මානව සම්පත්)
දේශීය සංචාරණය හා සේවා කළමණාකරනය
ශ්‍රී ලංකා සංචාරණ සංවර්ධන අධිකාරිය
නො 80, ගාලු පාර
කොළඹ 03

11. කැලුම් ගුණතුංග මහතා
සහකාර පොලිස් අධිකාරී (ක්‍රියාත්මක කිරීම්)
විශේෂ කාර්ය බලකාය
නො. 223, බෞද්ධාලෝක මාවත
කොළඹ 07

12. වෛද්‍ය ශ්‍රියානි දිසානායක මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ
වෛද්‍ය තාක්ෂණික හා සැපයීම් අංශය
නො 120, නොරිස් කැනල් පාර
කොළඹ 10

13. එච්. එම්. එන්. සී. ධනසිංහ මහතා
බන්ධනාගාර කොමසාරිස්
බන්ධනාගාර මූලස්ථානය
බේස්ලයින් පාර
කොළඹ 09

ඇමුණුම iii

## නීති සම්පාදක අනු කමිටු සාමාජිකයින් - 2015

01. සරත් ජයමාන්න මහතා
නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්
නීතිපති දෙපාර්මේන්තුව
කොළඹ 12

02. වෛද්‍ය ශ්‍රියානි දිසානායක මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ
වෛද්‍ය තාක්ෂණික හා සැපයීම් අංශය
නො.120, නොරිස් කැනල් පාර
කොළඹ 01

03. කේ. ආර්. වයි. හපුආරච්චි මහත්මිය
නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව
කොළඹ 12

04. සකුන්තලා තෙන්නකෝන් මහත්මිය
රජයේ රස පරීක්ෂක
රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො.31, ඉසුරු මාවත
පැලවත්ත
බත්තරමුල්ල

05. කේ. සියඹලාපිටිය මහතා
සහකාර පොලිස් අධිකාරී
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය
3 වන මහල, නව ලේකම් ගොඩනැගිල්ල
කොළඹ 3

06. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය
අධිකරණ අමාත්‍යාංශය
කොළඹ 1

07. වෛද්‍ය දේවිකා මෙන්ඩිස් මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ
වෛද්‍ය සැපයීම් අංශය
නො. 357, බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

08. පී. සී. සිල්වා මහතා
සහකාර සුරාබදු කොමසාරිස්
සුරාබදු දෙපාර්තමේන්තුව
කනුපෙලෙල්ල
බදුල්ල

09. එන්. ඒ. ඒ. එස්. නෙත්තසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
වෛද්‍ය සැපයීම් අංශය
නො.357, බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

10. වෛද්‍ය සිසිර ගාමිණී මහතා
ආයුර්වේද දෙපාර්තමේන්තුව
පරණ කොට්ටාව පාර
නාවින්න
මහරගම

11. යූ. පී. කේ. විතානගේ මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (බස්නාහිර)
ශ්‍රී ලංකා වෙරළාරක්ෂණ අධිකාරිය
උඩුපිල
මිරිස්ස
මාතර

12. රියාස් අහමඩ් මහතා
ප්‍රධාන නීති නිලධාරී
සෞඛ්‍ය අමාත්‍යංශය
සුවසිරිපාය
නො.385, බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

13. එම්. එස්. පී. පියදාස මහතා
රේගු අධිකාරී
ශ්‍රී ලංකා රේගුව
නො.40, කෙළින් වීදිය
කොළඹ 11

14. අනුර වික්‍රමනායක මහතා
නියෝජ්‍ය රේගු අධිකාරී
ශ්‍රී ලංකා රේගුව
නො.40, කෙළින් වීදිය
කොළඹ 11

## ගිණුම්කරණ සටහන්

ඇමුණුම iv

### අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
### 2015/12/31 අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් ප්‍රවාහය** | | |
| වියදම් ඉක්මවන ආදායම් අතිරික්තය හෝ හිඟය | | (14,110,836) |
| **ක්ෂය වීම්** | 14,508,323 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 1,064,108 | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | - | |
| පෙර වසරේ ගැලපුම් | 1,000 | 15,573,431 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | | 1,462,595 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තොග | (1,100,987) | |
| ණයගැතියෝ(විකුණුම් හා අනෙකුත් ලැබීම්) | (746,166) | |
| පුරෝගාමී පාලන අධිකාරිය | - | |
| පෙර ගෙවීම් | (479,485) | |
| මූලික ගෙවීම් | (708,001) | |
| අත්තිකාරම් | (33,660) | |
| තැම්පතු | - | |
| ණයහිමියෝ(ගැණුම් හා අනෙකුත් ගෙවීම්) | (3,500) | |
| උපචිත වියදම් | (105,799) | |
| රඳවාගත් මුදල් | - | |
| | | (3,177,598) |
| පාරිතෝෂික ගෙවීම් | | (612,178) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (2,327,181) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් | (16,969,006) | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල | - | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (16,969,006) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් ප්‍රවාහය** | | |
| වර්ෂය තුළ ලද ශුද්ධ අරමුදල | 17,233,000 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 17,233,000 |
| මුදල් හා මුදල් වලට සමාන දේවල ශුද්ධ වෙනස්වීම් | | (2,063,187) |
| ආරම්භක මුදල් ශේෂය සටහන් A | | 8,408,554 |
| අවසන් මුදල් ශේෂය සටහන් B | | 6,345,367 |

**<u>සටහන් A</u>**

ආරම්භක මුදල් ශේෂය

| | |
|---|---|
| මුද්දර අග්‍රීමය | 21,804 |
| ගිණුම් අංක 1643 ආයතනික ශාඛා ගිණුම | 2,401,695 |
| ගිණුම් අංක 0003270702 රාජගිරිය ගිණුම | 103,377 |
| UNDCP 1995 ව්‍යාපෘති ගිණුම | 3,210,889 |
| WHO Regular Budget ව්‍යාපෘති ගිණුම | 1,462,142 |
| NDDCB RAS H71 ව්‍යාපෘති ගිණුම | 913,850 |
| UNICEF ව්‍යාපෘති ගිණුම | 282,302 |
| NDDCB ප්‍රතිකාර හා පුනරුත්ථාපන ගිණුම | 12,495 |
| | 8,408,554 |

**<u>සටහන් B</u>**

අවසන් මුදල් ශේෂය

| | |
|---|---|
| මුද්දර අග්‍රීමය | 9,700 |
| ගිණුම් අංක 1643 ආයතනික ශාඛා ගිණුම | 736,436 |
| ගිණුම් අංක 0003270702 රාජගිරිය ගිණුම | 26,637 |
| UNDCP 1995 ව්‍යාපෘති ගිණුම | 3,016,256 |
| WHO Regular Budget ව්‍යාපෘති ගිණුම | 1,397,542 |
| NDDCB RAS H71 ව්‍යාපෘති ගිණුම | 1,019,750 |
| UNICEF ව්‍යාපෘති ගිණුම | 91,551 |
| NDDCB ප්‍රතිකාර හා පුනරුත්ථාපන ගිණුම | 47,495 |
| | 6,345,367 |

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වාර්ෂික වාර්තාව 2015

සටහන් 10

ස්ථාවර වත්කම් ක්ෂයවීම්

| පිරිවැය/ අගය කිරීම | ඉඩම් රු. | ඉඩම් හා ගොඩනැගිලි රු. | කාර්යාල උපකරණ රු. | ගෘහ භාණ්ඩ රු. | සවි කිරීම රු. | රථ වාහන රු. | මුළු එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| 2015/01/01 දිනට ශේෂය | 2,971,405 | 88,487,711 | 79,085,373 | 12,956,995 | 6,382,649 | 36,430,462 | 226,314,595 |
| එකතු කිරීම | | 246,115 | 1,070,276 | 635,693 | 5,478,325 | 7,652,000 | 15,082,408 |
| ඉවත් කිරීම | | - | - | - | - | - | - |
| 2015/12/31 දිනට ශේෂය | 2,971,405 | 88,733,826 | 80,155,649 | 13,592,688 | 11,860,974 | 44,082,462 | 241,397,003 |
| | | | | | | | |
| ක්ෂය කිරීම | | | | | | | |
| 2015/01/01 දිනට ශේෂය | | 70,082,813 | 63,849,486 | 6,869,378 | 4,996,098 | 7,748,793 | 153,546,569 |
| 2015 වර්ෂය සඳහා ක්ෂයවීම | | 936,035 | 6,169,788 | 838,748 | 713,598 | 3,799,111 | 12,457,280 |
| ඉවත් කිරීම | | | | | | | |
| 2015/12/31 දිනට සමුච්චිත ක්ෂය කිරීම | | 71,018,848 | 70,019,274 | 7,708,126 | 5,709,696 | 11,547,904 | 166,003,849 |
| 2015/12/31 දිනට ලියා හළ අගය | 2,971,405 | 17,714,978 | 10,136,375 | 5,884,562 | 6,151,278 | 32,534,558 | 75,393,154 |

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වාර්ෂික වාර්තාව 2015

| පිරිවැය/ අගය කිරිම | පුස්තකාල පොත් රු. | මුළුතැන්ගෙයි උපකරණ රු. | ගෙම්දුල් උපකරණ රු. | පර්යේෂණාගාර උපකරණ රු. | අනෙකුත් පිරියත හා උපකරණ රු. | මුළු එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2015/01/01 දිනට ශේෂය | 825,560 | 408,991 | 85,565 | 4,414,116 | 5,040.972 | 10,775,204 |
| එකතු කිරිම | (10,309) | - | - | 1,896,907 | - | 1,886,598 |
| ඉවත් කිරිම | - | - | - | - | - | - |
| 2015/12/31 දිනට ශේෂය | 815,251 | 408,991 | 85,565 | 6,311,023 | 5,040,972 | 12,661,801 |
| | | | | | | |
| ක්ෂය කිරිම | | | | | | |
| 2015/01/01 දිනට ශේෂය | 729,337 | 129,314 | 15,844 | 648,979 | 853,256 | 2,376,731 |
| 2015 වර්ෂය සඳහා ක්ෂයවීම් | 23,201 | 81,798 | 14,113 | 923,736 | 1,008,194 | 2,051,043 |
| ඉවත් කිරිම | - | - | - | - | - | - |
| 2015/12/31 දිනට සමුච්චිත ක්ෂය කිරීම් | 752,538 | 211,112 | 29,957 | 1,572,716 | 1,861,451 | 4,427,774 |
| 2015/12/31 දිනට ලියා හළ අගය | 62,713 | 197,879 | 55,608 | 4,738,307 | 3,179,521 | 8,234,027 |

2015 වසර සඳහා මුළු වත්කම 83,627,182

ක්ෂය වීම් 14,508,323